

# සෝභනසිත

හා

# සෝභනසිත විනිස

# හෙරණසිඛ හා හෙරණසිඛ විනිසය



කැලිගම විජිතානන්ද හිමි

# හෙරණ සික
# හා
# හෙරණ සික විනිස

සංස්කාරක

පණ්ඩිත ශාස්ත්‍රපති
**කැලිගම විජිතනන්ද හිමි**
( B.A., M.A., Dip. in Ed. & Dip. in Bud.)

**පිදුම**

සියවස් ගණනකට පෙර, සාසන
මාමකව මෙ ගත ලියූ
කතුතුමනි, මේ සැකසුම
ඔබ නමට අදරින් පිදේ

# පටුන


| | |
|---|---|
| හැඳින්වීම ... ... ... ... | i |
| ප්‍රස්තාවනා ... ... ... ... | ix |
| හෙරණසික ... ... ... ... | 1 |
| හෙරණසික විනිස ගැටපදය ... ... ... | 41 |
| උපග්‍රන්ථය I ... ... ... ... | 56 |

## හෙරණ සිඛ හා හෙරණ සිඛ විනිස

# හැඳින්වීම

ශ්‍රී ලංකා ද්වීපයෙහි බුද්ධශාසනය ප්‍රතිෂ්ඨාපනය කර වදාළ මිහිඳු මහ රහතන් වහන්සේ, බුදුන් දවස විනය පිළිබඳ අගතැන්පත් උපාලි මහ රහතන් වහන්සේ ගේ ශිෂ්‍යානු ශිෂ්‍ය පරම්පරාවට අයත් බව දැක්වේ. ඒ නිසා දෙ ලක්දිවැ ථෙරවාදී භික්ෂූහු අතීතයේ දී විනය ගැන සුවිශේෂ සැලකිල්ලක් දැක්වූහ. මෑත කාලයෙහි දු ශාසන මාමක ගුණ ගරුක භික්ෂූහු එසේම වූහ. එබැවින් ස්වකීය අනන්තර ගාමිකයන් විනයෙහි දැනුමැත්තන් කිරීමටත්, විනයානුගත වත් පිළිවෙත් ඇත්තන් කිරීමටත් පියවර ගත්හ. පාලි භාෂාවෙන් පෙළ අටුවා කියවා තේරුම් ගැනීමට තරම් උගත්කමක් නැති ශාසනාවචරයන්ට ද අවශ්‍ය මූලික දැනුමක් ලැබගත හැකිවනසේ සෙහළුබසින් විනය පොත් ලිවීමට පෙළඹුනේ ද මේ නිසා විය හැකිය. හෙරණසිඛ හා හෙරණසිඛ විනිස, සිඛ වළඳ හා සිඛවළඳ විනිස ආදිය එසේ ලියන ලද පොත් සමහරකි. මේ අතරට කතිකාවත් මගින් ද ඇතැම් විනය කරුණු හා පිරිය යුතු වත් පිළිවෙත් එළි දක්වන ලදී.

''........... උපසපුව ලද පැවිජ්ජා පටන් හික්මියැ යුතු සරිත් වරිත් සිඛ සැකෙවින් කියනෙම්'' යන සිඛ වළඳ ආරම්භක පාඨයෙන් එය උප සම්පදව ලත් නවක භික්ෂූන් පටන් හෙවත් ආරම්භයෙහි හික්මිය යුතු චාරිත්‍ර වාරිත්‍ර ශික්ෂා දැක්වීමට ලියන ලද බව පැවසේ . සිඛ වළඳ විනිසෙහි ඒ සම්බන්ධව තවදුරටත් දතයුතු විස්තර පෙළ අටුවා ඇසුරෙන් දැක්වේ.

හෙරණසිඛ ප්‍රවේශයෙන් හෙවත් මාතිකාවෙන් හෙරණ පැවිද්දට පිවිසෙන්නකු විසින් ආරම්භයේ දීම දත යුතු ......... දසසිල් දස සිඛ දස පරිජී දසනාසනා දසදඬුවම් වත්'' දැක්වේ.

''හෙරණ සිඛයෙහි ආදියැ හෙරණ යයි දක්වන ලද හෙරණ පැවිද්ද පළමු හැඳිනැ ඔහු විසින් රැක්ක යුතු දස සිල් ආදිය දත යුතු බැවින්.........'' යි එන පාඨයෙන්, හෙරණ සිඛ මුළු වශයෙන් හෙරණුන් හෙවත් සාමණේරයන් සඳහා ලියන ලද බව පැහැදිලි වේ. එසේ වුවත් හෙරණසිඛයෙහි හා හෙරණ සිඛ විනිසෙහි ඇතුළත් කරුණු හෙරණ පැවිද්ද විසින් ම පමණක් නොව, ආචාර්ය උපාධ්‍යායන් විසින් ද දත මනාය. පැවිද්දට භව්‍ය පුද්ගලයන්

තෝරා ගැනීම සම්බන්ධ කරුණු සම්පූර්ණයෙන් ම ආචාර්ය උපාධ්‍යායන් විසින් ම දත යුතු වේ. මෙහෙයින්, මෙම ග්‍රන්ථයේ අඩංගු ව පවතින්නේ, හැම බෞද්ධ භික්ෂූන් වහන්සේ නමක් විසින් ම දත යුතු මූලික කරුණු ස්වල්පයක් බව කිව හැකිය. හෙරණ සිඛයෙහි ආ කරුණු පෙළ අමූට ඇසුරෙන්, හෙරණ සිඛ විනිසෙහි තවදුරටත් විස්තර කෙරේ.

භාෂා ලක්ෂණ අතින් ද සමහර කරුණු විස්තර කර ඇති ආකාරය අතින් ද සිඛවළඳ විනිසත්, හෙරණ සිඛ විනිසත්, අතර සමානත්වය කැපී පෙනේ.

"ගිරිති කවානම්," "පරහලා," "පැවිජි," "දියවටන්," "වස්දෙණි," "ලිහිණි," "කොරොස්," "මෙවුන්ධම්" යනාදි පද, කෘති දෙකේ ම සමාන ලෙස යෙදී තිබේ.

ඇතැම් කරුණු විස්තර කිරීමේ දී කෘති දෙකේ සමානත්වය වටහා ගැනීමට පහත දැක්වෙන උදාහරණ දෙක ප්‍රයෝජනවත් වනු ඇත. මේ ආහාර කිස සම්බන්ධයෙන් කෘති දෙකේ කෙරෙන විස්තරයයි.

"පිඩු මහත් කොට වළඳත් දුකුළාවේ— කිකිළි බිජුවට කුඩා නොකොට මොනර බිජුවට මහත් නොකොට වැටියැ යුතුය. මොණර බිජුවට මහත් වුව වරජි. කිකිළි බිජුවට කුඩා වූව වරජනැති"

(සිඛව.වි. 80 පිං)

"......... එළ වූ සූපව්‍යඤ්ජන ගෙනැ බොහෝ කැමතිවැ අළුවා අහවින් මුවැ නොකොටැ අහර අනා කැටිකොටැ මුදුනෙන් නොගෙනැ තමා දිශා-වෙන් පන්තියෙන් ගෙනැ මොනර බිජුසේ මහත් නොකොටැ කිකිළි බිජුසේ කුඩා නොකොටැ පරිමණ්ඩලකොටැ........."

(හෙ.වි. 31 පි.)

සෙනසුන් සෝධන වත්හි කෘති දෙකේ දැක්වෙන විස්තර

"........ලග්නා ගෙය හමදනා සඳ සතරකන් සමකොට බිත සිවුකොන හා බිත් පිසැ සතුන් නොමියන සේ මකුළු සවුහැර හමදනෙ"

(සිඛ වළඳ වි.83 පි.)

"සෙනස්න හමදනාකලැ මකුළු හූ ආදි හැර පළමු උඩ හැම දැ බිතත් හැමදැ බිම හමදනා කලැ ධූලි නැගෙත බිම වී නම් දිය ඉසැ නො එසේ වුව දිය නො ඉසැ හමදනා කලැ හී පතින් උගහටතැනැ ගහළ හැර හැමදැ හම දනා මුස්නෙහි දඬුව ඉදිකොටැ සිටුවා අකුණතින් පාතගෙනැ වමතින් මත්ත ගෙනැ. මුස්නෙහි ඇළයෙහි නොහැමදැ මුසුන් කොළ නො ඇක්මැ මුසුන් දඬුව තමා දිශාවට නැමෙන නියායෙන් ධූලි උඩට නො නැගෙනසේ ගෙකුස හැමදැ..........."

(හෙරණ සිඛවිනිස 35පි)

සිඛ වළඳ විනිසෙහි දක්වෙන කරුණක් ම හෙරණුන්ට ද අදාල වන තන්හිදී ඊට වඩා සවිස්තරව හෙරණ සිඛ විනිසෙහි දක්වෙන අයුරු ඉහත උපුටා දක් වූ උදාහරණවලින් පැහැදිලිවේ. සිඛ වළඳ විනිස ලියන ලද්දේ අවම වශයෙන් වයසින් විසිවසක්වත් ඉක්ම වූ භික්ෂූන්ටය. එනම් උපසම්පන්න යන්ට ය. හෙරණ සිඛ විනිස ලියන ලද්දේ හෙරණුන්ට ය. අවම විසින් වයස අවුරුදු හතක් අටක් පමණ වූවන් ද හෙරණුන් අතර සිටීමට ඉඩ තිබේ. එබැවින් එවැනි ළදරු හෙරණුන්ට පැහැදිලිව නිරවුල්ව කරුණු ඉදිරිපත් කිරීමට කතුවරයා කල්පනා කරන්න ඇති.

සිඛවළඳ විනිය හා ධම්පියා අටුවා ගැටපදය සමකාලීන කෘති බවත්, ධම්පියා අටුවා ගැටපදය ක්‍රි.ව. 10 වැනි සියවසේ රජකළ V කසුප් මහරජ තුමා ගේ කෘතියක් බවත් ශ්‍රී මත් ජයතිලක මහතා ඇතුළු විද්වතුන් විසින් පිළිගෙන ඇත.[1] භාෂා ලක්ෂණ අනුව සලකන විට හෙරණ සිඛ විනිස ද එම කාලයටම අයත් යයි නිශ්චය කිරීම හේතු සහිතය.

පැහැදිලිලෙසම භික්ෂුන්වහන්සේ ගේ යථා පැවැත්ම ඇතිකර ලීම සම්බන්ධයෙන් පොළොන්නරු කාලයේ ලියන ලදැයි කිව හැකි ලේඛනය මහා පරාක්‍රමබාහු කතිකාවතයි. එහි භාෂාවත්, හෙරණසිඛ විනිසෙහි භාෂාවත් අතර පවතින සාම්‍යයට වඩා අසාම්‍යය දක්නට ලැබේ. කතිකාවත ආරම්භයේ දකින්නට ලැබෙන සමාස බහුල සංස්කෘත පදවලින් මිශ්‍රව යොදා ඇති භාෂාවට සමාන භාෂා ලක්ෂණ හෙරණ සිඛ විනිසෙහි දක්නට නොලැබේ. භාෂාව අතින් පවතින මේ වෙනස පොළොන්නරු කාලයට පෙර මෙම කෘතිය ලියන ලද බවට සැළකිය යුතු සාධකයකි.

සිඛ වළඳ හා සිඛ වළඳ විනිසත්, හෙරණ සිඛ හා හෙරණ සිඛ විනිසත්, එකම කාලයේ පමණක් නොව එකම ලේඛකයාගේද විය හැකි බව සමහරුන් කල්පනා කරන අතර,[2] සමහරුන් කල්පනා කරන්නේ මෙය පොළොන්-නරු කාලයට අයත් විය හැකි බවය.[3]

සිඛවළඳ හා සිඛවළඳ විනිසත්, හෙරණ සිඛ හා හෙරණසිඛ විනිසත් ලියවුණු කාලයේ සිටම, උසස් ලෙස පිළිගැණුනු බව සිතීමට ඉඩ තිබේ. පොළොන්නරු කාලයේ සිටම සංඝ සමාජයේ යහපැවැත්ම සඳහා ලියන ලද ලේඛන කීපයකම, මේ කෘති දෙක භික්ෂු අධ්‍යාපනයට යොදා ගත යුතු බව සඳහන් වේ.

පොළොන්නරු කතිකාවත උපසපන් භික්ෂූන් ගැන සඳහන් කරමින් ................මුල් සිඛ සේඛියා වත පොත් කරවා, සිඛ වළඳ විනිස අස්වා''යි

---

1. බ: සිඛ වළඳ විනිස ප්‍රස්තාවනා - D. B. ජයතිලක සංස්
2. බ: සිංහල සාහිත්‍ය වංශය 70 පි.
3. සිංහල කතිකාවත් හා භික්ෂු සමාජය 120 පි.

දක්වන අතර, සාමණේරයන් ගැන සඳහන් කරමින් ''හෙරණු නුදු හෙරණ සිඛ සේඛියා දසධම් සුතත් වන පොත් කොටැ[1]......'' යයි දක්වයි.

''හෙරණුන්ට හෙරණ සිඛ වන පොත් කොටැ අසා නිමවන තුරු මහළු පැවිද්දට........ සමු නොදිය යුතු'' යි දඹදෙණි කතිකාවත සඳහන් කරයි.[2]

මේ කරුණු අනුව පෙනීයන්නේ දඹදෙණි කාලය වන විට උපසම්පදාපේක්ෂකයා විසින් ඒ සඳහා ඉදිරිපත් වීමට කලින් අනිවාර්යයෙන්ම හෙරණසිඛ උගත යුතුව පැවති බවයි.

කැරගල පද්මාවතී පිරිවෙණෙහි අධ්‍යයන කාර්යයේ නිරත වූ ශිෂ්‍ය භික්ෂූන් මෙ කෘති දෙක හදාළ බව හංස සන්දේශයේ එන ''හෙරණ සිඛ කියති හෙරණෝ තැනින් තැන '' 170 පි.)

''මුන්සිඛ සිඛ වළඳ විමසන සභ ගණය'' (171 පද්‍ය) යන සඳහන් වලින් පෙනේ.

මේ අනුව කල්පනා කරන විට කෝට්ටේ කාලය අවසාන භාගයේ අර්බුදකාරී තත්ත්වය ඇතිවන තුරුම භික්ෂූන් වහන්සේට විනය ඉගැන්වීම කෙරෙහි හා භික්ෂූන් තුළ විනයානු කූල ශික්ෂණයක් ඇතිකරලීම සඳහා දක්වා ඇත්තේ නොමඳ සැලකිල්ලක් බව වැටහෙයි. එහෙත් ඉන්පසු විදේශිකයන්ගේ ආක්‍රමණත්, දේශීය නායකයන් අතර ඇති වූ නොසන්සුන් තත්ත්වයත් හේතුවෙන් ශාසනික ප්‍රතිපදවත්, ආරාමික අධ්‍යාපනයත් පිරිහීගිය බව රහසක් නොවේ.

වැලිවිට සරණඞකර තෙරපාණන්, සාසනික යථාතත්වය ඇති කර ලීමට දරණ ලද අනල්ප වෙහෙසෙන් ඉතා ස්වල්පයක් අපි දනිමු. එද උපස්යයි සම්මත පැවිදි තැන්වලින් මුලදී ඊට අනුබලයක් හෝ සහයෝගයක් නො ලැබුණත්, උන්වහන්සේගේ ශිෂ්‍යානු ශිෂ්‍යයෝ එම තත්ත්වය පවත්වා ගැනීමට උත්සාහ දරූහ. රාජානුග්‍රහයක් නොමැතිව වුව ද. සැලකිය යුතු කාලයක් ශාසනික ප්‍රතිපදව ආරක්ෂා වූයේ එම උත්සාහයේ ප්‍රතිඵලයක් වශයෙනි.

සූත්‍ර අභිධර්ම විනය යන ත්‍රිපිටක ධර්මය කෙරෙහිද ශාසනික පිලිවෙත් කෙරෙහි ද ලාංකික භික්ෂූන් වහන්සේ අතීතයේ සිටම දක් වූ සැලකිල්ල මෑත දී අඩු වී යාමට එක් හේතුවක් වූයේ විභාග ක්‍රමයේ බල පෑමයයි මට හැඟේ. උගත්කමට වඩා උගත්කමේ විහ්නයක් වන සහතිකයට සැලකීමේ

---

1. බ-කතිකාවත් සඟරා—ශ්‍රීමත් ඩී. බී. ජයතිලක
2. එම

හේතුවෙන් භික්ෂු අධ්‍යාපනයේ පැරණිමග වෙනස්විය. විභාග සමත්වීමේ අවශ්‍යතාව, භික්ෂුජීවිතය සම්බන්ධයෙන් ද බැහැර නොකළ හැකි අංගයක් බවට පත් වී තිබේ. මේ සියවසේ අරඹන ලද පිරිවෙන් සියල්ලේම නැතහොත්, වැඩි ගණනක අධ්‍යාපන කටයුතු සිදු කෙරෙන්නේ විභාග මුල් කරගෙනය.

19 වැනි සියවසේ අගභාගයේ සිට වර්තමාන ක්‍රමයේ පිරිවෙණ් ඇරඹීමෙන් පසු, විද්‍යෝදය-විද්‍යාලංකාර දෙපිරිවෙණ හැරුණු විට, වෙනත් පිරිවෙණක ත්‍රිපිටක ධර්මය ඉගැන්වීම හා සාසනික පිළිවෙත් පුහුණු කරවීම මුල්තන්හි ලා සැලකුණේ නම්, ඒ ඉතා කලාතුරකිනි. මුළු අධ්‍යාපන ක්ෂෙත්‍රයම විභාගක්‍රමයකට නැඹුරුවීම නිසා, එකී පැරණි තත්ත්වය නොදැනුවත්වම ගිලිහී ගියේය. සූත්‍ර අභිධර්ම දෙපිටකය සම්බන්ධයෙන් කෙසේ වෙතත්, විනය පිටකය භික්ෂු සමාජයෙන් ඈත්වීමේ ශෝචනීය විපාක දූන් දැන් අප හමුවෙ ප්‍රත්‍යක්ෂ ලෙසම දකින්නට ලැබේ.

විනය නම් හික්මීමයි. හික්මීම ගිහි-පැවිදි දෙපක්ෂයටම අවශ්‍යය. හික්මීම ඇති කෙරෙන හේතු කාරක සිරිත් පොදු කරුණකි. මේ අතර, ගිහි සමාජයේ හික්මීම සඳහා වලංගු නීතියත් පැවිදි සමාජයේ හික්මීම සඳහා විනය හා වලංගු නීතියත් හේතු කාරක වෙයි. මෙම හේතු කාරක උල්ලංඝනය කිරීමෙන් සමාජයේ නොහික්මුණු බව පිළිබිඹුවෙයි.

වත්මන් සමාජයේ බොහෝ දුරට එම නොහික්මුණු ලක්ෂණ දකින්නට තිබේ. යම් සමාජයක් විනයක් නීතියක් උල්ලංඝණය වන පරිදි ක්‍රියාකිරීමට පෙළඹීමේ විවිධ හේතු තිබේ. මෙම හේතු මෙහිලා විස්තර කිරීමට අදහස් නොකරමි. කිසියම් සමාජයක නීතිය විනය හා සිරිත් විරිත් කඩකිරීමක් සිදුවන්නේ නම්, එහි දෙදරීම, සමාජයේ එක් කොටසකට පමණක් නොව, ඒ සමාජයේ සම්බන්ධය ඇතිතාක් දුරට බල පායි. ගිහි සමාජයේ විනය පිරිහීම පැවිදි සමාජයේ කෙරෙහි ද පැවිදි සමාජයේ විනය පිරිහීම ගිහි සමාජය කෙරෙහි ද තදින් බලපාන්නේ මේ සමාජ අතර අන්‍යොන්‍ය සබඳතාවක් පවතින හෙයිනි.

බෞද්ධ භික්ෂු සමාජයේ ව්‍යාප්තියත් සමග බුද්ධකාලයේදී පවා යම් යම් විනය උල්ලංඝනය කිරීම් සිදු විය. තථාගතයන් වහන්සේ ධරමාන කාලයේ උන්වහන්සේ විසින් එබඳු සිද්ධි මුල් කර ගෙන, වරක් සිදු වූ වරද නැවත සිදු නොවීමට යම් යම් ක්‍රියා මාර්ග ගන්නා ලදී. බුද්ධ පරිනිර්වාණයෙන් පසු එබඳු විනය විරෝධී ක්‍රියා මැඩලීමට සාසන මාමක උභයතරවරයන් හා රාජ්‍යනායකයන් එක මුතුව ක්‍රියා කර ඇත. දඹදිවදී සිදුවූ එබඳු ක්‍රියාවකට ඉතා වැදගත් උදාහරණය නම්, ධර්මාශෝක රජතුමා හා මොග්ගලී පුත්ත තිස්ස මහ රහතන් වහන්සේ එකමුතු වී කළ සාසන

සංශෝධනයයි. ලංකාවේදී සිදුකරණ ලද මෙබඳු සිද්ධි ගණනාවක් ඉතිහාසයේ සඳහන් වේ. ඇතැම් අවස්ථාවලදී සාසන සංශෝධනය සිදුකර කතිකාවත් ඇති කිරීමද සිදු කරණ ලදී. මහා පරාක්‍රම බාහු කතිකාවත ඇතුළු කතිකාවත් සමූහය ඊට නිදසුන්ය.[1] මෙහෙරණ සිබ හා එම විනිස ද සිබවළඳ හා සිබවළඳ විනිසද, භික්ෂු සමාජයේ විනය යථා තත්ත්වයට පත් කිරීමේ අටියෙන් ලියනලද බව කිව හැකිය.

වැලිවිට සරණඞකර මාහිමියන්ගේ මූලිකත්වයෙන් සාසනය පුනරුත්ථාපනය කිරීමෙන් පසුව වුවද, සමස්තයක් වශයෙන් ලංකාවේ සියලුම භික්ෂූන් වහන්සේට විනයානුකූල පැවැත්ම සඳහා පැහැදිලි අවබෝධයක් පහසුවෙන් ලබාගැනීමේ මාර්ග පෑදී තිබුණු බවක් නොපෙනේ. එබැවින් යම් තරමක හෝ විනයක් පෙළ දහම් නූගත් අයගේ ජීවිතයෙන් පවා පිළිබිඹුවන්නේ ශික්ෂාකාමී විනය ධරයන් ඇසුරු කිරීමත්, බෞද්ධ සංස්කෘතියේ උසස් ගුණාංග උපතින් ම ජීවිතයට කාවැද්දීමත් නිසා විය හැකිය. ගිහි සමාජයේ විනය පිරිහීම බහුල වන විට පැවිදි සමාජයේ ද විනයානුකූල භාවය අපේක්ෂක තත්ත්වයෙන් පවත්වා ගැනීම ඉතා අසීරුය. ගිහි සමාජය විනයෙන් පිරිහෙනවිට නොහික්මුණු ක්‍රියා වැඩි වන විට කුඩා දරුවන්ට නිවසේදී ලැබිය යුතු හික්මීම නොලැබේ. නිවසේදී ලැබිය යුතු හික්මීම නොලද දරුවකු විනය පිළිබඳ නිසි අවබෝධයක් සැලකිල්ලක් නොමැති තෙරනමක් ළඟ පැවිදි වුවහොත්, එසේ පැවිදි වන තැනැත්තා විනය ගරුක කෙනෙකු වෙතියි සිතීම අසීරුය.

ලංකාව අද මුහුණ පා සිටින විනය පිරිහීමේ තත්ත්වයත්, ඉන් ඇතිවන අනිටු විපාකත් යහපත් පුරවැසියන්ගේ බලවත් කනස්සල්ලට හේතු වී තිබේ. (එහෙත් මේ කනස්සල්ලට පත්ව ඇත්තේ ධනයෙන්වත් බලයෙන් වත් ඉහළ මට්ටමේ පිරිසක් නොව, ඒ සම්බන්ධයෙන් පිළියම් යෙදීමට තරම් ධනයක් හෝ බලයක් තමන්සතුව නැති පිරිසක් බැවින්, ළතැවීම හැර කළහැකි අන්දෙයක් නැතිව, ඔවුහු පසුවෙති.)

පිරිවෙන් අධ්‍යාපනයේ ප්‍රතිසංස්කරණයක් කළ යුතුය යන අදහස වරින්වර ඉදිරිපත් වීමට එක් හේතුවක් වූයේ මෙම කරුණ බව කිව හැකිය. 1979 අංක 64 දරණ පිරිවෙන් අධ්‍යාපන පනත මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සැලකිය හැකිය. එම පනතට අනුව සම්මත කරන ලද 1980 අංක 01 දරණ නියෝගවලින් මූලික පිරිවෙන්වල ඉගැන්විය යුතු යැයි අනිවාර්ය කර ඇති විෂය අතර, පාලි, සිංහල, සංස්කෘත හා ත්‍රිපිටක ධර්මය ද වෙයි. මේ පනත හා නියෝග යටතේ ගෙන ඇති පියවර අතරෙන් සාසනික අතින් ඉතා වැදගත් සේ පෙනීයන්නේ මූලික පිරිවෙන් සම්බන්ධයෙන් කර ඇති වෙනස්කමය.

---

1 බලන්න:- කතිකාවත් සඟරා – ශ්‍රීමත් ඩී. බී. ජයතිලක

පණත හා නියෝග ක්‍රියාත්මක කිරීම ඇරඹෙන විට, ඒ මගින් නියම කරන ලද පාඨ්‍ය ග්‍රන්ථ බොහොමයක් සපයා ගැනීමේ දුෂ්කරතාවට මුහුණ පාන්නට සිදු විය. මේ සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාව මගින් හදිසි පියවර කීපයක් ගන්නා ලදී. දුර්ලභව පැවති පොත් හතරක ඡායාපිටපත් ගෙන එක් පොතකින් පිටපත් දෙක බැගින් එක් එක් පිරිවෙණට පරිත්‍යාග කිරීම එසේ ගත් ක්ෂණික පියවර අතර විය. හෙරණසිඛ හා හෙරණ සිඛ විනිසද මේ පොත් හතරෙන් එකකි.

එක් එක් පිරිවෙණක අධ්‍යාපනය ලබන ශිෂ්‍ය සමූහයකට එක් පොතකින් පිටපත් දෙකක් ප්‍රමාණවත් නොවන බව කිවයුතු නොවේ. හැරත් එම පොත්වල ඇතැම් පිටු ඡායාගත වී නොතිබීමත්, ඇතැම් පිටු පැහැදිලිව ඡායාගතවී නොතිබීමත් නිසා, හෙරණ සිඛ හා හෙරණ සිඛ විනිස ඉගැන්වීමේ කාර්‍ය්‍යය මේ දක්වාම සතුටුදායක මට්ටමකට පැමිණ නැති බව පෙනී යන කරුණකි. මෙය මූලික පිරිවෙන්හි ඉගැන්වීම සඳහා නියම කරණ කුරුම, ඇතැම් පිරිවෙන් පවා මෙබඳු පොතක් ඇති බව වත් නොදන සිටීම සංවේග ජනකය. බණදහම් පොතට උඬරණය කොට ඇති හෙරණසිඛ පාඨ විනා. හෙරණ සිඛ විනිසක් ගැන නොදන්නෝ ද වූහ. මේ සම්බන්ධයෙන් කිසිවකුට දොස් නැගීම නුසුදුසුය. අන්මගකට යොමු වෙමින් පැවැති පිරිවෙන් අධ්‍යාපනය යථා මාර්ගයට යොමු කිරීමේ දී මෙබඳු ගැටළු මතු වීම නොවැලැක්විය හැකි ය.

අභිනවයෙන් සසුන්ගත වන්නකුට පමණක් නොව කුලදරුවන් සසුන්ගත කරණ ආචාර්‍ය්‍ය උපාධ්‍යායන් ඇතුළුව සාසනික වත් පිළිබඳ අවබෝධයක් ලබා නැති, කවර තරමේ භික්ෂූන් වහන්සේ නමකට වුව ද පැවිදි ජීවිතයේ වත් පිළිවෙත් වගකීම් හා යුතුකම් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට, හෙරණසිඛ හා හෙරණ සිඛ විනිස ඉතා වැදගත් ග්‍රන්ථයක් වන බව මගේ වැටහීමයි. මෙය හැම භික්ෂූන්වහන්සේ නමකගේම අත්පොතක් වශයෙන් භාවිතයට ගැනීමට තරම් ප්‍රයෝජනවත් කෘතියක් සේ හඟිමි. මෙම කෘතිය සංස්කරණය කොට පළ කරවීමට මා පෙළඹුණු එක් හේතුවක් නම් එයයි. එහෙත් මෙය, ග්‍රන්ථයේ හදිසි අවශ්‍යතාව සළකා පළකරණ ලද්දක් විනා, ශාස්ත්‍රීය සංස්කරණයක් නොවේ. කාර්යබාහුල්‍යයත්, පැරණි පිටපත් සපයා ගැනීමේ දුෂ්කරතාවත් නිසා, ශාස්ත්‍රීය සංස්කරණයක් එළිදැක්වීම හදිසියේ නොකළ හැකිය. අවකාශ ලදහොත් එවැන්නක් පළකරවීම මතුවට කල් තබමි.

කෙසේ වුවද, මෙම සංකරණයත්, සංක්ෂිප්ත ලෙස වුවද ඉදිරිපත් කර ඇති ගැටපදයත්, පිරිවෙන්හි අධ්‍යාපන අධ්‍යයන කාර්යයේ නිරතව සිටින ආචාර්‍ය්‍ය ශිෂ්‍ය දෙපක්ෂයේ තත් කාර්‍ය්‍යය සඳහා ප්‍රමාණවත් වෙතියි සිතමි.

මෙම සංස්කරණයේ දී දැනට මුද්‍රණය වී ඇති නුවරඑළියේ විමල බුද්ධි ස්ථවිරයන් වහන්සේගේ සංස්කරණයත්, මැද උයන්ගොඩ විමලකීර්ති ස්ථවිරයන් වහන්සේගේ හෙරණ සිඛ විනිස ප්‍රදීපයත් ඇසුරු කෙරිණි.

මෙම පොත දෙවන වරට මුද්‍රණය කර ප්‍රකාශනය සඳහා බාර ගත් සමයවර්ධන මුද්‍රණ හා ප්‍රකාශන ආයතනයට මා කෘතඥවෙමි.

**කැලිගම විජිතනන්ද හිමි**

1993-11-27
රත්නපුර,
මහවල,
ශ්‍රී ධර්මායතනය.

# ප්‍රස්තාවනා

හෙරණ පැවිද්දකු විසින් අත්හළ යුතු වැරදි හා පිළිපැදිය යුතු ගුණ ධර්ම පිළිබඳව මූලික දැනුමක් ලබා දීම හෙරණ සිඛ ලිවීමේ පරමාර්ථ යයි. පොතේ නමින් ම හැඟෙන පරිදි මෙම ග්‍රන්ථය ''හෙරණ සිඛ හා හෙරණ සිඛ විනිස'' යන කොටස් දෙකකින් සමන්විත වේ.

''හෙරණහට දසසිල් දස සිඛ දසපරිජි දසනාසනා දස දඬුවම් වත්''යි ප්‍රධාන මාතෘකා පහක් මෙහි ආරම්භයේදීම දැක්වේ. හෙරණසිඛ විනිසෙහි මේ කරුණු වඩා විස්තර සහිතව දැක්වේ. ඒ අතර පළමුවෙන් දැක්වෙන්නේ පැවිදි කරණු ලැබීමට නුසුදුසු පුද්ගලයෝ කවුරුහුද ද, යන්නයි. එබඳු නුසුදුසුකම් අසූපහකට නොඅඩු සංඛ්‍යාවක් දක්වා තිබේ. එම නුසුදුස්සන් ප්‍රධාන වශයෙන් කොටස් තුනකට වර්ග කර දැක්විය හැකිය.

1. දිවිරැක ගැනීමේ උපක්‍රමයක් වශයෙන් පැවිදි වෙස් ගැනීමට බලාපොරොත්තු වන පුද්ගලයෝ.
2. අයහපත් චරිතයක් ඇති පුද්ගලයෝ
3. දකින අයතුළ අප්‍රසන්නතාවක් ඇතිවන තරමේ විරූපී පුද්ගලයෝ යනුවෙනි.

සාසනික ප්‍රතිපදව අනු දැන ඇත්තේ නොපැහැදුන වුන්ගේ පැහැදීමත්' පැහැදුණු අයගේ එම පැහැදීම වැඩිවන ආකාරයත් සැලකිල්ලට ගෙනය. ''අපපසනනානං පසාදය, පසනනානං භියොභා භාවාය'' යනුවෙන් විනය පෙළෙහි දැක්වෙන්නේ එම කරුණයි. එකී අපේක්ෂාවට බාධාවක් වන අන්දමේ පුද්ගලයන් පැවිදි කිරීමත් පැවිදි වෙසින් රැඳී සිටීමත් සසුනට අහිතකරය. කෙනකු සම්බන්ධ පැහැදීමක් හෝ නො පැහැදීමක් සඳහා බලපාන මුල් කරුණ රූපය හෝ වචනයයි. ගුවන් විදුලිය වැනි මාධ්‍ය පවතින වත්මන්හි මේ කරුණු දෙකින් කවරක් ප්‍රධානද යන්න දැක්වීම අපහසු වුවත්, අතීතයේ දී නම් රූපයම ප්‍රධාන වූ බව කිවහැකිය. තෙවනුව ඉරියව් පැවැත්ම ගත හැකි අතර, සිවුවෙනි තැන ගන්නේ චරිතයයි. ඉම් අනුව රූපය වචනය ඉරියව් පැවැත්ම චරිතය යන මේ අංගවලින් අනුගාමිකයන්ගේ සිතේ පැහැදීමක් ඇති කිරීමට හැකි පුද්ගලයන් පැවිද්ද සඳහා තෝරා ගත යුතු බව පැවිද්දට අභව්‍ය පුද්ගලයන් වර්ග කර ඇති ආකාරයෙන් පෙනේ.

මින් අනතුරුව කුලදරුවන් පැවිදි කිරීමට සුදුසු ආචාර්‍ය වරයන් කවුරුහුද යන්න දැක්වේ.

''හෙරණ පැවිදිකොට වත්පද දෙන්ට නිස්සෝ ද නිස දෙන්ට නිස්සෝද කවරහයත්'' යන මාතෘකාව යටතේ එ සුදුසුකම් විස්තරවෙයි. පැවිදි

කරනු ලබන්නාට පැවිද්ද ලැබීමට සුදුසුකම් තිබිය යුතුවාක් මෙන්ම පැවිදිකරන්නාට ඒ සඳහා ද සුදුසුකම් තිබිය යුතුය. එම සුදුසුකම් මෙසේය.

1. (උපසම්පදාවෙන්) දසවස් ඇත්තකු වීම

2. පරිජි, පචිති දෙපොතට අනුව තනිවම හෝ, තවකෙනෙකු සමඟ හෝ දෙදෙනකු සමඟ ක්‍රියාකිරීමේ හැකියාව.

3. අපලොකන කර්මය, ඥප්තිකර්මය, ඥප්ති ද්විතීය කර්මය ඥප්ති චතුර්ථ කර්මය යන විනය කර්මය දන්නා බව.

4. ඊට අනුකූලව ඛන්ධකද දැනීම

5. දික් සඟියේ මහවග හෝ, මැදුම් සඟියේ මුල් පණ්ණස හෝ සංයුත්සඟියේ සගාථක වර්ගය, නිදන වර්ගය, හා ඛන්ධක වර්ගය හෝ, නැතහොත් එහිම මහාවර්ගය හෝ, අංගුත්තරනිකායෙහි පූර්වාර්ධය හෝ අපරාර්ධය හෝ නැතහොත් එහිම, එක-ද්වික-ත්‍රික නිපාත හෝ චතුක්ක නිපාතය හෝ පඤ්චක නිපාතය හෝ,

   ඛුද්දක නිකායෙහි අටුවාව සමඟ ධම්මපදය හෝ, උගත් අයකු වීම, මෙම ධර්මකරුණු අභිධර්ම නයින් දතයුතු බව ද හැඟේ.

මෙම සුදුසුකම් සලකා බැලීමේදී අපට පෙනීයන කරුණක් නම් කුලදරුවකු පැවිදිකිරීමට අපේක්ෂා කරණ භික්ෂූන්වහන්සේ, යටත් පිරිසෙයින් තිස් විය වත් ඉක්ම වූ ධර්ම විනය දෙකෙහි ප්‍රධාන කරුණු සම්බන්ධ මනා දැනුමක් ඇති අයකු විය යුතු බවයි.

''හෙරණ පැවිදි පූර්වයෙහි කළමනා විධි'' මින් අනතුරුව දක්වේ. මේ යටතේ විස්තර කෙරෙන්නේ කුලදරුවකු පැවිදි කිරීමට කලින් ඉටු කළ යුතු කාර්යභාරයයි. පැවිදිවීමේ අදහසින් පැමිණෙන කුලදරුවාට ''පැවිදිකමේ දුෂ්කරතාව පෙන්නා දීම'' මෙහි මුලින්ම සඳහන් වේ.

පැවිද්දකු වශයෙන් ජීවත්වීම බොහෝ පහසු යයි සිතන්නන් අද මෙන්ම එදද සිටියහයි සිතිය හැකිය. අපරාධකරුවන් පැවිදිවීමට අදහස් කරන්නේ නීතියට වසංවීමේ පියවරක් වශයෙනි. එබඳු හේතු ඇතිව පැවිදිවීමට බලාපොරොත්තුවන කවර අයකු තුළ ද සාසනික කටයුතුවලදී මුල්විය යුතු ශ්‍රද්ධා-ප්‍රඥා යන ගුණාංග නොතිබිය හැකිය. පැවිදිකමේ දුෂ්කරතාව පැහැදිලි කර දියයුතු බව දක්වීමෙන් අදහස් කරන්නට ඇත්තේ කුලදරුවා තුළ එම ගුණාංගවල බීජාවස්ථාව වත් තිබේදැයි විමසා බැලීම විය හැකිය.

පැවිදිවන්නාත්-පැවිදිකරන්නාත් යන දෙදෙනාගේම උච්චාරණ ශුද්ධියේ, අවශ්‍යතාව මීළඟට දක්වෙයි. "වත්තෙරුන් විසින් හෝ හෙරණ පැවිදි කැමැත්තහු විසින් හෝ ශුද්ධ කොටැ උච්චාරණ නොකොට හුන, පැවිද්ද නො අරා. හෙරණ පැවිද්දන්ගේ සරණ ගමන්, මහලු පැවිදිකරන කම්වදන් හා සමයැ"යි දෙදෙනාගෙන් එක් අයකු හෝ උච්චාරණ දුර්වලතාවකින් යුක්ත නම් පැවිද්ද නොපිහිටන බව දැක්විය.

මීන් අනතුරුව දක්වෙන්නේ දසසිල් හා දස සිඛය. "දස සිඛ නම් කවර යත්.........? "මෙ දසසිල්මැ හික්ම විය යුතු බැවින් දස සිඛ නම් වෙ"යි. හික්මීමේ අදහසින් දසසිල්ම දස සිඛ නම් ද වන බව දක්වන ලදී. දස සීල-යෙන් හතළිස් ආකාරයක හික්මීමක් අපේක්ෂිතයි.

1. දසසිල් සමාදන් වූවහු ඒ සිල්පද දහයට අනුව හික්මීම.
2. අන්‍යයන් දසසිල්හි පිහිටුවීමෙන් ඒ අන්‍යයාගේ හික්මීම ඇති වන විට විසිගුණයක් වේ.
3. දස සිල්හි ගුණයන්, දස සිල්පිරීමෙන්, අත්වන ලෞකික-ලෝකෝත්-තර ධර්මයේ ගුණයන් සලකා සිල් පුරණ විට ඒ හික්මීම තිස් ගුණයක් වේ.
4. එම දසසිල් පිරීමෙන් තමා තුළත් අන්‍යයන් තුළත් ඇතිවන ගුණය සිතින් සළකා දසසිල් පිරීමෙන් එම හික්මීම හතලිස් ආකාර වේ.

සිල් සමාදන් වූවහු එම සීලය ආරක්ෂා කිරීම අන්‍යයන් ද, එම සීලයෙහි පිහිටුවීම , සිල්වත්වීමෙන් සැළසෙන ධර්මලාභයේ ගුණය සලකමින් සිල් පිරීම, සිල්වත් තමාගේ මෙන්ම, සිල්වත් අන්‍යයාගේද ගුණය සලකමින් සිල්පිරීම යන ගුණාංග සිල්වත් කමේ නියම වටිනාකම සැළසෙන ක්‍රියා මාර්ගය බව මෙම විග්‍රහයෙන් පැහැදිලිවෙයි. තමා පමණක් නොව සිල් පුරණ අන්‍යයාද උසස් කොට සැලකීමට මෙයින් ඉගැන්වේ. එමගින් තමා සිල්වතෙක්ය, යනුවෙන් ඇති විය හැකි මානය දුරුවෙයි. සමානාත්ම-තාව ඇතිවෙයි.

සිල්වතා තුළ ඇති විය යුතු ගුණාංග හතරක් ද මෙහි අනතුරුව දක්වේ.

1. ලජ්ජාව හා බිය ඇතිවීම.
2. රාගාදි කෙලෙස්වලට වසඟනොවී ඒවා මැඩලීම.
3. සිත අකුසලින් නගා කුසල්හි පිහිටුවා ගැනීම.
4. සිහිනුවණින් යුතුව ප්‍රාණ ඝාතාදියෙන් වෙන් වීම.

ලජ්ජාව නම් පව් කිරීමට ඇති හිරි යයි. තම ශාස්තෘවරයාගේ උසස් ගුණය, තම දෙමාපියන්ගේ වැදගත්කම, තම ගුරුවරයාගේ ගරුකටයුතු බව යන කරුණු සළකමින් උසස් ශාස්තෘවරයකුගේ ශ්‍රාවකයකු වශයෙන්

වැදගත් දෙමාපියන්ගේ දරුවකු වශයෙන්, සැළකිය යුතු ගුරුවරයකුගේ ශිෂ්‍යයකු වශයෙන් පව්කිරීම, ඒ උතුමන්ටත් තමාටත් මදිකමක් සේ සිතා පව් කිරීමට ලජ්ජාව උපදවා ගත හැකිය.

බිය නම් ඔත්තප්ප යනුවෙන් හැඳින්වෙන පව්කිරීමට ඇති භයයි. එහි ප්‍රභේද හතරකි.

(i) අත්තානුවාදභය.—(තමා කළ පව සිහිවීමෙන් තමාගෙන්ම තමාට දෙස් නැගෙතැයි ද තමාට පසුතැවිලි වෙන්නට සිදුවෙතැයි ද ඇතිවන බිය.

(ii) පරානුවාදභය— තමා හොරකම් ආදී වැරදි කළ හොත් අනුන්ගෙන් දෙස්නැගෙතැයි ඇතිවන බිය.

(iii) දණ්ඩභය — පාපක්‍රියා කිරීමෙන් තමාට දඬුවම් විඳින්නට සිදුවෙතැයි යන බිය.

(iv) දුග්ගති භය — මේ මේ පව් කිරීමෙන් අපාගත වීමට සිදුවෙතැයි ඇතිවන බිය.

සිල්වතෙකැයි ප්‍රකට නොවන කෙනෙකු කරණ පාපක්‍රියාවට වඩා සිල් වතෙකැයි ප්‍රසිද්ධ කෙනෙකු කරණ පාපක්‍රියාව ඉක්මනින් සමාජයේ අප්‍රසාදයට ලක්වෙයි. ඒ කරුණ සිහිනුවණින් සළකා පව් කිරීමට ලජ්ජාව හා භය උපදවා ගැනීමෙන්ම සීලය ආරක්ෂා වේ.

මීළඟට විස්තර කෙරෙන්නේ දසපරිජිය. "මේ දස පරිජිනම් කෙසේ වි යැ යත් ? යම් හේතුවකින් මේ සස්නෙන් පරදවාද, සස්නෙන් ච්‍යුත කෙරේද සදහමින් දුරුකෙරේද ශ්‍රාමණ්‍ය භාවයකින් බ්‍රහ්මාත්මභාවයකින් ච්‍යුත වූවක්හු වැනි කෙරේ ද, එබැවින් මේ දස පරිජි නම් වේ"යි දස පරිජි යන්නේ අර්ථය පැහැදිලි කර ඇත. සසුනෙන් පැරදීම ශ්‍රමණභාවය අහෝසි වීම පරිජි හෙවත් පාරාජිකා යන්නේ තේරුමයි. උපසම්පද භික්ෂුවක් පාරාජිකාවිය හැකි ප්‍රධාන කරුණු හතරක් විනයෙහි දක්වේ. සාමණේර පැවිද්දකු පාරාජිකා විය හැකි ප්‍රධාන කරුණු දහයක් මෙහි දැක්වේ. උපසපනකු පාරාජිකා විය හැකි එක් කරුණක් නම් මනුෂ්‍ය විග්‍රහය හෙවත් මනුෂ්‍යඝාතනයයි. එහෙත් සාමණේර පැවිද්දකු පාරාජිකා වීමට මනුෂ්‍යයකු ඝාතනය කිරීමම අවශ්‍ය නැත. කවර සතකු ගේ හෝ දිවි තොර කිරීම පාරාජිකා විය වරදට වැරදිකරුවකු වීමට පොහොනේ වෙයි. අදත්තාදන-යෙන් උපසපනකු පාරාජිකාවන්නේ අනුදැනුමක්නැතිව ගන්නා දේ පාදයක් හෝ එපමණ වටිනාකමක් ඇති දෙයක් වූවිට පමණය. එහෙත් සාමණේර කෙනකු පාරාජිකා වීමට අන්සතු නූල්පොටක් වුවද, අනු දැනුමක් නැතිව සොරසිතින් ගැනීම ප්‍රමාණවත්ය. හොරකම් වංකොල්ලය වංචාව තර්ජනය කිරීම බලපෑම යන කවර ආකාරයකින් ගතද අදත්තාදන සංඛ්‍යාවට

ඇතුළත් වේ. එහෙත් සඟසතු වස්තුවක් හෝ සඟසතු දේපළක් පෞද්ගලික අයිතියට යටත් කර ගෙන ඇති විටෙක එහි සඟසතු අයිතිය ආරක්ෂා කිරීමේ පිරිසිදු චේතනාවෙන් , එම වස්තුව හෝ දේපළ ලබාගැනීමට සද්භාවයෙන් ක්‍රියා කිරීමෙන් අදත්තාදනය නොවේ.

මෛථුන ධම්ම පාරාජිකාව, උපසම්පද - සාමණේර දෙපක්ෂයටම සමානයි. උපසපන් භික්ෂූන් සඳහා වන පාරාජිකාපාලියේ එය ප්‍රථම පාරාජිකාව වශයෙන් පනවා ඇති අතර, හෙරණ පැවිද්දන් සඳහා මෙහි තෙවැනි පාරාජිකාව වශයෙන් පනවා තිබේ.

පාරාජිකා සංඛ්‍යාවේ ලා ගැණෙන වරදක් කෙනෙකුගෙන් සිදු වූ පමණින්ම එම වරද කළ තැනැත්තා පාරාජිකා නොවේ. වරදකරණ තැනැත්තා උමතු පුද්ගලයකු නොවීමත්, තමාගේ ක්‍රියාවෙන් ඇතිවිය හැකි ප්‍රතිඵලය ගැන දැනුමක් තිබීමත් අවශ්‍යය.

''මේ පියොවින් මොහු මරමි. දැන දැන යුසේයි'' යනුවෙන් හෙරණ සිඛයෙහි ඒ බව විස්තර වෙයි. මෙහි ''දැන දැන'' යන යෙදුම වර්තමාන නීතියට ද එකඟ බව මගේ හැඟීමයි. දණ්ඩනීති සංග්‍රහයේ 293 වගන්තිය යටතේ සාවද්‍ය මනුෂ්‍ය ඝාතනය කිරීමේ වරද පැහැදිලි කරමින් ''මරණය සිදු කිරීමේ අදහසින් හෝ මරණය සිදුවිය හැකි අන්දමේ ශාරීරික පාඩුවක් සිදුකිරීමේ අදහසින් හෝ තමා කරන යම් ක්‍රියාවකින් මරණයවීමට ඉඩ ඇති බව දනිමින්ම යම් ක්‍රියාවක් කිරීමෙන් මරණය සිදුකරන තැනැත්තෙක් සාවද්‍ය මනුෂ්‍ය ඝාතනය සිදු කරයි.'' යනුවෙන් පනවයි. ශික්ෂා පදයේ ''දැන දැන'' යන්නත් නීතියෙහි ''දනිමින්ම'' යන්නත් අර්ථයෙන් සමානය.

මෙහි '' දැන දැන'' යනු චේතනා සම්ප්‍රයුක්ත බවයි. එනම් අදහසයි. (Intention) එය සාවද්‍ය චේතනා (mensrea) වකි. මරණයක් සිදු කිරීමෙන් පාරාජිකා වීමට ඉඩ ඇත්තේ මරණය සිදු කළ තැනැත්තා සාවද්‍ය මනසකින් එම ක්‍රියාව කළේ නම් පමණකි. ''චේතනා'හං භික්ඛවේ කම්මං වදාමි'' යන බුදු වදනත් චේතනාව සාවද්‍ය නොවේනම් ක්‍රියාවෙහි වරදක් නැත.'' (actus non facit reumnisi mens sitrea) යන නීතියේ මූලධර්මයත් සැලකිල්ලට ගත් විට ''දැන දැන'' යන අංගය සම්පූර්ණ නොවූ විට සත්ව ඝාතනය අදත්තා දානය, මෛථුන ධර්මය, මුසාවාදය, හා සුරාපානය යන ක්‍රියාවලින් පාරාජිකා වීමේ වරදට යටත් නොවන බව කිව හැකිය.

යම් කිසි හෙරණක්, මැරීමේ චේතනාවෙන් නොව, හානි කිරීමේ චේතනා -වෙන් කළ ක්‍රියාවකින් හානි කරනු ලැබූ සත්වයා මළහොත්, හානිය කළ තැනැත්තා පාරාජිකා වේද යන්න සළකා බැලිය යුතුය. මෙහි දී පැහැදිලි වන කරුණක් නම්, හානිකිරීමේ චේතනාව වුවද සාවද්‍ය බවයි. ඔහු සත්වයා

මැරීමේ ප්‍රතිඵලය දැන නො සිටියත් හානි කිරීමේ ප්‍රතිඵලය දැන සිටියේය. සත්වයකු මැරීම පමණක් නොව හානි පැමිණවීමද වරදක් සේ බුදු දහම සලකයි. එබැවින් හානි පැමිණවීමේ චේතනාවෙන් කළ ක්‍රියාවකින් සත්වයා මිය ගියහොත්, පාරාජිකාවීමේ වරදට යටත්වන බව තීරණය කළ හැකිය. දණ්ඩනීති සංග්‍රහයේ 294 වගන්තියෙහි මිනිමැරීමක් වන අයුරු දක්වමින් කෙරෙන තුන්වන පැහැදිලි කිරීම අනුව සැලකීමේ දී වුවද ඉහත දක්වූ කරුණ සනාථ වෙයි.

පළමු වැනි පාරාජිකාවේ ''දැන දැන'' යන්නෙන් අදහස් කරන්නේ සතකු බව හා එම සතා මැරීමට යොදන උපක්‍රමයෙන් ඌ මැරිය හැකි බව යන කරුණුය. විනිසෙහි දක්වා ඇත්තේ මීන් දෙවන කරුණ පමණයි. දෙවන පාරාජිකාවේ ''දැන දැන'' යන්නෙන් ගැණෙන්නේ , අනුන් අයත් දෙයක් බව දැනීමයි.

තුන්වන පාරාජිකාවේ ''දැන දැන'' යන්නෙන් අදහස් වන්නේ උමතු මායාවකින් තොර බවයි. අසුචි හා සඳුන් වෙන් කර හඳුනා ගැනීමට තරම් හෝ රත්තරන් හා ගින්දර එකිනෙකින් වෙන්කර දැන ගැනීමට තරම් හෝ සිහිය තිබේ නම් වගකීමෙන් නිදහස් නොවේ.

තමාගේ ක්‍රියාව සිහි විකලත්වය නිසා වැරදි දෙයක් බව වටහා ගැනීමට නොහැකි අවස්ථාවකදී කරණ ක්‍රියාව වරදක් නොවන බව ලංකා දණ්ඩනීති සංග්‍රහයේ 77 වගන්තියේ දක්වේ.

හතරවන පාරාජිකාවේ ''දැන දැන'' යන්නෙන් අදහස් කෙරෙන්නේ බොරුවක් බව දනිමින් බවය. පස්වන පාරාජිකාවේ ඉන් අදහස් කරන්නේ රා බව දැන දැන බීම වරදක් බවයි.

සාමණේර පැවිද්දකු කවර අන්දමේ බොරුවක් කීවත් පාරාජිකාවන අතර, උපසපන් පැවිද්දකුට බොරු කීම පාරාජිකාවක් වන්නේ තමා උතුරු මිනිස්දම් නැතිව තිබිය දී ඒ ඇති බව වංචනික ලෙස ඇඟවීමෙනි. සුරා පානයෙන් උපසපන් පැවිද්දකුට පාරාජිකාවක් නොවේ. සාමණේර පැවිද්දකු වුවද රා බව නොදැන බීමෙන් පාරාජිකා නොවන බව ඒ සම්බන්ධ විනිසෙහිම දක්වේ. මෙහි රා බීම වරදක් බව නො දැන බීම හා තමා බොන්නේ රා බව නො දැන බීම යනුවෙන් නො දැනීමේ අවස්ථා දෙකක් ගත හැකිය. පළමුව දක් වූ නොදැනීමෙන් ගැනෙන්නේ ප්‍රඥප්තිය පිළිබඳ නොදැනීමයි. දෙවනුව දක් වූ නොදැනීමෙන් ගැනෙන්නේ සිද්ධිය පිළිබඳ නොදැනීමයි. ප්‍රඥප්තිය පිළිබඳ නොදැනීම වරදින් නිදහස් වීමේ රක්ෂණය නොලබයි. නීතිය අතින් බැලුවත් එය එසේමය. නීතිය නොදැනීම වරදින් නිදහසට හේතුවක් නොවේ. රටේ නීතිය පුරවැසියන් සියලු දෙනාම දැන

සිටිත බවට පූර්ව නිගමනයක් පවතින හෙයිනි.[1] සිද්ධිය පිළිබඳ වරදයනු කුමක් දැයි ආචාර්ය ජී. එල්. පීරිස් මහතා කරන මේ හැඳින්වීමෙන් තේරුම් ගත හැකිය.

"සිද්ධිමය වැරදීමක් නිසා යමකු තමා සාපරාධී ලෙස හැසිරෙන බව නොදන ස්වේච්ඡාවෙන් සාපරාධී හැසිරීමක නිරතවෙයි. මේ අවස්ථාවෙහි ඔහු ආධ්‍යාත්මික ලෙස සදෙස් නොවනුයේ වරදක් සිදු කිරීම ඔහුගේ අභිප්‍රාය නොවන හෙයිනි"[2] සුරාපානය විනය විරෝධී ක්‍රියාවක් බව නොදන හෝ, රා බව දැන දැන බීම යන දෙයාකාරයෙන් කවර අන්දමිකින් වූවද සුරාපානය කිරීමෙන් වරදක් කළ සේ පිළිගැනේ. එහෙත් තමා බොන්නේ සුරා බව නොදන සුරාබීමෙන් වරදක් කළ සේ නොපිළිගැනේ.

"රා" යන පදය මෙහි යෙදී ඇත්තේ පාලියේ "සුරා" යන පදය වෙනුවට එම තේරුම දීම සඳහාය. බෞද්ධ සාහිත්‍යයේ සුරා වර්ග පහක් සඳහන් වේ.[3] මේ අනුව සියලුම මත් ද්‍රව හා ද්‍රව්‍ය මේ පදයෙහි අන්තර් ගත සේ සැලකිය හැකිය.

**හෙරණ පැවිද්දට නියමකර ඇති දඬුවම්**

හෙරණ පැවිද්දකුට නියමිත දඬුවම් තුනක් මෙහි දැක් වේ.

1. ලිංගනාසනා හා ලිංගනාසනායෙන් පසු නැවත පැවිදි කිරීම.
2. වැලි දඬුවම්
3. සංඝාරාමයෙන් නෙරපීම.

"දණ්ඩනය යනු නීතිය උල්ලංඝනය කොට ලබාගත් අයිතිවාසිකම් හෝ වාසි අහෝසි කිරීමය[4]." යනුවෙන් නීතිවේදීහු දක්වති. එහෙත් විනයෙහි නියම කර ඇති දඬුවම් හා ඒවා ක්‍රියාත්මක කිරීමට දී ඇති උපදෙස් අනුව පෙනී යන්නේ අයුතු ලෙස ලබා ගත් ලාභ අහිමි කෙරෙන අතරම, වරද කළ පුද්ගලයා තමා කළ වරද භාරගෙන නැවත එවැනි වැරදි නොකිරීමේ, ශික්ෂණය ද ඔහු තුළ ඇති කිරීමයි. වරද පිළිගත් පසු ක්ෂමාව දීම බුදු දහමේ ඉතා උසස් ලෙස සලකා තිබේ. කෙටියෙන් කියතොත් පුද්ගලයා යහමගට ගැනීම, මෙම දඬුවම්වලින් අපේක්ෂා කර ඇති ප්‍රධාන අරමුණ බව පැහැදිලි වෙයි.

මෙහි ලිංග යනුවෙන් දැක්වෙන්නේ ශ්‍රමණ වේශයයි. එනම් පැවිදි ස්වරූපයයි. නාසනා යනු එම ස්වරූපය ඉවත් කිරීමයි. එනම් සිවුරු හැරවීම හෙවත් උපැවිදි කිරීමයි. දස පරිජි අතරෙන් එකකට හෝ පත්

---

1. අපරාධ නීතිය—ජයතිස්ස කොස්තා–1978, 12 පි.
2. ශ්‍රී ලංකාවේ අපරාධ නීතිය—ජී. එල්. පීරිස්–1977, 44 පි.
3. Pali – English Dictionary—p. 700
4. ශ්‍රී. ලං. අ. නී,—67 පි.

වූවකු මෙම දඬුවමට යටත් කළ හැකිය. ඉන් පළමු පහ එනම්, සත්ව ඝාතනය අදත්තා දනය[1] මෛථුන සේවනය, මුසාවාදය හා සුරා පානය යන වැරදි පහ සම්බන්ධයෙන් දිය හැකි උපරිම දඬුවම මෙයයි. ඒ කොටසට අයත් වරදක් කළ අයකු තමා එම වරද කළ බව වහාම පිළි ගන්නේ නම්, සිවුරු ඉවත් නොකර ඔහු පැවිදි කළ හැකිය.

(ii) එම වරද වහාම නො පිළිගන්නේ නම්, සිවුරු හරවා හෙවත් ලිංග නාසනයට යටත් කර වරද අවබෝධ කර ගත් පසු නැවත පැවිදි කළ හැකිය.

(iii) වරද නොපිළි ගන්නේ නම්, සිවුරු හරවා බැහැර කළ යුතුය.

පාරාජිකා දහයේ මුල් පහෙන් එකකින් පරිජිවීමට වඩා ඊළඟ පහෙන් එකකින් පරිජිවීම බරපතල ලෙස සැළකේ. එම පහ හැඳින්වෙන්නේ, ''සබ්බනාසනා'' යනුවෙනි. ඒ අතරෙන් ද භික්ෂුණී දූෂණය වඩාත් බරපතල ය. එම කරුණෙන් පරිජිවූවකුද උපැවිදි කර වීම අනිවාර්ය බව පෙනේ. 6, 7, 8, 10 යන අංක සංඛ්‍යාවලට වැටෙන තුනුරුවන්හි අගුණ කීම[2] නිසා හා නියත මිථ්‍යා දෘෂ්ටිය ගැනීම නිසා පරිජිවූවකු පසුව තම වරද පිළිගෙන ආයති සංවරයෙහි පිහිටීමට කැමැති වන්නේ නම්, අවවාද කොට ලිංග නාසනය කර, වැලි දඬුවම් දී නැවත පැවිදි කළ හැකිය. කවර කරුණකින් වුවද පරිජිවන්නකු ආයති සංවරයෙහි පිහිටීමට කැමැති නො වන්නේ නම් උපැවිදි කළ යුතු බව පෙනේ.

## සිවු පසය පරිභෝග කිරීමේ අයිතිය අත්හිටුවීම

මෙයද සාමණේර පැවිද්දකුට නියමිත දඬුවම් වලින් එකකි. පරිජිඅවන් කෙනකුට දයකයන්ගෙන් ලැබෙන සිවුපසය පරිභෝජනය කිරීමේ අයිතිය අහිමි වේ. යමකු පරිජිව, ඒ බව දනිමින්ම දයකයන් විසින් පිරිනැමෙන සිවුපසය පරිභෝජනය කරන්නේ නම් එය ථෙය්‍ය පරිභෝගයයි. එනම් තමාට අයිති නැති දේ හොරෙන් වංචනික ලෙස පරිභෝජනයයි.[3]

## වැලි දඬුවම.

වැලි දඬුවම නියමිත වැරදි හතරක් ඉහත දක්වන ලදි. ඊට අමතරව විකල් බොජුන්, නටනු ගයනු වයනු විසූළු දස්න, මල් ගඳ විලවුන් ඇඳුරීම උසසුන් මහඅස්නේ හිඳීම, ජාත රූප රජත පටිග්ගහනය යන වැරදි කරන්නවුනට ද වැලිදඬුවම් පැමිණවිය හැකිය.

---

1. බ. ද. සං. 366–ව.
2. තුනුරුවන්හි අගුණ කීම නීතියෙන් වුවද වරදක් විය හැකිය.
   සැයු:– බුද්ධරත්නයේ අගුණ කීම, උන්වහන්සේගේ ශාසනය පවත්වාගත යනු ලබන භික්ෂූන් වහන්සේගේ හානියට හේතු විය හැකි කරුණක් සේ සලකා, ද–නී. සං–479–පැහැදිලිකිරීම යටතේ සැසඳිය හැකිය.
3. වංක ලෙස දේපල පරිහරණය නීතියෙහිද වරදකි. බ–ද. නි. සං. 386-ව.

## සංඝාරාමයෙන් නෙරපා හැරීම

ලිංග නාසනයට භාජනය කළ හැකි වරදක් කිරීමෙන් අනතුරුව එම දඬුවම ස්ථිරවූවකු සහරමින් නෙරපා හැරීම අවශ්‍යයෙන්ම සිදු කළ යුතු බව සිතිය හැකිය. ඊට අමතර ව සංඝාරාමයෙන් නෙරපා හැරීමේ දඬුවම පැමිණවිය හැක්කේ දස දඬුවම්වත් අතරෙන් 6 සිට 10 දක්වා ( ඒ දෙකම ඇතුළුව) වැරදිවලින් කිසිවක් කළ හෙරණුන්ය. මේ පහට ඇතුළත් වරදක් කළ අයකුට වෙන දඬුවමක් නියමකර නැත.

සංඝාරාමයෙන් නෙරපීම යන්නට හෙරණසිඛ විනිසෙහි දී ඇති විස්තරය මෙසේය.

> ''සහරමින් නෙරනා වත්පස විකුම්කළහු නෙරනා කලැ වත් පදදුන් වත් තෙරුන් තමානිසා වාසය කරනුවා තමන් වසනා පිරිවෙණට හෝ තමන්ට වසගින් පැමිණි සෙනස්නට හෝ නොවැද්ද දිය යුත්තේ යැ. සියල් සහරමින් නෙරිය යුතු නොවේ.'' (28 පිට)

මේ අනුව නෙරපනු ලැබිය හැක්කේ ආචාර්‍ය්‍යවරයා වසන ආවාසයෙන් විනා මුළු සංඝාරාමයෙන් නොවේ.

දස දඬුවම් වත් අතරෙන් සහරමින් නෙරපීමේ දඬුවමට යටත් කළ හැකි වැරදි පහම භික්ෂූන් හා ගැටුම් සම්බන්ධ ඒවාය. එම ගැටුම් ඇති වීමට තුඩු දුන් පරිසරය වෙනස් කිරීමෙන් එවැනි ප්‍රතිඵලයක් ඇති නොවිය හැකිය, යන පූර්ව නිගමනය මත හෝ දඬුවම නියමකර ඇති බව පෙනේ.

## නුන්දූසිරි

මේ යටතේ විස්තර කර ඇත්තේ කායික වාචසික හා මානසික වශයෙන් සිදු කෙරෙන නොමනා හැසිරීමය.

මෛථුන සේවනය, උපක්‍රමයෙන් ශුක්‍ර මෝචනය, රාගසිතින් ස්ත්‍රී පුරුෂ-පණ්ඩක-තිරශ්චීන යන අයගේ කායස්පර්ශය විඳුම රාගසිතින් කිති කැවීම, දිය කෙළිය, දියට කෙළ ගැසීම කෝපයෙන් අනුන්ට පහර දීම, අත්සැත්කියපීම (අත අවියක් මෙන් අමෝරා තර්ජනය කිරීම). සංඝභෙද කිරීමට අනු බල දීම, සංඝභෙදය කරන තැනැත්තාගේ ගුණ කීම, තමාට අවවාද නො දෙන්නැයි අනුන්ට කීම, රාගසිතින් ස්ත්‍රී--පුරුෂ-පණ්ඩක හා තිරිසනුන්ගේ ද සිරුරේ ගුණාගුණ කියා ආක්‍රෝෂ කිරීම, මෛවුන්-දමෙන් සංග්‍රහ කිරීමේ ගුණ කීම හෝ ඒ බව හැඟවීම, මල්, ගෙඩි-ගස්-වැල් ආදිය දීමෙන් කුලසංග්‍රහය, ස්ත්‍රියක හා එක්වීමේ කැමැත්තෙන් රහසිගත තැන්වල විසීම, එක් තැනකට ලැබුණු දෙයක් තව තැනකට දීම, ස්ත්‍රී පුරුෂ යන්ගේ තිබෙන අගුණ කියා බැණ වැදීම, භෙද කිරීමේ අදහසින් තිබෙන අගුණ කීම, අනුදැනුමක් නැතිව අන් කෙනෙකුගේ පාත්‍ර-සිවුරු ආදිය තැන්පත් කර තැබීම, බුදුන් අන්තරායකරයයි වදළ කරුණු එසේ නොවේ යයි කීම යනාදී කරුණු ත්‍රිවිධ දුෂ්චරිත සංඛ්‍යාවෙහි ලා දක්වේ.

මින් අනතුරුව හෙරණ සිඛයෙහි නො දක් වූ මාතෘකා 13 ක් යටතේ පැවිද්දකු විසින් දනගත යුතු වත් සිරිත් රැසක්. හෙරණ සිඛ විනිසෙහි දක්වා තිබේ. ඒවා නම්.

1. සතරපසයෙහි පවත්නා විධි.
2. මහළු සබ්‍රම්සරුන් කෙරෙහි පවත්නා විධි.
3. දාගැබ් මහ බොයා පිරිය යුතුවත්.
4. සෙනසුන් සෝධන වත්.
5. අත් පස් අත් දෙණි දියවවන්හි පිරිය යුතු වත්.
6. තමාලග්නා සෙනස්නෙහි පවත්නා විධි.
7. සඟසතු ඇ වත්හි පවත්නා විධි.
8. මතක පිරිකර පවත්නා විධි.
9. කුලගම් එළැඹෙනහු , එළඹියාහු විසින් පිරිය යුතු වත්.
10. තමාලග්නා වෙහෙරින් අන්වෙහෙරකට එළැඹෙන විසින් පිරිය යුතු වත්.
11. එළැඹුණු වෙහෙර පිරිය යුතු වත්.
12. තමා ලග්නා වෙහෙරට වැඩි ආගන්තුකයන් කෙරෙහි පවත්නා විධි.
13. ගිලනුන් කෙරෙහි පිරිය යුතු වත්, යනුවෙනි.

දසසිල්- දස සිඛ-දසපරිජි ඈ විසින් මුලින් දක්වූයේ පැවිද්දකු විසින් වැළකිය යුතු කරුණුය. එම කොටස චාරිත්‍ර සීලයෙහිලා ගැනේ. ඉහත දක් වූ මාතෘකා දහතුන යටතේ විස්තර වන්නේ පැවිද්දකු විසින් පිළිපැදිය යුතු ගුණාංගයි. ඒවා වාරිත්‍රශීලයෙහි ලා ගතහැකිය. මේ අනුව බලන විට චාරිත්‍ර වාරිත්‍ර යන දෙවදැරුම් සීලයම මෙම කෘතියෙහි සංග්‍රහවන බව කිව හැකිය.

මෙම විධි ඉදිරිපත් කිරීමෙන් පැවිද්දකුගේ හැසිරීම , පැවතීම, කථා බහ කිරීම, ගමන- බිමන, ගොඩනැගිලි හා උපකරණ පරිහරණය යනාදි කරුණු සම්බන්ධයෙන් පිළිපැදිය යුතු චාරිත්‍ර ධර්ම රාශියක් විස්තර කෙරේ. කෙනකු තව කෙනකුට හෝ දේකට හානිකර පුද්ගලයකු නොවීමත්, නොපැහැදුනවුන්ගේ පැහැදීම පිණිස හා පැහැදුන වුන්ගේ ඒ පැහැදීම වැඩි දියුණු වීම පිණිස ක්‍රියා කිරීමත් අපේක්ෂා කර තිබේ. මෙම කරුණු විස්තර කිරීමේ දී දේශනා පාලිය ගුරුකොට ගෙන ඇත්තේ ය.

මතක පිරිකර පවත්නා විධි

මෙම මාතෘකාව යටතේ විස්තර වන්නේ මියගිය අයකු සතු වස්තුව පුවක්ව ඉන්නා භික්ෂූන් වහන්සේනමකට අයත් වන්නේ කවර ආකාරයකට ද යන කරුණයි. මියගිය පුද්ගලයා පස් සඟ ධැමියන්ගෙන් කෙනකු විය හැකිය. එම වස්තුව හෝ දේපළ හැඳින්වීමට යොදා ඇති වචනය

පිරිකර'' යන්නයි. මේ සම්බන්ධයෙන් හෙරණ සිඛ විනිසෙහි දක්වෙන විස්තරය සම්පිණ්ඩනය කරගත්විට , පහත සඳහන් තීරණය එහි ගැප්වී ඇති බව පෙනී යයි.

1. කෙනකු ජීවත් ව සිටිය දී ඔහුසතු යම් දෙයක් යම් කෙනෙකු ගත හොත්, භාණ්ඩ හිමියා, ගත් තැනැත්තාගේ එම ගැනීම අනුමත කිරීමට තරම විශ්වාසයක් පවතීනම්, භාණ්ඩ හිමියා මළ පසු ද, එම දේ ගත හැකිය.

පැහැදිලි කිරීම

''A'' සතු යම් දේපළක් වෙයි. ඔහු ජීවත්ව සිටියදී ''B'' ඒ දේපළ ගතහොත් ''A'' ඊට සතුටු වෙයිද, එතරම් විශ්වාසයක් පවතීනම් ''A'' මිය ගිය පසු ''B'' ට ඒ දේ ගත හැකිය.

2. පස්සභධම්මියන් වෙත, මිතුරකු විසින් පැවරූ වස්තුවක්, ගන්නට පෙර ''ඔවුන්'' මියගියහොත්, එසේ පවරන ලද වස්තුව සඟසතු වේ. (මෙහි ''ඔවුන්'' යනු වස්තුව පැවරූ අයද පවරනු ලැබූ පස්සභ-ධම්මියන්ද යන්න නොපැහැදිලිය. පැවරූ අය ලෙස සැළකීම යෝග්‍යසේ පෙනේ.)

3. කිසියම් භික්ෂුවක්, තව භික්ෂුවක් අමතා ''ඔබට මෙය දෙමි'' කියා හෝ, ''ඔබ මෙය ගන්න'' කියා හෝ කී පමණකින් යම් දේපළක්; පිරිකරක්; එසේ අමතනු ලැබූ භික්ෂූන්වහන්සේට හිමි නොවේ. පැවරූ පුද්ගලයා මිය ගිය හොත්, එම පිරිකර සඟසතු වේ.

4. කිසියම් ගිහියකු විසින් භික්ෂූන් වහන්සේ නමක් අමතා ''අප අයත් දේ ඔබවහන්සේ ගන්න''යි පැවරීමක් කළහොත්, එසේ පැවරීම කළ ගිහියා මළ පසු, එම දේ පවරනු ලැබූ භික්ෂුවට ගත හැකිය.

5. කිසිවකු විසින් ''මා සතු වස්තුව ඔබට දෙමි'' කියා දෙන ලද නම්, එසේ දෙනු ලැබූ තැනැත්තාට ඒ දේ අයත් වේ.

6. කිසිවකුට පැවරීමක් නො කොට, යම් භික්ෂූන් වහන්සේ නමක් මිය ගියහොත්, එම භික්ෂූන් වහන්සේ සතු පෞද්ගලික වස්තුව, දේපළ හිමි භික්ෂූන් වහන්සේගේ අභාවය සිදු වූ සීමාවතුළ වෙසෙන සියලු භික්ෂූන්ට අයත්වේ.

7. කිසියම් විහාරස්ථානයක භික්ෂූන්වහන්සේ දෙනමක් වෙසෙති. කලක දී ඉන් එක් නමක් අපවත්වෙයි. ජීවත් ව සිටින භික්ෂූන්වහන්සේ

විසින්, අපවත් වූ භික්ෂූන්වහන්සේගේ පෞද්ගලික දේපළ කොටස්කර ආගන්තුකයකු පැමිණෙන තුරු සිටිය යුතුය. නොපැමිණියහොත්, එම කොටස ද නේවාසික භික්ෂුව සතු වේ.

8. කිසියම් භික්ෂුනමක් දූරගමනක යෙදී සිටියදී අතරමග මියගියහොත්, උන්වහන්සේ ළඟ පැවති පිරිකර සම්බන්ධයෙන් ඉහත සඳහන් අයුරින් ක්‍රියාකිරීමේ අයිතිය, ඒ අසලම විහාරස්ථානයේ භික්ෂූන් වහන්සේට පැවරී තිබේ.

ගිහි සමාජයේ දේපල උරුමය සම්බන්ධයෙන් ද මීට සමාන ක්‍රමයක් පැවති බව ''වස්තු හිමියා නැසීගිය කල ඔහු ළඟ සිටියා වූ අයට මේ සැම වස්තු අයිතිවෙනවා මිස අහක්ව සිටි අයට එයින් කොට්ඨාශයක් නො ලැබේ''යන සඳහන සැලකිල්ලට ගැනීමෙන් පෙනේ. (නී.නි.54පි.)

භික්ෂු සමාජයේ පැවති අනුප්‍රාප්ති ක්‍රමය, ''මතක පිරිකර'' පවත්නා විධි යන මාතෘකාව යටතේ කළ විස්තරයෙන් වටහා ගත හැකිය. එම ක්‍රමයේ නීත්‍යානුකූල සාධාරණත්වයක් ඇති බව අපට පෙනී යයි. එහෙත් අංක 7 සහ 8 යටතේ දැක්වූ කරුණු වර්තමානයට කොතෙක් දුරට ගැලපේද, යන්න විමසා බැලීම සුදුසුය. ගමන් බිමන් දුෂ්කරව පැවැති අතීතයේ තමාගේම පන්සල කියා පන්සල් හෝ තමාගේ ශිෂ්‍ය කියාම ශිෂ්‍ය පිරිසක් හෝ, නොවූ භික්ෂූන් සම්බන්ධයෙන් මේ කරුණු යටතේ කෙරෙණ විස්තර අනුව ක්‍රියා කිරීම සුදුසු වුවත්, වර්තමානයේ දී නම්, ඒ අනුව ක්‍රියා කිරීම නීත්‍යානුකූල නොවනු ඇත.

ලංකා දණ්ඩනීති සංග්‍රහයේ 387 වගන්තිය යටතේ මිය ගිය කෙනකු ගේ දේපල පරිහරණය සම්බන්ධයෙන් මෙසේ පැනවේ.

> ''යම් තැනැත්තකුගේ මරණය සිදුවන වේලෙහි, ඔහුගේ ස්වාමිත්වයෙහි තිබුණාවූද, ඉන් පසු එහි ස්වාමිත්වයට නීත්‍යානුකූලව බලය ඇති තැනැත් තාගේ ස්වාමිත්වයෙහි නොතිබුණාවූද බව දනිමින් යම් දේපළක් යම් තැනැත්තකු වංකලෙස සාවද්‍ය පරිහරණයට ගතහොත් හෝ තමාගේ ප්‍රයෝජනයට ගතහොත්, ඔහුට අවුරුදු තුන දක්වා කාලයක, දෙයාකාර යෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ යුතුයි ඔහු දඩයකටද යටත් විය යුතුය. එකී තැනැත්තා මිය ගිය වේලෙහි ඔහුගේ ලිපිකරුවකු වශයෙන් හෝ සේවකයකු වශයෙන් වරදකරු සේවයෙහි යෙදී සිටියහොත් බන්ධනාගාර ගතකිරීම අවුරුදු හත දක්වා වැඩි විය හැකිය''.

ඉහත අංක අට යටතේ පැහැදිලිකර ඇති ආකාරයෙන් යම් දේපළක් සම්බන්ධයෙන් ක්‍රියා කළ හොත්, වර්තමාන නීතිය අනුව සාවද්‍ය පරිහරනය කිරීමේ වරදට වැරදිකරු වීමට ඉඩ තිබේ.

කිසියම් භික්ෂූන් වහන්සේ නමක් සතු දේපළ නොපවරා මියගිය හොත් එම දේපළ විහාරය සන්තක නැතහොත් සාංඝික වන බව හෙරණසිඛ විනිසෙන් ගෙන ඉහතින් කළ පැහැදිලිකිරීමෙන් පෙනී යයි. 1931 අංක 19 දරණ බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනතේ 23 වන වගන්තිය ද මීට අනුකූලව පැනවී ඇති බව පෙනේ.

"උරුමයෙන් තමන්සතු වූ දේපළ හැර, කිසියම් භික්ෂුවක් පෞද්ගලික පරිභෝගය සඳහා රැස්කළ සියලු පෞද්ගලික දේපළ ස්වකීය ජීවිත කාලය තුළ ඒ භික්ෂුව විසින් අන්සතු කොට නොදෙන ලද නම්, ඒ දේපළ ඒ භික්ෂුව සම්බන්ධ වූ විහාරය සන්තක දේපළ ලෙස ගිණිය යුතුය යනු එම වගන්තියයි.

හෙරණ සිඛ විනිසට අනුව තවදුරටත් පැහැදිලි වන කරුණක් නම්, යම් භික්ෂුවක්, තමා සතු දෙයක් තව කෙනෙකුට දෙන බව කී පමණින්, දෙවැන්නාට එම දෙය සම්බන්ධ අයිතිය නොපැවරෙන බවයි. අතීතයේ රෝමයේ පැවතුනේ ද මෙබඳු ක්‍රමයක් බව පෙනේ.[1] රඹුක්වැල්ලේ, සිද්ධාර්ථ හිමියන්ගේ මුදලය සම්බන්ධ නඩු තීන්දුව අනුව පෙනී යන්නේද හෙරණ සිඛ විනිසෙහි තීරණයට සමාන තීරණයක් දී ඇති බවයි. එහි පැවරීම සිදු කර ඇතත්, අන්සතු කර පැවරීමක් සිදු කර නොතිබූ හෙයින්, එම පැවරීම, වලංගු ලෙස නොපිළිගන්නා ලදී.[2]

කිසියම් භාණ්ඩයක හිමියා අතිශයින් විශ්වාස වන්ත නම්, ඔහු සතු යම් දෙයක් ගත්විට සතුටු වේ නම්, පැවරීමක් නොමැති වුවද, ඒ දේ ගත හැකිය.

"පරාගැති විස්වසින් ගන්නා කලැ දුටුවිරූ මිතුරන් ගැතිවත් ඔවුන් නොමළහොත් ගන්නා කලැ සතුටුවත් ගත යුත්තේය................දන ලක්ෂණයෙන් නුදුන් පිරිකර පළමු කී කලැ සෙයින් දයකයන් කෙරෙහි විස්වසින් ගත යුත්තේය..........."

මරණාසන්න වූවන් විසින්, තමා සතු දේපළ ළඟ හිතවතුන්ට පවරා දීමේ සිරිතක් අතීතයේ පැවැති බව ඉහත සඳහන් කරුණුවලින් අනාවරණය වේ. මේ ක්‍රමය පෙරදිග පමණක් නොව අපරදිග ද පැවැත් බව සිතිය හැකිය රෝම නීතියට අයත්, "ඩොනාටියෝ මෝර්ටි කව්සා"[3] මේ හා සැසඳිය. හැකිය.

සංඝ සමාජයේ පැවැති යම් යම් විනය හා විනය ප්‍රඥප්ති රාජ නීතිය හා සැසඳීමට උත්සාහ දරණ ලද්දේ හේතු දෙකක් ඇතිවය. පළමු වැන්න

---

බලන්න 1. රෝ. නී. 56, 57, 65 පිටු ජයතිස්ස ද කොස්තා
2. විහාර නීති විත්තිය – ප්‍රින්ස් ගුණසේකර – 56, 57 පිටු
3. රෝ. නී 37 පි.

නම්, සෙසු සියලු කරුණු සම්බන්ධයෙන් මෙන්ම, නීතිය සම්බන්ධයෙන් ද තථාගතයන් වහන්සේ තුළ පැවැති විශාරදත්ත්වයත්, පසුකාලීන විනයධර මහතෙරවරුන්, එම විනය අර්ථකථනය කිරීමේදී දක්වා ඇති නෛතික ඥනයත් ගරු කොට සැළකීමයි.

දෙවැන්න නම්, සංඝාධිකරණයක් සම්බන්ධයෙන් අදහස් දක්වෙන මේ අවස්ථාවේ, විනයට අනුකූලව නීති පද්ධතියක් ඇතිකර ගැනීම අපහසු නොවන බවට අවධානය යොමු කිරීමයි.

එක් අයකුගේ හැසිරීම තව කෙනකුට කරදරයක් නොවන පරිදි සිදු කිරීමේ වැදගත්කම බුදු දහමේ නොයෙක් තැන විස්තරවේයි. මෙම, කෘතියේ ද ඊට අදාළ සිරිත් - විරිත් රැසක් දක්වේ.

දෙර, බිත්ති ආදියෙන් ආවරණය වූ කිළියක් තුළට ඇතුළු වීමට පෙර, ඒ තුළ සිටින්නාට දැන ගත හැකි වන පරිදි කිසියම් සංඥවක් කිරීම උසස් සිරිතකි. මෙම සිරිත පිළි පැදිය යුතු ස්ථාන අතර වැසිකිළිය හා කැසිකිළිය ද විශේෂ තැනක් ගනී. එම කිළියකට ඇතුළුවීමට පෙර, උගුර පාද, දෙරට තට්ටුකර, ඒ තුළ කෙනෙකු ඇති නැති බව, ප්‍රත්‍යක්ෂකර ගත යුතුය. ඇතුළේ සිටින තැනැත්තා ද තමන් සිටින බව අඟවන්නේ උගුර පෑදීමෙනි. ''උකසි පැහැර'' (උගුර පාද) (උක්කාසිත්වා (පාලි) යන්න මේ අවස්ථාවේදී අනුගමනය කළ සංනිවේදන මාධ්‍යයක් වශයෙන් හැඳින්විය හැකිය.

වුඩ්ඪපටිපාටිය :

මෙයින් කියැවෙන්නේ වැඩිමහළු පිළිවෙලයි. මෙම සිරිත පැවිදි-සමාජයේ පමණක් නොව ගිහි සමාජයේ ද පැවතියේ ය. අතීතයේ ප්‍රමුඛත්, වය ලැබුණේ බලවතාට හෝ ධනවතාට නොව වෘද්ධයාටයි. ගමන් කිරීම ඉඳගැනීම ආදී අවස්ථාවලදී මේ ක්‍රමය ක්‍රියාත්මක විය.

වුඩ්ඪපටිපාටියේ ප්‍රභේද තුනකි.

1. උපසම්පද භික්ෂූන්ගේ වුඩ්ඪපටිපාටිය

උපසම්පද භික්ෂූන් අතරින් ප්‍රමුඛත්වය ලැබිය යුත්තේ වස් ගණන් අනුවයි. පළමුවෙන් උපසම්පද වූ භික්ෂුවට මුල් තැන හිමිවේ. එකම දිනයේ උපසම්පද වූ කීප නමක් වෙතොත්, විනාඩියක පමණ කාලයකින් හෝ කලින් උපසම්පද වූ තැනැත්තාට මුල් තැන හිමි විය යුතුය.

2. සාමණේර භික්ෂූන්ගේ වුඩ්ඪපටිපාටිය

මෙය ගැණෙන්නේ පැවිදි වූ දිනය පැය විනාඩිය අනුවයි. ගමන, ඉඳීම ආදී අවස්ථාවල දී අඩුම වස් ගණන ඇති උපසම්පද භික්ෂූන්

වහන්සේ ළඟට, පැවිද්දෙන් හැමටම වැඩි මහළු සාමණේර නම එක් විය යුතුය. අගටම එක් වන්නේ පැවිද්දෙන් නොබෝ කල් ඇති සාමණේරයන් වහන්සේය.

3. ගිහි සමාජයේ වුඩපටිපාටිය

අතීතයේ දී ගිහිසමාජයේ ද වැඩි මහළු පිළිවෙල අනුව ගමන බිමන ආදී ක්‍රියා සිදු විය. එක පවුලේ කුමාරවරුන් රජකමට පත් වීමේ දී පවා අතීතයේ දී මේ ක්‍රමය ක්‍රියාත්මක කැරිණි. මහියංගනයේ සිට අනුරාධපුරයට ගමන් ගත් සංඝතිස්ස, සංඝබෝධි, ගොඨාභය යන කුමාරවරුන් ගමන් කළෙත් රජවූයේත් මේ පිළිවෙල අනුවයි. මෙම ආයර්‍ය සිරිත ලංකාවේ පමණක් නොව ලෝකයේ නොයෙක් රටවල අතීතයේ පැවැති බවට ඉතා වැදගත් සිහිවටනයකි, මේ වනතුරුම එංගලන්තයේ කිරීටයේ අයිතිය හිමිවන ආකාරය. කෙසේ වුවද ගිහි සමාජයෙන් සම්පූර්ණයෙන්ම වාගේ අතුරු දහන් වී ඇති මේ සිරිත භික්ෂු සමාජයෙන් ද දූන් අතුරු දහන් වෙමින් පැවතීම සංවේග ජනකය.

ආගත පටිපාටිය

මෙයින් කියැවෙන්නේ පැමිණි පිළිවෙලයි. ස්ථාන දෙකක දී වුඩ පටිපාටියට වඩා, ආගත පටිපාටිය බලවත් වෙයි. එනම් වච්චකුටිය හා ස්නානස්ථානය. එම ස්ථාන දෙකේ දී පළමුවෙන් පැමිණි තැනැත්තාට පළමු වාරය හිමිය.

ගිහිගෙයි පිළිවෙල (කුලගම් එළඹීම)

කුලගම් වශයෙන් මෙහි දක්වා ඇත්තේ පිණ්ඩපාතය පිරිනමන දයක ගමයි. එහි ගමන් කළ යුත්තේ ඉතා සංවරවය. තෙමඩුලු වසා අඳනය ඇඳ කාබඳන් බැඳ සහල සිවුර පෙරවැ වැඩිය යුතු බව දැක්වේ. තුන් සිවුරම පෙරවීමේ සිරිතක් නොතිබිණි. අත පය නොසලා, ''කර ඉදිකොට ඉස ඉදූවා'' ගමන් කළ යුතුය. බෙල්ල නමාගෙන, කොන්ද වකුටුකරගෙන ඉඳීම -සිටීම - ගමන - බිමන - අනුමත නොකරන ලදී.

කුලගම් එළඹීමේ දී අනුදූන ඇත්තේ, අද පවතින උභයාංශ හෝ ඒකාංශ පාරුපන ක්‍රමය නොවේ. ඇතැම් භික්ෂූන් වහන්සේ ආචාර සමාචාර පැවැත්වීමේ දී වම් උරය වැසෙන සේ පොරවන ඒකාංශ පාරුපන ක්‍රමය මෙහි දී ක්‍රියාත්මක වූ සේ සිතිය හැකිය. ''හිසින් වටා නො පෙරෙවැ'' ''අතින් හෝසිවුරෙන් අකවවූ නොගන්වා'' දයක නිවසේ වාඩි විය යුතු බව දැක්වේ.

''.........බික අළහොත්, වමතින් සහල සිවුර පටලා සිටියන් පහකොටැ දෝතින් බික සිහන පයගෙනැ බික ගෙනැ.........'' වමතින් සිවුරු පටගෙන

පාමුවැවට වසා.........'' යන විස්තරවලට අනුව පිඩු සිඟා වඩින විට සිවුර පෙරෙව් ආකාරය සිතා ගත හැකිය. වමතින් සිවුරු පට ගෙන පාත්‍රයේ කට වැසීමට හැකි වන්නේ කලින් දක්වූ පරිදි, ඇතැම් භික්ෂූන් වහන්සේ විශේෂ අවස්ථාවල දී පොරවන ඒකාංශක්‍රමයෙනි. වර්තමානයේ වැඩි වශයෙන් පවතින ඒකාංශ-උභයාංශ පාරුපනයෙන් එසේ පාත්‍රය වැසිය නොහැකිය. දයක නිවසේදී දානය වැළඳීමට හිඳගත්තේ ද එලෙසිනි. සිවුර අකවටුගන්වා ඉඳගැනීම වළකා ඇති බව ද පැහැදිලිය.

## ආගන්තුක සත්කාරය

මේ කරුණටද ආර්‍ය්‍ය සමාජයේ ලැබුණේ උසස් තැනයි. භික්ෂු සමාජයේද ඊට උසස් තැනක් හිමි විය. ආගන්තුකයා යනු අන්‍ය තැනක සිට පැමිණි තැනැත්තාය. භික්ෂූන්වහන්සේ දතයුතු හා පිළිපැදිය යුතු ''වත්'' අතර, ආගන්තුක වත ද එකකි. මෙම වතාවත පහත සඳහන් පරිදි කොටස්කර දක්විය හැකිය.

1. පෙර ගමන් නොට පා සිවුරු පිළිගෙන තැන්පත් කොට තැබීම. (තුන් සිවුරම පොරවා ගෙන ගියේ නම් සිවුරු පිළිගැනීමක් ගැන සඳහන් නොවන්නට ඉඩතිබුණි).
2. හිඳිනා අසුන් පනවා දහය නිවීම (පවන් සැලීම ආදී ක්‍රමවලින්)
3. පාදෝනා දිය, පාදපීඨ, පාදකඨලිකා තැබීම.
4. ආගන්තුකයා කැමති නම් සම්බාහනාකිරීම (අත්පා මැඩීම)
5. පිපාසය ඇතොත් පැන් පිළිගැන්වීම.
6. පයේ තෙල් ගැල්වීම
7. සෙනසුන සම්බන්ධයෙන් ආගන්තුකයා දැනගත යුතු තොරතුරු කියා දීම.

(උදා : වතාවත්කරනවේලාවන්, වැසිකිළි කැසිකිළි තිබෙන තැන්, පිඩු සිඟා යන්නට සුදුසු තැන්, විහාරස්ථානයේ පැවැත්මට කතිකාවත් ආදිය ඇතොත් ඒවා.)

''තමා හළ දෙරින් වන් ආගන්තුකයන් අත් රැකැ...........'' යන වැකියක් හෙරණසිඛ විනිසෙහි එයි.

මෙහි ''අත්රැක'' යන්නට දිය හැකි යෝග්‍ය අදහස සේ පෙනියන්නේ ''ආගන්තුක භික්ෂුවගේ ජීවිතය ආරක්ෂා කර '' යන්නයි ආගන්තුකයකු පැමිණිවිට ඔහුගේ ජීවිතය හා දේපළ ආරක්ෂා වන පරිදි ක්‍රියාකිරීම නේවාසිකයාගේ යුතුකමකි. මීට වෙනස් අදහස් ද ඇතැම් උගතුන් මේ පදයටදී තිබේ.

## නිශ්ශබ්දතාව

ආරාමික නිශ්ශබ්දතාව, බුද්ධකාලයේ සිටම, උසස් ලෙස සැලකුණු ගුණාංගයකි. බුදුරජාණන් වහන්සේ ධම්-සභා මණ්ඩපයට වඩින විට සියලුම භික්ෂූන් වහන්සේ නිශ්ශබ්ද වීම එකල සාමාන්‍ය කරුණක් විය. බුද්ධශ්‍රාවකයන්ගේ මෙම ගුණාංගය සෙසු පැවිද්දකුගේ ද පැසසුමට ලක් විය.

බුදුරජාණන් වහන්සේ කොසැඹෑනුවර වැඩ සිටියදී, දිනක් අනඳ තෙරණුවෝ භික්ෂූන්වහන්සේ බොහෝ දෙනෙකුන් ද කැටිව, සන්දක පිරිවැජියාගේ අසපුවට වැඩියහ. අනඳ තෙරණුවන් ඇතුළු භික්ෂු පිරිස එඩිනු දුටු සන්දක පිරිවැජියා සිය පිරිසට මෙසේ පවසයි.

"භවත්නි, නිශ්ශබ්ද වෙන්න, ශබ්ද කරන්න එපා, ශ්‍රමණ ගෞතමයන්ගේ ශ්‍රාවක ආනන්දයන් පැමිණෙනවා............ ආයුෂ්මත් හු නිහඬබව කැමතිය. නිහඬවූ බුදුන් විසින් විනීතයි, නිහඬ තැන ගුණ කියනවා. නිහඬ පිරිස ඇතිතැනටයි පැමිණෙන්න කැමැති."1

එක් කලෙක බුදු රජානන් වහන්සේ එක් දහස් දෙසිය පණහක් පමණ භික්ෂූන් වහන්සේ ද සමඟ, රජගහනුවර, ජීවක අඹ උයනේ වැඩ සිටිය දී ජීවක වෛද්‍යවරයා සමඟ අජාසත් රජ එහි පැමිණියේය. මෙතරම් පිරිසක් වෙසෙන තැනක පැවැති නිහැඬියාව රජුගේ පුදුමයටත්, බලවත් සතුටටත් හේතු විය. ඔහු කොතරම් සතුටු වූයේ ද කියතොත් තම පුත් උදයිභද්ද කුමරුට ද එබඳු සන්සිඳීමක් ලැබෙන්නේනම් හොඳ බව හේ පැවසීය.2

ලාංකික භික්ෂු සමාජය ද මේ නිහඬ බව අගය කරණ ලදී. හෙරණ සික විනිසෙහි කීපතැනකම මෙ ගැන සිහිපත් කර තිබේ. වැළඳීම, පිඬු සිඟීම, අත්පස් කිස පැවැත්වීම, පාඩම් කිරීම, ආදී හැම අවස්ථාවක දීම තම ක්‍රියාව සෙස්සන්ට බාධාවක් වනසේ ශබ්ද නොකර සිදු කළ යුතු බවට උපදෙස් දෙයි.

## සඟසතු දේපල ආරක්ෂා කිරීම

සඟසතු දේ කිසිම පුද්ගලයකු ට අයත් දේපලක් නොවේ. ඒවා පෞද්ගලික කොට දීම හා ගැනීම ද බලවත් වරදකි. ගරු භාණ්ඩ සංඛ්‍යාවට ගැණෙන සඟසතු දේපළ සම්බන්ධයෙන් මේ නියමය විශේෂයි. ගරුභාණ්ඩ කොටස් පහකට වර්ග කර තිබේ.

1. සඟසතු ආරාම හා ආරාම කිරීමට සුදුසු බිම්.
2. වෙහෙර හා වෙහෙර කරන්නට යෝග්‍ය බිම්.
3. ඇඳ-පුටු-කොට්ට-මෙට්ට ආදිය.

---

1. සන්දක සූ.- ම. නි. 2, 3, 6
2. සාමඤ්ඤ ඵලසූ - දී. නි.

4. ලෝහ භාජන කෙටේරි වෑ පොරෝ උදළු නියන් ආදිය.
5. වේවැල් ආදී වැල් වර්ග රණඋණ ගේ සෙවිලි කිරීමේ තෘණවර්ග මැටිමුවා හා දැව මුවා පිරිකර.

සාසනික අයිතිවාසිකම් අතර, උසස්ම තැන හිමිවන්නේ සාංඝික අයිතියටයි. සඟසතු දෙයක් බෝධිය දාගැබ ආදී තැනකට පිදීම පවා වළක්වා තිබේ.

සඟසතු දේපළ තාවුරුවත්, නොතාවුරුවත් යනුවෙන් දෙකොටසකට බෙද දක්වා තිබේ. මේ අතරෙන් තාවුරු වත් යනුවෙන් සැලකෙන්නේ තැනින් තැනට ගෙනයාමට අපහසු ස්ථානීය ප්‍රයෝජනයට ගැණෙන, දේපළ බව සිතීමට ඉඩ තිබේ. නීතියේ නිශ්චල ගණයේ සැළකෙන දේත්. චංචල ගණයේ ලා සැළකෙන සමහර දේත්, තාවුරුවත් සංඛ්‍යාවට අයත් ය, මේ සංඛ්‍යාවට ගැණෙන දෙයක් කෙනෙකුට දීම හෝ පෞද්ගලික අයිතිය යටතට ගැණීම කරනොත් එම භාණ්ඩයට වඩා වටිනා දේපළක් සඟසතු කොට දිය යුතුය.

සිවුරු ආහාර, ගිලන්පස යන තුන්පසයට අයත් පිරිකර නොතහවුරුවත් සංඛ්‍යාවෙහිලා සළකා තිබේ. එම තුන්පසය විහාරස්ථානයට පැමිණෙන සියළු දෙනා වහන්සේ සමයේ බෙද ගත යුතුය. සමසේ සියලුදෙනාට බෙදීමට ප්‍රමාණවත් නොවේ නම ලැබෙන පරිදි වාරයෙන් වාරය බෙදිය යුතුය. සඟසතු දේපළක් සඳහා වියිවිධාන කිරීම කිසිදු වරදක් නැති බවද අවධාරනාය කර තිබේ.

## ගුරු ශිෂ්‍ය සම්බන්ධතා

ආචාර්‍ය්‍ය විනයෙහි ගුරු-ශිෂ්‍ය සම්බන්ධතාවට ලැබෙන්නේ ඉතා උසස් තැනකි. පියා හා පුතා අතර පැවතිය යුතු සෙනෙහස, ගුරුවරයා හා ශිෂ්‍යයා අතරද, පැවැතිය යුතු බව විනයෙහි ඉගැන්වේ. හෙරණසිඛයෙහි ''වත්හෙරුත්'' යනුවෙන් සඳහන්ව ඇත්තේ ආචාර්‍ය්‍යයන් වහන්සේය.

ශිෂ්‍යයා යන තේරුමෙන් විනයෙහි යෙදී ඇත්තේ අන්තෙවාසික (අතැවැසි (සිං) යන පදයයි. එහි තේරුම ''ළඟින් ඉන්නා'' යන්නයි. ගුරු-වරයා හා ශිෂ්‍යයා අතර නිතරම ළඟ ඇසුරක් පැවැතිය යුතු බව මේ පදයෙන් වුවද ඇඟවෙයි. අතවැසියා හෙවත් ශිෂ්‍යයා යන තේරුමින් සාහිත්‍යයේ යෙදුණු නවපදයකි ''කිංකර'' යන්න. ''කුමක්කරම්දැයි පිළිවිස කරනුයේ කිංකර'' යනුවෙන් එම පදය විග්‍රහකර තිබේ. හෙරණ සිඛ විනිසෙහි ''මහළු සබ්‍රම්සරුන් කෙරෙහි පවත්නා විධි'' යන සිරස්තලය යටතේ කෙරෙන විස්තරයෙන් කිංකර පදයට දී ඇති තේරුමෙහි නිරවද්‍යතාව

1. බලන්න නිඝි නියන්ඩුව 13-14 පි.

ලෙගාවින් තහවුරු වේ.'' දෙර වැසීම - දෙර ඇරීම, පහන් නිවීම දැල්වීම, ආදී කටයුතු වල දී මහළු සබ්‍රම්සරුන් විමසා ඒ කළ යුතු යයි හෙරණුන්ට උපදෙස් දී තිබේ. ගුරුවර වැඩිහිටියන් කෙරෙහි ආදර බහුමානයෙන් යුතුව හැසිරිය යුතුය. ගරුකාර සත්කාර පැවැත්විය යුතුය. යහපත් ගුරුවරයකු ගේ මග පෙන්වීම නොලත්, භික්ෂුව සසුන් කෙතට කීඩෑ උවදුරකි.

ගිලානෝපස්ථානය

ආවාසයක වෙසෙන භික්ෂූන් අතරෙන් කෙනෙකු ගිලන් වුවහොත් ඔහුට උවටැන් කිරීම සෙසු භික්ෂූන් වහන්සේගේ වගකීමකි. ආචාර්ය උපාධ්‍යායන් වහන්සේ නමක් ගිලන් වූ විට, උන්වහන්සේට උවටැන් කිරීමට අතැවැසියාද, ඇතවැසියකු ගිලන් වූ විට, ඔහුට උවටැන් කිරීමට ආචාර්ය උපාධ්‍යායන් වහන්සේ ද බැඳී සිටිති.

උපස්ථායකයා තුළ තිබිය යුතු ගුණාංග පහක් ද, ගිලනා තුළ තිබිය යුතු ගුණාංග පහක් ද මෙහි දැක්වේ.

උපස්ථායකයා තුළ තිබිය යුතු ගුණාංග

(i) ගිලනාට හිත බෙහෙත් පිළියෙල කිරීමේ හැකියාව
(ii) හිත-අහිත ආහාර - පාන දැන, හිත බොජුන් සැපයීම හා අහිතකර බොජුන් ඉවත් කිරීමේ හැකියාව.
(iii) ලාභ / ප්‍රයෝජන අපේක්ෂාවෙන් තොව, මෙත් කුළුණෙන් උවටැන් කිරීම.
(iv) මළ - මූත්‍ර ආදිය ඉවත් කිරීමේ දී පිළිකුල් නොඉපදවීම.
(v) වරින්වර ගිලනාගේ හිත සැනසෙන පරිදි බණ කීමේ හැකියාව.

උපස්ථානයට යෝග්‍ය ගිලනා

(i) සැප වූ ආහාර විහරණාදිය සම්බන්ධ පැවැත්ම.
(ii) සැප වූ ආහාර විහරණාදිය පමණ දැනීම.
(iii) ආහාර විහරණය උණු'ත්රි නොවන පරිදි ක්‍රියා කිරීම.
(iv) උපස්ථායකයාට තමාගේ අසනීප නොසඟවා දැන්වීම.
(v) රෝගය ඉවසීමේ හැකියාව.

# හෙරණ සිඛ.

## නමවු රුවන්තියා

i හෙරණහට දසසිල් ii දසසිඛ iii දස පරිජි iv දසනාසනා v දස දඬුවමවත්

i හෙරණහට දසසිල් නම් කවර ? යත් :—

1 පණිවායෙන් දුරුවීමැ,
2 අයිනාදනින් දුරුවීමැ,
3 අබ්‍රම්සරින් දුරුවීමැ,
4 මුසවායෙන් දුරුවීමැ,
5 රහමෙරින් දුරුවීමැ,
6 විකල්බොජුනෙන් දුරුවීමැ,
7 නටනු ගනු වයනු විසූළු දස්නෙන් දුරුවීමැ,
8 මල්ගඳ විලවුන් ඇඩැරීමෙන් දුරුවීමැ,
9 උසසුන් මහඅස්නෙන් දුරුවීමැ,
10 රන් රිදී මසු කහවණු පිළිගැන්මෙන් දුරුවීමැ,

යන මේ හෙරණහට දසසිල් නම් වෙ—

ii හෙරණහට දසසිඛ නම්, කවර ? යත් :—මෙ දස සිල්මැ හික්මිය යුතු බැවින් දසසිඛ නම් වෙ—

iii හෙරණහට දසපරිජි නම්, කවර ? යත් :—

1 දැන දැන සතක්හු දිවිගැලවුව පරිජි වෙ.
2 දූනැ දූනැ දනා අයත් ද හූ වැලයකුදු සොරසිතින් ගත පරජි වෙ.
3 දූනැ දූනැ තිරිසන් ගිය මාගමක හා ද මෙවුන්ධම් සෙවිය පරිජි වෙ—
4 දූනැ දූනැ සිනාමුසු[1] බසිනුදු මුසවඃ කිව පරිජි වෙ
5 දූනැ දූනැ පිණිබිඳක් සාද රා ටිකක් හුව පරිජි වෙ.
6 බුදුරුවන්හි අයුණු කිව පරිජි වෙ.
7 ධමුරුවන්හි අයුණු කිව පරිජි වෙ.
8 සඟුරුවන්හි අයුණු කිව පරිජි වෙ.
9 පුවතත් මෙහෙණක හා ද මෙවුන්ධම් සෙවිය පරිජි වෙ—
10 අනියත මිසදිට්ගත පරිජි වෙ. යන මෙ හෙරණහට දසපරිජි නම් වෙ—

---

[1] සිනාසු(මැ.වි.) 125 වි

iv හෙරණහට දසනාසනා නම්, කවර ? යත් :—
මෙ දසපරිජිමැ දසනාසනා නම් වෙ—
මෙහි පසෙක් ලිඞග නාසනා යැ. පසෙක් සබ්බ නාසනා යි.

පස්ලිඞග නාසනා නම් කවරය ? යත් :—

1 දනැ දනැ සතක්හු දිවි ගැලවූව;
2 දැනැ දැනැ දනා අයත් දහු වැලයකුදු සොර සිතින් ගත;
3 දනැ දනැ තිරිසත් ගිය මාගමක හා ද මෙවුන් ධම් සෙවිය;
4 දනැ දනැ සිනාසු බසිනිදු මුසවා කිව;
5 දනැ දනැ පිණිබිඳක් සා ද රා වීකක් පුව;

යන මෙ පස[2] ලිඞගනාසනා නම් වෙ—

පස් සබ්බනාසනා නම්, කවර ? යත් :—

1 බුදුරුවන්හි අයුණු කිව,
2 ධමුරුවන්හි අයුණු කිව,
3 සඟුරුවන්හි අයුණු කිව,
4 පුවතත් මෙහෙණක හා ද මෙවුන්ධම් සෙවිය,
5 අනියත මිසදිටු ගත,

යන මෙ පස සබ්බනාසනා නම් වෙ—

v හෙරණහට දස අඩුවම් වත් නම්, කවර ? යත් :—

1 විකල් බොජුන,
2 නටනු ගනු වයනු විසුළු දක්න,
3 මල්ගඳ විලවුන් ඇඩැරීමැ,
4 උසසුන් මහ අස්නෙහි හිඳීමැ,
5 රන් රිදී මසු කහවණු පිළිගැන්මැ,
6 පැවිජ්ජන්[3] ලබන ලාභයෙන් පිරිහෙළීමැ,
7 පැවිජ්ජන්ට[3] උපද්‍රව සඳහා පියෝ කිරීමැ,
8 පැවිජ්ජන්[3] ලග්නා අවසින් නෙරනට පියෝ කිරීමැ,
9 පැවිජ්ජන්ට[3] ආකොසා පරිකොසා බිණීමැ,
10 පැවිජ්ජන්[3] පැවිජ්ජන්[3] කෙරෙහි බිඳුවීමැ, යන මෙ හෙරණ හට දස අඩුවම්වත් නම් වෙ—

මෙහි පසෙක් වැලි අඩුවම්වති, පසෙක් සහරමින් නෙරනා වති—

---

2 මෙපස(නු.පි.)2ළ
3 පැවිද්දන්(නු.පි.)ළම

වැලි දඬුවම්වත් පසනම් කවර ? යත් :—

1 විකල් බොජුන,
2 නටනු ගනු වයනු විසුළු දස්න,
3 මල්ගඳ විලවුන් ඇඩැරිමැ,
4 උසසුන් මහා අස්නෙහි හිඳීමැ,
5 රන් රිදී මසු කහවනු පිළිගැන්මැ,

යන මේ පස වැලිදඬුවම් වත් නම් වෙ—

සහරමින් නෙරනා වත්පස කවර ? යත් :—

1 භික්ඛූනං අලාභය පරිසක්කති,
2 භික්ඛූනං අනත්ථාය පරිසක්කති,
3 භික්ඛූනං අවාසාය පරිසක්කති,
4 භික්ඛූනං අක්කොසති පරිභාසති,
5 භික්ඛූ භික්ඛූනි භෙදෙති.

යන මේ පස සහරමින් නෙරනා වත් නම් වෙ—

හෙරණසිඛ නිමි.

# හෙරණසිඛ විනිස

## නමවූ මුනිසරණ

හෙරණසිඛයෙහි ආදියැ හෙරණයයි දක්වන ලද හෙරණ පැවිද්ද පළමු හැඳිනැ ඔහු විසින් රක්ක යුතු දසසිල් ආදිය දතයුතු බැවින් හෙරණ පැවිද්දට අභව්‍යයෝ ද, හෙරණ පැවිද්දට භව්‍ය වුව ද පිය යුත්තෝ ද, හෙරණ පැවිදි කොටැ වත් පද දෙන්ට නිස්සෝ ද, නිසදෙන්ට නිස්සෝ ද[4] හෙරණ පැවිදි පූර්වයෙහි කළමනා විධි ද, හෙරණ පැවිදි අරණ විධි ද, පළමු දතයුතු වෙයි—

මෙහි හෙරණ පැවිද්දට අභව්‍යයෝ කවරහ ? යත්:—

1. නොමාගම් නොපිරිමිනී නපුංසක පණ්ඩකයෝද,
2. උපක්‍රමයෙන් බිජු හරණලද ඕපක්කමික පණ්ඩකයෝ ද,
3. මේ සඟහු සුව විහාර ඇත්තාහ. සුභෝජන වළඳා මනා සෙනස්නෙහි වාසය කෙරෙති යනාදීන් මහණ වෙස ගැන දූක මුඩුවැ සිවුරු පෙරවැ මහණලිඟු සොරාගත් ලිඞ්ගත්‍ථෙනකයෝ ද,
4. පළමු මහණ ලිඟු සාදනා නොහෙන රජ බියෙන් දිවිරක්නා නිසාසිවුරු පෙරව ද,
5. එසේ මැ දුහැවි[5] සාපියෙන් හැමදෙනා හා සාධාරණ අහර ගෙණැ දිවි පෙවෙත් වැටෙනු නිසා සිවුරු පෙරවැද,
6. කතරමග තරනු නිසා සිවුරු පෙරවැ ද,
7. සොරබියෙන් දිවිරක්නා නිසා සිවුරු පෙරවැ ද,
8. සතුරු බියෙන් දිවි රක්නා නිසා සිවුරු පෙරවැ ද,
9. පසුවැ මෙවෙස් මැනවැයි මහණලිඟු සාදනා කළ කෙණෙහි අභව්‍ය වූ ලිංගත් ථේනකයෝ ද,
10. හෙරණ පැවිදිවැ ගිහිගෙට ගොස් සිවුරු හැරැ නැවත එ සිවුරු වෙහෙරට හැර දෙනු නිසා හැඳ පෙරවැ වෙහෙරට ආ කලැ එපවත් සඟනට නොහඟවා සිවුරු දෙවා නොගෙනැ මහණලිඟු සාදනා කළ කෙණෙහි අභව්‍ය ලිංගත්ථේනකයෝ ද,
11. දුන් කහාගෙනැ ගිහිවියටිවැ කයින් තොරැ කොටැ එපවත් සඟනට සැලනොකොටැ පසුවැ සිවුරු දෙවා ගනිමියි හැඳැ පෙරවැ පසුව එපවත් සඟනට නොකියා මහණලිඟු සාදනාකළ කෙණෙහි අභව්‍ය වූ ලිඞ්ගත්ථේනක යො ද,

---

4 වත්පද දෙන්ට නිස්සෝද, හෙරණ පැවිදි
පූර්වයෙහි කළමනා විධිද, (මැ.පි.) 128 පි

5 දුහැමි (නු.පි.) 3පි

12. නැයන් විසින් සිවුරු හදවා පොරවා අතැතළුපා කබා තෝ ඔහණවයි ගෙන් නෙරනා ලදුව වෙහෙරට අවුදු[6] එ නො වටනාබව් දනැ දනැ එපවත් සඟනට නොහඟවා මහණලිඟු සාදනාකළ කෙණෙහි අභව්‍ය වූ ලිඞ්ගත්ථෙනක යො ද,

13. හෙරණ පැවිදිවැ සිවුරෙහි ආලය පියා කයින් තොර කොටැ පරිජි ඇවැද්ද නොවැද්ද නුදුන් කහාගෙනැ මහණලිඟු සාදනා කළ කෙණෙහි අභව්‍ය වූ ලිඞ්ගත්ථෙනක යො ද,

14. නෙරණ පැවිදිවැ ගිහිවියැටිවැ හන්පෙරෙව් සිවුරු ගිහි පිළිසේ හැඳැ පෙරවැ එවෙස් රුස්වා දක පසුව එපවත් සඟනට නොහඟවා සිවුරු දෙවා නොගෙනැ මහණලිඟු සාදනා කළ කෙණෙහි අභව්‍ය වූ ලිඞ්ගත්ථෙනක යොද,

15. සිබ නොපස්කා සිවුරෙහි ආලය පියා සුදුපිළි හැඳ පෙරවැ පරිජි ඇවැද්ද නොවැද්ද, නුදුන් කහා ගෙනැ මහණලිඟු සාදනා කළ කෙණෙහි අභව්‍ය වූ ලිඞ්ගත්ථෙනක යො ද,

16. සිබ පස්කා එබව් සඟනට නොහඟවා හෙරණ පැවිදිවැ, එබව සඟනට නොහඟවාද පිළිගන්වනු කැප කරනු පොහෝ පවිරුණු කරනු වස් ගණන් කියනු ආදි මහලු පැවිදි කිස කොටැ අභව්‍යවූ සංවාසත්ථෙ-නකයො ද,

17. මෙකී තාක් ප්‍රකාරයෙන් ලිඟු සොරා ගෙනැ, සංවාසද සොරා ගෙනැ අභව්‍ය වූ උභයත්ථෙනකයො ද.

18. උපසම්පන්න වැ තිර්ථකයන් ගත් ලද රුස්වා ගෙනැ දකැ ලිහිණිවැ හිසකෙහෙ උදුරවා මොනරපිල් ගන්වා ද, කුස වැහැරි පුවරුපිළි[7] හැඳැ ජටාබැඳැ තිදඬු කෙණ්ඩිකාද, ගන්නාලද කළ කෙණෙහි අභව්‍ය වූ තිත්ථියපක්ඛන්තකයො ද,

19. තිරච්ඡානයහයි කියනලද නාගමානවකයො ද,

20. ගරුඩ මානවකයො ද,

21. හැම දෙවියො ද,

22. මිනිස් මවුපියන් මව්පිය බැව් දන ද නො දන ද මැරු මාතුඝාතක පිතුඝාතකයො ද,

23. මිනිසත් බව සිටැ පැවිදි වූ ද නුවූ ද රහතුන් මැරු අරහන්ත ඝාතකයො ද,

24. පුවතත් මෙහෙණක හා තුන්මගින් එක්තරා මගකැ මෙවුන්ධම් සෙවී භික්ඛුණී දූසකයො ද,

---

6 අවදු (ත්‍රු.වි.) 49

7 පුවරු පෙළි (මැ. වි.) 130වි

25. යටත්පිරිසෙයින් තමා ඇතුළු නවදෙනෙකු, වසතාවෙහෙර සඟුන් නොදහම්[8] දහමැ දහම් නො දහමැ යනාදීන් ගන්වා බිඳැ සතර දෙනෙකු ගෙනැ එකසිමැ පොහෝ පවුරුණු කළ සංඝභෙදකයො ද,

26. දූහැවී සිතින් බුදුන් සිරුරෙන් ඇටලෙල් මැස්සක බොන පමණ ලේ ඉපද වූ ලොහිතුප්පාදකයො ද,

27. මාගමුන් කෙරෙහි පිරිමිනිකිස කරන පිරිමිනීන් කෙරෙහි මාගම්වැ ගැහැණිකිස කරන උභතොබ්‍යඤ්ජනක යො ද,

මෙතෙකින් හෙරණ පැවිදි,[9] අභව්‍යයො දක්වන ලදහු යි. මෙකී තාක් අභව්‍යයන් නොදූන මහණ කළ ගිහිපිළිහදවා හෙරිය යුත්තෙෝ යැ—

---

## හෙරණ පැවිද්දට භව්‍ය වුවද පියැ[10] යුත්තො කවරහ? යත්:-

1. සිවුරෙන් මුවහ නොවන තැනැ වඩනට නිසි රත්පැ කළුපැ ඇති නියපිටකුදු පමණ කුෂ්ඨ ඇත්තො ද,

2. අතුල් පිටැ පතුල් පිටැ මුහුණැ තොලැ නො වඩනා නියපිටකට කුඩා දිවූ කුෂ්ඨ ඇත්තො ද,

3. ගොයින් පිටුසෙ කොරොස්වැ සුණු වැගිරෙන සිරුරු ඇත්තො ද,

4. සිවුරෙන් මුවහ නොවන තැනැ ඩෙබර ඇටකුදු පමණ ගඩු ඇත්තො ද,

5. අතුල්පිටැ පතුල්පිටැ මුහුණැ තොලැ කී පමණ නොවඩනා ගඩු ඇත්තො ද,

6. පියුම් පෙත්තකැ පැහැ වැති නො පැලෙන ඉසු නොබස්නා කිලාස ඇත්තො ද,

7. සොස යයි කියනලද ක්ෂයරොග ඇත්තො ද,

---

8 නොදහම් (නු. ව.) 48
9 පැවිද්දට (නු.වි.) 48
10 පිරිය (නු.වි.) 58

8. පිළියම් කොටැ මනා නො කොටැ හැකි අප මාරයයි කියනලද පිත් කිපි වූ යකුන් විසින් වූ උන්මාද ඇත්තො ද,

9. රජදරුවන් විසින් තො මහණවයි අනුදන්නා නොලද වැටුමින් සිටි තිරසේවායො ද.

10. ඇමති ආදීහු ද,

11. මිනිසුන් විසින් සැදූහැ නො කරන්නට නිසි ගම් පහරණු ඈ කම් කරන පහළ වූ සොරහු ද,

12. දුනමනා බද්දට කළමනාකමට දහගෙයි හොනා කලැ හැකිලි ආදිය බිඳැ හො වැරැ[1] එයින් මිදී පලා ආ කාරභෙදකයො ද,

13. දුටු තැනකැ මරන්නේ අත්පා සිඳුනේ මෙතෙක් මෙතෙක් දඬ ගන්නේයයි ලියා තබනලද ලිඛිත්කයො ද,

14. දරදීගෙනැ නොදිය හෙතුයෙන් මෙමැ දඩයයි සිපු කැළල ගැට නොවහල් වූවො ද,

15. එකස් කොටැ පෙරෙවි සිවුරෙන් මුවහ නොවන තැනැ එබූ එක් පැ නොවූ ලකුණු ඇත්තො ද,

16. මවුපියන් විසින් ගත් දරදී ඇත්තො ද,

17. අනුන් දස්හු ද,

18. අත් සිඳුනා පා සිඳුනා අත් පා සිඳුනා කන් සිඳුනා නාසා සිඳුනා කන්නාසා සිඳුනා ලදුවො ද,

19. නිය නොපැණෙන සෙ ඇඟිලි සිඳුනා ලදුවො ද,

20. උරෙහි ඇලෙහි පිටැ කුදු ඇත්තො ද,

21. මතු සිරුරු පිරිහුන් ලුහුඹු පා ඇතිජංඝ වාමනකයො ද,

22. දික්පා ඇතිවැ මතු සිරුරු නොපිරිහුන් කටිවාමනකයො ද,

---

1 තිරවැ (නු.වි.) 5

23. දෙකමැ ලුහුඬු වූ උභය වාමනකයො ද,

21. නිය නොපැනෙන සේ සතර මහපට ඇඟිල්ලෙන් එකකුදු සිඳුනාලද අලච්ඡින්නකයො ද,

25. මහ නහරින් එකකුදු සිඳුනාලද කණ්ඩරච්ඡින්නයො ද,

26. වවුල් පියාසෙ බඳැඟිලි ඇත්තො ද,

27. සාඟිලි ඇත්තො ද,

28. සීපද ඇත්තො ද,

29. පිළියම් කොට මනා නොකට හැකි අරිසස් ඇත්තො ද,

30. භගන්දර ඇත්තොද,

31. පිතින් සෙමින් වූ පාපරොග ඇත්තො ද,

32. තමන්ගෙ විරූප භාවයෙන් පිරිස්නස්නා පරිස දූසකයො ද ඔහු කවරහ ? යත් :—

1. අනුන් හිස් පමණ පෙකිණ ඇතිවැ ඉතා උස් වූද,
2. පළමු කී උභයවාමනකයන් වැනි ඉතා මිටිහු ද,
3. දලි කණුවක් සෙ ඉතා කළු ද,
4. මැදි තඹලොසෙ ඉතා සුදු ද,
5. මස් ලේ නැතිවැ ඇට නහර සමින් කළ සිරුරක් වැනි වූයෙ ද,
6. මහා භූතයක්හු වැනි මහත් උදර ඇත්තො ද,
7. පැසක් හිසැ තිබූවා සෙ මහත් හිස් ඇත්තො ද,
8. සිරුරට නොහොබනා කුඩා හිස් ඇත්තො ද,
9. තල් කැනක් සෙ ගැට ඇති හිස් ඇත්තො ද,
10. එහුඩු හිස් ඇත්තො ද,
11. මහත් හුණ පුරුක් වැනි හිස් ඇත්තො ද,
12. කජ් කරුවක් සෙ මැදින් වළ ඇති හිස් ඇත්තො ද,
13. සතර දිශාවෙන් එක් දිශාවකට නැමුණු හිස් අත්තො ද,
14. වණ ඇති හිස් ඇත්තො ද,
15. කුණු හිස් ඇත්තො ද,
16. කැන් කැන් වැනි වූ කෙහෙ ඇති හිස් ඇත්තො ද,

17. තල් හිරි[1] වැනි වැඩි දළ කෙහෙ ඇත්තො ද,
18. ජාතියෙන්මැ නර ඇත්තො ද,
19. ගිනි ඇවිලියාක් වැනි තඹ කෙහෙ ඇත්තො ද,
20. ඇඹරුණු කෙහෙවරළු උඩු බලා හොත් කෙහෙ ඇත්තො ද,
21. හිස කේ හා බඳ බැම ඇත්තො ද,
22. බඳ බැම ඇත්තො ද,
23. ලොම් නැති බැම ඇත්තො ද,
24. වඳුරන් බැම වැනි බැම ඇත්තො ද,
25. ඉතා මහත් ඉතා කුඩා ඇස් ඇත්තො ද,
26. එක් ඇසක් කුඩාවැ එක් ඇසක් මහත්වූවො ද,
27. එක් ඇසිපියක් එබී එක් ඇසිපියක් උස් වූයේ ද,
28. වම රැස ද,
29. ඇතුළුවන් ඇස් ඇත්තො ද,
30. පිටතට නික්මුණු ඇස් ඇත්තො ද,
31. විරූප වූ මහත් කන්පී ඇත්තො ද,
32. මීයන් කන් වැනි කන් ඇත්තො ද,
33. ඉතා කුඩා කන්පී ඇත්තො ද,
34. කන්වැල් මීසක් පී නැත්තො ද,
35. යොනුන් විනා විදිනා[2] කන් ඇත්තො ද,
36. නිත්තෙන් පූයා වැගිරෙන කණී හගන්දර ඇත්තො ද,
37. නිත්තෙන් පූයා වැගිරෙන ඇස්කන් ගඩු[3] ඇත්තො ද,
38. මීයෙහිපැහැ වැනි[4] ඉතා පිඟු ඇස් ඇත්තො ද,
39. ලොම් නැති ඇස් ඇත්තො ද,
40. නිත්තෙන් දිය වැගිරෙන ඇස් ඇත්තො ද,
41. පූප් ඇති ඇස් ඇත්තො ද,
42. විළික්සුණු ඇස් ඇත්තො ද,
43. ඉතා මහත් නාසා ඇත්තො ද,
44. සිපි නැහැ ඇත්තො ද,
45. හැද නාසා ඇත්තො ද,
46. දික්වූ නැහැ ඇත්තො ද,

---

1 හිර වැ නි (මැ .වි.) 184වි
1 තල්හිල ව නි (නු.වි.) 6ව
2 කන්වල් (වි.කි.) 185
2 නොවිදිනා කන් ඇත්තෝද (නු-වි.) 6
3 ගඩුකන් (මැ.වි.) 135වි
4 ''පැහැවනි''මීයෙහි ප යන කොටස ම.වි. සංස්කරණයෙහි නොපෙනේ

47. දිවින් ලෙවිය හැකි ගිරවුන් තුඩු සෙ නැමුණු නාසා ඇත්තො ද,
48. නිත්තෙන්මැ[18] කුණු වැගිරෙන නාසා ඇත්තො ද,
49. මඩුවන් මුවසෙ මහත් මුව ඇත්තෝ ද,
50. මීයෙහි සිදුර කුඩාවූයෙ ද,
51. බුන්මුව ඇත්තො ද,
52. හැදමුව ඇත්තො ද,
53. බදුන් මුව විටිසෙ මහත් තොල් ඇත්තො ද,
54. දත් මුවහ කරන්නට නොපිළිවන් තුනුතොල් ඇත්තො ද,
55. මහත් උඩුතොල් ඇත්තො ද,
56. මහත් යටිතොල් ඇත්තො ද,
57. කෙළ වැගිරෙන තොල් ඇත්තො ද,
58. ඇතුළෙන් රත් පිටතින් සුදු තොල් ඇත්තො ද,
59. කුණුමුව ඇත්තො ද,
60. විරූපවූ මහත් දත් ඇත්තො ද,
61. අසුරන්සෙ පිටතට නිකිමුණු දළ ඇත්තො ද,
62. කුණු දත් ඇත්තො ද,
63. ගෙරිහණුසෙ මහත් හණු ඇත්තො ද,
64. දික් හණු ඇත්තො ද,
65. ඇතුළුවන් හණු ඇත්තො ද,
66. බුන් හණු ඇත්තො ද,
67. වුවමනා වයසැ මාගමුන්සෙ දැළි නැත්තො ද,
68. කොකුන්සෙ දික් කඳට ඇත්තො ද,
69. ඇතුළුවන්නා වැනි ලුහුඩු ගළසර ඇත්තො ද,
70. බුන් උර ඇත්තො ද,
71. බුන්ගළසර ඇත්තො ද,
72. බුන් පිට ඇත්තො ද,
73. කස් බොහො සිරුරු ඇත්තො ද,
74. කණ්ඩුයා බොහො දද ඇති සිරුරු ඇත්තො ද,

මෙසේ පිරිස් නසන විරූප යොද—

33. ලිප් කැටක් වැනි මහත් නිසඳුන් ඇත්තො ද,
34. මහත් කළවෙ ඇත්කො ද,
35. මහත් දණ ඇත්තො ද,
36. එ දණින් එදණ ගැටෙන දණ ඇත්තො ද,

18 නිත්තෙන් මුකුණු වැගිරෙන(මැ.වි.) 1358

37. යමක්සෙ දික් සිහින් කකුල් ඇත්තො ද,

38. මතුබලා නැමුණු යටිබලා නැමුණු මහත් පිඩුමස් ඇත්තො ද,

39. ඉතා දළ පිඩුමස් ඇත්තො ද,

40. ඉතා දික් පතුල් ඇත්තො ද,

41. ඉතා දික් විළුම් ඇත්තො ද,

42. ඇතුළට ඇඹරුණු පිටතට නැමුණු පතුල් ඇත්තො ද,

43. හිඟුරු පෙණ වැනි ගැට ඇති ඇඟිලි ඇත්තො ද,

44. කළු වූ කුණු නිය ඇත්තො ද,

45. එක් ඇසකුදු නවුවො ද,

46. වක් අත් ඇති වක් පා ඇති වක් ඇඟිලි ඇති කුණී ද,

47 ඛඤ්ජ යැයි කියනලද දණනැති, බුන් සිහින් කකුල් ඇති, ඇකුළුණු පතුල් ඇති, පිටිපතුල් මැදින් ඇක්මෙන, පිටිපතුල් අගින් ඇක්මෙන,[19] විළුඹෙන් ඇක්මෙන, පත්ලෙහි පිටතැ ඇලයෙන් ඇක්මෙන, ඇතුළු ඇලයෙන් ඇක්මෙන, සියලු පිටිපත්ලෙන් ඇක්මෙන, ඛඤ්ජක ද,[20]

48. එක් අතක් හෝ පයක් හෝ සිරුරෙන් අර්ධයක් හෝ වියළුණු පක්ඛහතද, ''ඡින්නිරියා පථ'' යැයි කියන ලද පීළු ද,

49. වළඳනා කැලැ තමා පෙරටැ බත්කන කපුටුවන් පළවාපිය නොහෙන පමණ ළදරු ද,

50. තමාගේ සිවුර සිරුරැ රඳාගත නොහෙන පමණ ජරා දුර්වල ද,

51. ජාත්‍යන්ධ ද,

52. සරණ ගමන් ශුඬකොටැ නොකියහෙන මම්මනද,

53. බිහිරුදැයි, මෙතෙකින් හෙරණ පැවිද්දට භව්‍ය වුවද පිය[21] යුත්තෝද දක්වන ලදහු. මෙකී තාක්දෙනා නොදැන මහණ කළ පැවිජි අරයි. කළාහට වනාහි ආපත්තිවෙ—

## හෙරණ පැවිදිකොට වත්පද දෙන්ට නිස්සෝද නිස දෙන්ට නිස්සෝද කවරහ? යත්:—

දසවසක් ඇතිවැ පිරිස් අභිවිනයෙහි හික්මවනු සඳහා පරිජි පවිත් දෙපොත හුදකලාවැ හෝ එක් කෙනෙකුන් හා සමඟ හෝ දෙදෙනෙකු හා සමඟ හෝ පිරිවහන්නට නිසිවූ අපලොකනකර්මයැ ඥප්ති කර්මයැ ඥප්ති විතිය කර්මය ඥප්ති චතුර්ථිකර්මයැ යන කමා'කම් විනිසද කඳුවතුදු උගත් කෙනෙක් පිරිස් අභිධර්මයෙහි හික්මවනු සඳහා දික්සඟිය මහවග හෝ මැදුමසඟියැ මුල්පනස හෝ සංයුත් සඟියැ සියභාවඟ නිදන්වග කඳුවග

---

19 අ ග්මෙන (මැ.වි.) 137පි
20 ඛඤජකද (නු.වි.) 7පි
21 පිරිය (නු.වි.) 7විට

හෝ නොහොත් සංයුත්සඟියැ මහවඟ හෝ අඞගොත්තර සඟියැ පූර්වාර්ධය හෝ අපරාර්ධය හෝ, නොහොත් එක ද්වි ත්‍රික නොහොත්[22] චතුෂ්කය හෝ පචකය හෝ කුදුගත් සඟියැ අටුවා හා සමඟ දපාය ධම්පියා හෝ උගත් කෙනෙක් කැමැති කැමැති දිශාවට යන්ට නිසිවැ, ගිය ගිය දෙසෙහි නායකවන්ට නිසිවූ කෙනෙක් පරිසුපට්ඨාපක නම් වෙත්. මෙසේ වූ කෙනෙක් හෙරණ පැවිදි කොටැ වත්පද දෙන්ටද නිසදෙන්ට ද[23] නිසිවෙත්—

## හෙරණපැවිදි පූර්වයෙහි කළමනා විධි කවර? යත්:—

පළමු කී අගුණාඞගයෙන් තොරවූ ගුණා'ඞගයෙන් යුත් මහ පිනැ'තියක්හු මහණ වියටිවැ ආකල ධැමෙන් සෙමෙන් උපදනා පස ලබනසේද සිහිල් කැමත හුණු ලැබෙනසේ ද හුණු කැමැක සිහිල් ලැබෙනසේ ද දිවිහිමියෙන් හුදකලාවැ හිදිනා හෝනා එක්වේලේ වළදනු බ්‍රම්සරවස් රක්නට උගහටසේද පළමු ම හට කියා මේ හැම කිසිවක් සේ නොහැහැ නිවන් සඳහා මහණ වීමෙහි උත්සාහ ඇති බව හැහවූ කලැ කුළුණු නුවණ සැදැහැයෙන් යුත් මහපිනැ'තියෙක් වී නම් පළමු මවුපියන් අනුදන්වාගෙනැ රෝගී වීනම් උපශම කටහැකි තාක් රෝගයට පිළියම් කරවා මනා කොටැ හිස කෙහෙ දැහැඟුලෙන් දික්වී නම් මහලු පැවිදි සඟුන් කෙහෙ බැහැවූව මනාවීනම් සිමැ ඇති තාක් සඟුන් රැස්කොට පැවිජි කැමැත්තහු එපිරිසට හැරැ; "සඞ්ඝං භන්තෙ! ඉමස්ස දරකස්ස භණ්ඩුකම්මං ආපුච්ඡාමි" යි මෙසේ අපලොකන කර්මයෙන් කෙහෙ බහවන්නට සඟුන් අනුදන්වා ගෙනැ එසේ නොපිළිවන් වීනම් අනුපසම්පන්න කෙනෙකුන් ලවා කෙහෙ බහවා මහලු පැවිදි සඟුන්මැ කෙහෙ බැහැවූව මනාවීනම් පිටිසිම ට හැරැ කෙහෙ බහවා ගොමසුන්නෙන් ගඳසුන්නෙන් උලා ගිහි ගඳ හැරැ නහවා ඉක්බිති ඔහු වත්තෙරුන් වැඳැ සිවුරු අතින් ගෙනැ නතුවැ සිටැ; සචදුක් නිසරණු නිවන් දහම් පසක් කරනු සඳහා මෙකහා ගෙනැ මා මහණ කරව දහපා!" යි කීකලැ ඔහු අතින් සිවුරු ගෙනැ නැවතැ ඔහු විසින්මැ; "සචදුක් නිසරණු

22 "එක ද්වික ත්‍රික නොහොත්" යන කොටස මැ.වි. සංස්කරණයේ නොපෙනේ
23. නිවැසි (මැ. වි.) 139 පි
24 වත්පද දෙන්ට නිසිවෙත් (මැ.වි.) 139

**නිවන් දහම් පසක් කරනු සඳහා තෙල කහාදීමා මහණ කරව් දහපා!"යි** ආරාධනා කොටැ සිවුරු ඉල්වූ කලැ ඔහු අතැ තබා මේ නියායෙන් තුන්විටෙකැ ඕලවා අරාධනා කරවැ[25] තුන්විටෙකැ සිවුරැදී සිවුරු හැදැ එකස්කොටැ පෙරවි කලැ වත්තෙරුන් පා වඳවා උත්කුටුකයෙන්[26] හිඳුවා දෙහොත් මුඳුනෝ කැරවුව මැනවි.

මෙතෙකින් හෙරණ පැවිජි පූර්වයෙහි කළමනා විධි දක්වන ලදී

---

**හෙරණපැවිජි අරනවිධි කීසේයැ ? යත්;—**

මෙකී සෙයින් හෙරණපැවිදි කැමැතිවැ හුන්කලැ වත් තෙරුන් විසින් ඔහු බඳදිලි ගන්වා මෙසේ[27] කියැයුතු.

1 "**බුඩම් සරණම් ගචඡාමි**
**ධම්මම් සරණම් ගචඡාමි**
**සඞසම් සරණම් ගචඡාමි**

2 **දුතියම්පි බුඩම් සරණම් ගචඡාමි**
**දුතියම්පි ධම්මම් සරණම් ගචඡාමි**
**දුතියම්පි සඞසම් සරණම් ගචඡාමි.**

3 **තතියම්පි බුඩම සරණම් ගචඡාමි**
**තතියම්පි ධම්මම් සරණම් ගචඡාමි**
**තතියම්පි සඞසම් සරණම් ගචඡාමි.**

1 **බුඩං සරණං ගචඡාමි**
**ධම්මං සරණං ගචඡාමි**
**සඞසං සරණං ගචඡාමි**

2 **දුතියම්පි බුඩං සරණං ගචඡාමි**
**දුතියම්පි ධම්මං සරණං ගචඡාමි**
**දුතියම්පි සඞසං සරණං ගචඡාමි**

3 **තතියම්පි බුඩං සරණං ගචඡාමි**
**තතියම්පි ධමමං සරණං ගචඡාමි**
**තතියම්පි සඞසං සරණං ගචඡාමි."**

---

25 කරවා (නු.වි.) 98
26 උත්කුටකතේණ (නු. වි.) 98
27 ඇඟිලි ගෙන (නු.වි.) 98

මෙසේ සරණගමන් කරවන වත්තෙරුන් විසින් එකී එකී සරණ මකාරාන්ත කොටැ තුන්තුන්විටැ නොපිරි හෙලා උච්චාරණ ශුද්ධකොටැ පළමු සරණගමන් කැරවිය යුත්තේය. ඉක්බිති නිග්ගහීතාන්ත කොටැ පද වෙන වෙන. නොතෝරා එක් කොටැ සරණ ගමන් කැරුවිය යුත්තේ ය. හෙරණ පැවිජි කැමැත් තහු විසිනුදු නොපිරිහෙලා උච්චාරණ ශුද්ධකොටැ සරණ ගමන් කටයුත්තේයැ. මෙතෙකින් හෙරණ පැවිජි අරයි. වත්තෙරුන් විසින් හෝ හෙරණ පැවිදි කැමැත්තහු විසින් හෝ ශුද්ධකොටැ උච්චාරණ නොකොටගුන පැවිද්ද නො අරා. හෙරණපැවිද්දන් ගේ සරණගමන් මහලු පැවිදි කරන කම් වදන්හා සමයැ, ඒ ඇදුරුතෙරුන් ශුද්ධකොටැ කම්වදන් කිය වත් මැ අරයි. මෙවනාහි දෙදෙහමැ ශුද්ධකොටැ උච්-චාරණ කළහොත් අරා. යම්සේ මහලු පැවිද්දන්ට කම්වදන් ශුද්ධකොටැ කියවීමෙන් පැවිජි අරත්මැ මහලු පැවිදිවැ රැක්කමනාතාක් සංවර සමාදන් වූවාමැ වෙත් ද එසේ මැ සරණ ගමනයෙන්මැ හෙරණ පැවිජි අරත්මැ තමන් විසින් රැක්ක යුතු සියලුදැ සමාදන්වූවාමැ වෙත්. එතකුදුවූවත් සමා දන් කරවිය යුතු වෙත්. මෙතෙකින් හෙරණ පැවිජි අරනවිධි දක්වනලදී.

---

දූත් වනාහි **හෙරණසිඛයෙහි විනිස** කියනු ලැබේ. "

"**හෙරණහට**" ය යු සේ යි,[28] මෙකී සෙයින් හෙරණ පැවිදි වූවාහටයයි යු සේයි. මෙහි දස සිල් දසසිඛ දසපරිජි දසනාසනා "**දසදඬුවම්වත්**" යි උදෙස් විසින් පසක් දක්වා එහි විභාග දක්වනුවෝ "**හෙරණ හට දසසිල් නම් කවර ?යත්**" යි ප්‍රශ්න කළෝ[29] එහි සීල යු සේයැ තමා රක්නාහුගෙ තුන් දෙරින් සිඬවන අකුසලුන් දුරුකොටැ සිත් සතන්හි හිඳවී[30]මෙකැ මතුමතුයෙහි ලැබියයුතු ලොව් ලොවතුරා දහමට පිහිටෙකැ යු සේයි. "**පණිවා**" නම් සතුන් මැරීමැ. "**දුරුවීම**" නම් විරතින් පිටත් අනෙකක් නොවන බැවින් මැරියයුතු සතුන් කෙරෙන් හැකිළ ඔවුන් නොමඩනා සැබවිවූ සැදැහැ හිරි ඔතප්[31] අපිස් ගුණ පිහිට කොටැ ඇති පව් කිරීමට පිටිපානාක්හු වැනි සමකමත් **සැපියුතු**[32] කුසල් සිත යුසේයි. "**අයිනාදන්**" නම් නුදුන්නා ගැන්මැ "**දුරුවීම**" නම් විරතින් පිටත් අනෙකක් නොවන බැවින් ගතයුතු වතින් හැකිළැ එවත නොමඩනා සැබැවිවූ සැදැහැ හිරි ඔතප් අපිස් ගුණ පිහිට කොටැ ඇති පව්කිරීමට පිටිපානාක්හු වැනි සමකමක් සැපියුතු කුසල් සිත යු සේයි.

---

28 යුසේය (නු.පි.) 10පි
29 කළෝ (නු.පි.) 10පි
30 සිත් සතන්හි හිඳිවීමෙකැ (ම .පි.) 142
31 සැදූහැ ඔපත් (එම)
32 සපියැ යුතු (නු.පි.) 11පි

බුදු පසේබුදු සව්වෝද බඹහු ද බ්‍රහ්ම නම් වෙති. ඔවුන්ගේ සර **"බ්‍රම්සර"** නම් වෙයි. ගේ මෙතෙනැ වනාහි මෙවුන් ධම්න් විරතියැ.

බ්‍රම්සරයැ නොවන්නෙ අබ්‍රම්සරයැ හෙවත් මෙවුන්ධමැ **"දුරුවීම"** නම් විරතින් පිටත් අනෙකක් නොවන බැවින් මිකුම් කටයුතු. වතින් හැකිළැ එවත් නොමඩනා සැබැව්වූ සැදූහැ හිරි ඔතප් අපිස් ගුණ පිහිට කොටැ ඇති පව්කිරීමට පිටිපානාක්හු වැනි සමකමත් සැපියුතු කුසල් සිත යූ සේයි. **"මුසවා"** නම් බොරු කීමැ. **"දුරුවීම"** නම් විරතීන් පිටත් අනෙකක් නොවන බැවින් කියයුතු බොරුවෙන් හැකිළැ සබා නොමඩනා සැබැව් වූ සැදූහැ හිරි ඔතප් අපිස් ගුණ පිහිට කොටැ ඇති පව්කිරීමට පිටු පානාක්හු වැනි සමකමත් සැපියුතු කුසල් සිත යූ සේයි. **"රහමෙරින් දුරුවීම"** නම් විරතින් පිටත් අනෙකක් නොවන බැවින් පියැ යුතු[33] රායෙන් හැකිළැ එවත් නොමඩනා සැබැව්වූ සැදූහැ හිරි ඔතප් අපිස් ගුණ පිහිට කොටැ ඇති පව්කිරීමට පිටිපාන්නාක්හු වැනි සම කමත් සැපියුතු කුසල් සිත යූ සේයි. **"විකල් බොජුන්"** නම් පස්වරු අහර වැළඳීමයි. **"නටනු"** නම් තමා නැටීමැ. **"ගනු"** නම් ගි කීමැ. **"වයනු"** නම් බෙර ආදී වැයීමැ. **"විසුළුදසුන්"** නම් මෙකී නටනු ආදී බැලීමැ **"මල් ගඳ විලවුන් ඇඬැරිමැ"** නම් මල් පැළඳුම් ගඳ විලවුන් ගැනුම් **"උසසුන්"** නම් වඩුරියනින්[34] උස්පා ඇති හැඳයැ. **"මහසුන්"** නම් පුප් ඔත්තිලි සතර හුලෙන් දික්ලොම් ඇති පලස් ඇතිරියැ. **"රන්"** නම් රන්රන. **"රිදී"** නම් රිදීයැ. දඹුලායෙන්[35] කළ ලොහය බැවහාරයෙහි වැටෙන මාසක ද **"මස්ස"** යි සංග්‍රහ කළහ. රන්රිදී තඹ එක්කොටැ රූ නගා කළ කහාපණයට **"කහවණු"** යයි කීහු. මෙ විකල් බොජුන් ආදී පස පස්කම්රා නොපැහුවන් විසින් සෙවියයුතු බැවින් කෙලෙස් කමටනමැ[1] එයින් දුරුවීම් නම් විරතින් පිටත් අනෙකක් නොවන බැවින් එවතින් හැකිළැ එවත් නොමඩනාසැබැව් වූ සැදැහැ හිරි ඔතප් අපිස් ගුණ පිහිට කොටැ ඇති පව් කිරීමට පිටිපානාක්හු වැනි සමකමත් සැපි යුතු කුසල් සිත යූ සේයි.

**මෙතෙකින් දසසිල්හි විනිස සැබෙවින් දක්වන ලදී.**

---

33 බියයුතු නු.වි.) 11පි
34 වඩුරියන් (මැ.වි.) 148පි
35 දඹුලායෙහි (නු.වි.) 11පි

ඉක්බිති !! **''දසසිඛ නම් කවර? යත් –''**යී ප්‍රශ්න කොටැ **''මෙදස සිල්මැ හික්මියයුතු බැවින් දස සිඛ වෙ''** යී දක්වා, එහි හික්මෙන ප්‍රකාර නොකී බැවිනුදු මෙ දසසිල් හික්මෙන ප්‍රකාර දක්වනුවන් විසින්; **අත්තනා ච පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති පාණාතිපාතා වෙරමණියාව සමාදපෙතාපාණාතිපාතා වෙරමණියාව වණ්ණවාදි පාණාතිපාතා වෙරමණියාව පාසංසො''** යනාදීන් එකි එකී සිල් සතර සතර අඟින් යුක්ත කොටැ සතළිස් ආකාරයකින් හික්මිය යුතු යයි වදළ බැවින් දත් එකී එකී සිල් සතර සතර අඟින් යුක්ත කොටැ හික්මිය යුතු සෙ දක්වනු ලැබෙ. කීසේය ? යත් : **පාණාති පාතා වෙරමණී සික්ඛාපදං සමාදියාමී''** යනාදීන් සමාදන් වූ සිල් ඇත්තනු විසින් අත්තානුවාදභය පරානුවාදභය දණ්ඩභය දුර්ගතිභයා-දීන් පස්විකා විකුම් නොකරන පියල්වැ සිතැ උපන් රාදෙස් ඈ කෙලෙස් වශහ නොවැ කෙලෙසුන් මැඩ හිරි ඔතප් සැදූහැ අපිස් ගුණ එළවා සිත් සතන් අකුසලින් නහා කුසල්හි පිහිටුවා හැමකලමැ නොපමාවැ සිහිනුවණින් යෙදී පණිවාදීන් දුරුවැ හික්මියයුතු — මෙසේවත් ඔහු විසින් රක්නා දසසිල් දස අඟින් යුක්ත වේ. යම්සෙ එකීසෙයින් හික්මෙ නලද දසසිල් හික්මෙනුවන්ට ලොවි ලොව්තුරා දහමට පිහිට වෙද, එසේමැ, මෙරමාහට ද පිහිට වුවදහයි සිතා කුළුණු නුවණින් යෙදී මෙරමා දය සිල්හි පිහිටුවීමෙන් ඔහු විසින් රක්නා දසසිල් විසි අඟින් යුක්ත වේ. යම්සෙ විසි අඟින් යුක්ත කොටැ දසසිඛය පුරනුයෙ යම්කලෙකැ මේ දසසිඛයෙහි ගුණ ද මෙයින් සිඩවන ලොවි ලොවි තුරා දහම්හි ගුණ කියාද එකලැ ඔහු විසින් හික්මෙනලද විසි අඟින් යුක්ත දසසිඛය තිස්අඟින් යුක්ත වේ. යම් කලෙකැ මෙකී තිස් අඟින් යුක්ත කොටැ දසසිඛය පුරනුයෙ මෙරමාගෙ ද තමා ගෙද ගුණ සිතින් සලකා ද එකලැ ඔහු විසින් හික්මෙන ලද තිස්අඟින් යුක්ත දසසිඛය සතළිස් අඟින් යුක්ත වේ. මෙ දසසිල් තමා හික්මෙන විසින් අනුන් දස සිල්[36] සමාදන් කරවන විසින් දසසිල්හි ගුණ කියනු විසින් දස සිල්හි ගුණ සිතින් සලකන විසින් හික්මිය යුතු බැවින් දසසිඛ නම් වෙයි කීහු.

---

ඉක්බිති **''දසපරිජී නම් කවර ? යත්''** යී ප්‍රශ්න කොටැ **''දූන දූන සතක්හු දිවි ගැළවුව පරිජී වෙ'** යි. යනාදීන් දසපරිජී දක්වූහු. මෙදස පරිජී නම් කෙසේ වියැ යත් ? යම් හේතුයෙකින් මෙසස්නෙන් පරදවා ද සස්නෙන් ච්‍යුත කෙරෙ ද සදහමින් දුරු කෙරෙද ශක්‍රාත්මභාවයකින් බ්‍රහ්මාත්මභාවයකින් ච්‍යුත වූ වක්හු වැනි කෙරෙ ද එබැවින් මෙදස පරිජී නම්වී-

---

36 දස සිල්හි (නු.වි.) 13වි

මෙහි පළමුවන පරිද්දෙහි ''දනැ දනැ'' යු සේ යැ. මෙ පියොවින් මොහු මරමි දනැ දනැ යු සේ යි. පිළි සඳ පටන්ගෙනැ ච්‍යුතවන තාක් පස්කඳ ධැරුවානට රුපාදියැ ඇළුම් වන බැවින් ''සත්හ'' යන පණති. කම්සමුඨනි කලබුයෙහි[38] සිටි රූ දිවිදු සවසික් සැපියැ යුතු අරූදිවිදු ''දිවි'' නම්, ''ගැලවීම'' නම් තොරකිරිමැ යු තෙනයත් යම් කවර සතක් හු බව දන දන මරමි යන සිතුම් ඇති වැ සිය අතින් පහරණ විදිනාදී යම් කවර ප්‍රයෝගයක් කළ කලැ එපියොවින් එවිගසැ හෝ කලාතුරකින් හෝ එසත් මියන්නේ වීනම් එපියෝ කළහට එපියෝ කළ කෙනෙහි පරිජිවෙ', ඇණවා මරනු හට ඇණවනු ලදුයෙ එකාන්තයෙන් මරන්නෙ වීනම් ඇණ වූ කෙණෙහි පරජි වෙ. පරියායෙන් කිමෙහිදු මෙමැ නයයි. මෙ මෙහි උදෙස්[1] නිදෙස් වනාහි මිනිස්විකා පරිද්දෙහි කීසෙයින් දතයුතු. මෙදෙක්හි වෙසෙස් කවර ? යත් : එහි මිනිස්සතක්හුම මැරුව පරිජි වෙ—

## පළමුවන පරිජි නිමි.

---

දෙවන පරිද්දෙහි ''දනැ දනැ'' යු සේයැ. මෙරමා අයිතැයි දනැ දනැ යු සේයි. ''දනා අයිතැයි'' දනැ දනැ යු සේයි. තමා නොගැතියැ යු සේයි. ''දහුවැලැයකුදු'' යටත් පිරිසෙයින් පරිජිපොහොනා වත් දක්වනු සඳහා කීහු. ''සොර සිතින් ගත්.'' නම් යු සේයි. අනුන් ගැතිවත් අනුන් ගැතිබව දන දන පස්විසි අවහාරයෙන් එක්තරා අවහාරයෙකින් සොරා ගත්නම් යු සේයි. මෙ මෙහි උදෙස්, නිදෙස් වනාහි අයිනාදන් පරිද්දෙහි කීසෙයින් දතයුතු.

මෙදෙක්හි වෙසෙස් කවර? යත් : එහි රත්තරන විසිවියැටෙකින් පරිජි වෙයි. මෙහි දහුවැලයකිනු දු පරිජි වේ.

## දෙවන පරිජි නිමි.

---

තුන්වන පරිද්දෙහි ''දනැ දනැ'' යු සේකැ. අසුචි හා සඳුන් හා විවෙක නොකරන පමණ ද ගිනි හා රත්රන් හා විවේක නොකරන පමණ ද උමතු නොවැ නොනිදන සඳකරන විකුම් සාදනා කෙරෙත් නම් යු සේයි.

---

1 කලාපයෙහි (මැ.වි.) 15
38 කලඹුයෙහි (නු,වි.) 13වි

"තිරිසන්ගිය මාගමක හා ද" යි යටත්පිරිසෙයින් මෙවුන්ධම පොහොනා මාගමුන් දක්වූ. එතෙකුදු වුව යටත් පිරිසෙයින් මෙවුන් ධමටැ කෙත්වූ සෙයින් කොසෙයින්[39] ගොයින් ඇ දික්දූවත් මාගමුන් පිරිමිනීන් ගතයුතු රාගයෙන් සම වූ සමාගම්පිරිමිනීන්ගේ දහම් මෙවුන් ධම් සෙවිම් නම් යූ සේයි. මෙකී මාගම් පිරිමිනීන්ගෙ තුන්මගින් එක්තරා මගෙකැ මෙවුන්ධම් සෙවීනම ද තමානිමිත්හි මෙරමා විසින් කරන විකුම් සාදනා කෙරෙ නම් ද යූ සේ යි. මේ සිඛයෙහි උදෙස්, නිදෙස් වනාහි මෙවුන්ධම පරිද්දෙහි කීසෙයින් දතයුතු—

## තුන්වන පරිජී නිමි.

---

සතර වන පරිද්දෙහි "දූනැ දූනැ" යූ සේයැ. බොරු කියන පෙරටද කියන කලද තමා කියන බොරු දූනැ දූනැ යූ සේයි. "සිනාසු බසිනුදු" යි යටත් පිරිසෙයින් පරිජිවන්නට නිසි බොරු දක්වනු සඳහා කීහු. කුමැ යූ තැනයත් ? සිනා සඳහා යහපත්හ. නිස්සහ. නුව ඤැත් තාහ යොග්‍යවැ සිටියහ. යනාදීන් නො එසේ වූවානටැ කීවානමුදු වෙහෙර වැ පැසැ තබා එක් අවුළුපතක් හළුවා දූකැ වෙහෙරටැ අවුළු පත් පැසින් බැවුනයි ද බොජුන්හලැ තෙලිත්තක් වැටුනා දූකැ බොජුන් හල තෙල මොහොළ ගෙනැ ගියෙයැ යනාදීන් සිනා සඳහා කියා නම් යූසේයි. "මුසවා" කියා නම් යූ සේයැ. සිහි නැතිවැ සහසා නොකියා එකක් බෙණෙමි සිතා අනෙකක් නොකියා නොදුටුවා නො ඇසුවා දිටිමි ඇසිමි යනාදී නුදු සැක ඇති දූ සැක නැතිවන්ව ද සැක නැතිදූ සැක ඇති වන්ව ද කියා නම් යූ සේ යි. මෙ මෙහි උදෙස්, නිදෙස් පවිති පොතැ ආදි සිඛයෙහි කීසෙයින් දතයුතු —

## සතර වන පරිජී නිමි.

---

පස්වන පරිද්දෙහි "දූනැ දූනැ" යූ සේයැ. රාබව දූනැ දූනැ යූ සේයි. එබැවින් රා නොදූනැ පූව පරිජී නොවෙයි. අකුසල් වනාහි වෙයි. සෝවාන් වූවානටැ නොදූනැ බොත් නොවදී. කම්පථ වූකලි අකුසල්

---

39 කොසෙයින් (මැ.වි,) 146

සැ. යු: "කෙසෙයින්" විමලකීර්ති සංස්කරණයේ මෙම පදය සංශෝධනය කර යොදු ඇතත් ... ගොයින් දික්දැව" යි යෙදී ඇති බැවින් කොබෙයින් යන්න නොගැලපේ යයි හැඟේ

සිතින්මැ වියයුතු බැවිනි. ''පිණිබිඳක් සාද'' යි යටත් පිරිසෙයින් ටිකිරි පොනොනා වත් දක්වනු සඳහා කීහු. මෙ මෙහි උදෙස්, නිදෙස් මනාගි සුරාපාන සිඛයෙහි කීසෙයින් දතයුතු—

## පස්වන පරිජි නිමි.

පස්වන සවාරෙන් දතුවයෙන් ''බුදුහු'' හැමදෙනා විසින් ආදර කරන ලද බැවිනුදු මහඇගි බැවිනුදු තමන්හා සම කෙනෙකුන් ලොවිහි නැති බැවිනුදු සැරියුත් මහතෙරුන් ඈ මහපිනැතියන් විසින් සෙවියයුතු බැවිනුදු ''රුවනුදු'' වෙත්. ''අයුණු කිව'' යූ සේයැ. සව්නේ සවාරෙන් නො දන්ති. කෙලෙසුන් කෙරෙන් දුරුහු නොවෙති. යනාදීන් නවඅරහාදී ගුණ පිළිවක් කොටැ අයුණු කිව යූ සේයි. සතර මග සතරපල ද නිවන් ද ''දහම්'' නම්. පළමු කීසෙයින් රුවනුදු වෙයි අයුණු කිව යූ සේයි. එදහම් මනාවැ පිළිපදනවුන් දුක් නැසීමට නො පමුණුවා යනාදීන් අයුණු කිව යූ සේයි. අරිඅට පුහුලෝ ''සඟහු'' නම් වෙති. ඔහු පළමු කීසෙයින් රුවනුදු වෙති. අයුණු කිව යූ සේයැ. එසඟහු සුපිළිපන්හු නොවෙති. යනාදීන් අයුණු කිව යූ සේයි. පළමු මෙවුන්ධම් පරිජි දක්වන තැනැ පුවතත් මෙහෙණනුදු ගැණෙන්නෙන් නැවැත. සබ්බනාසනා දක්වනු සඳහා ''පුවතත් මෙහෙණක හා ද මෙවුන්ධම් සෙවිය'' යුහු. ''අතියතමිසදිටි'' යූ සේයි. මනාහරන්නට නිසිවැ නියතවූයේ නොවෙයි යූ සේයි. වත්මනුයෙහි ද ඉකුත් කල්හි දූ අනායෙහිදූ රුවාරු දහම්හු පිණිස උපදිති සිතා මනාගෙනැ තුන්කල්හි එකදහම්හයි ගන්නා සඇසන දිඝියැ පළමු කළ කුසලා'කුසලින් දූන් එල නැත. දූන් කළ කුසලා ''කුසලින් මත්තට උපකාර නැතැයි ගන්නා උච්ඡෙදිට්ඨී නම්—

## දස පරිජි නිමි.

(IV) මෙසේ දක්වන ලද මෙදස පරිද්දෙන් එකකුදු අවප්නෙන් දුස්සීල වූවාහට සැදැහැයෙන් දූන් පස වළඳනු වරා ගිනිගෙනැ දිලියෙන ලොහොගුළා වළඳනු මැනවයිදු; සැදැහැයෙන් දූන් සිවුරු හඳනා පොරෝනා වරා. ගිනිගෙනැ දිලියෙන යපට හඳනෙ මැනැවැයිදු, සැදැහැයෙන් කරවා දූන් සෙනස්නෙහි ලග්නා වරා. ගිනිගෙනැ දිලියෙන

40 යවටක් එම (මැ.වි.) 148

ලොහොගෙයි ලග්නෙ මැනවැයිදූ, සැදැහැයෙන් දුන් හැඳපුටු ආදිය හෝනා හිඳුනා වරා, ගිනිගෙනැ දිලියෙන හැඳපුටු ආදියැ හෝනෙ හිඳුනෙ මැනවැයිදූ ; සැදැහැයෙන් වඳනවුන්ගෙ වැඳුම් ඉවසනු වරා ගිනි සදල වරක්ඵව පොලුලා අඹරනු මැනවැයිදූ ; තියුණු සැතින් උරෙහි විඳුනෙ මැනවැයිදූ වදළ බැවින් පිරිජි වත්නට නිසි විකුම් කොටැ බුන්සිල් ඇත් තහු විසින් හිස ගිනි ඇවිලියක් හු එගිනි නිවන්නට වන වෙලෙවියක්-ලෙසින් වහා සංවරයෙහි පිහිටියැ[41] යුත්තෙයැ— නො එසේ වුවහු විසින් සඟුන් වළඳවන සතරපසෙහි විධාන නොකට යුත්තෙයැ. නොද පිරි යස්ස යුත්තෙයැ. නොදසිය අතින් සැපවියැ යුත්තෙය. යටත්පිරි-සෙයින් වළඳන සඟනට අවුලට නිසි කොල'ත්තකුදු කැප කොටැ නොදියැ යුත්තෙයැ. සඟුන් ඔහු ලවා කැපකරවා නොගත යුත්තෙයැ. මෙ අර්ථය අටුවාහි ආ බැවිනුදු—

**"එකොපි අලජ්ජී අලජ්ජිසමපි අලජ්ජිසහසසමපි අලජ්ජි සතසහසසමපි කරෝති"** යූ බැවිනුදු, මෙසේ මෙසේ වන බැවින් තමහට උපන් සතරපස යැ සඟනට දියටිහු විසිනිදු ; සඟනට වළඳ එවන සතර පසයෙහි විධාන කරනු ආදී කැමැත්තහු විසිනුදු ; ආයති සංවරයෙහි නොපිහිටත් හොත් මහණ වෙස් හැර ගිහි භාවයට යා යුත්තෙයැ. මෙතෙකින් ඔහු විසින් සඟනට එලවන සතර පසෙහි සඟනට නොවටන බැවින් රන් රිදී මසු ආදී අකැපවතින් කැපවත් පෙරළා ගෙනැ ද, කුලදූෂණාදීනුදු ලද සතර පසය වනාහි නොවන්නහු විසිනුදු සිල්වත්නට නො දියැ යුත්තෙයැ. මෙ දසපරිද්දෙන් එකකුදු අවන්නහු සැදැහැයෙන් දුන් සතර පසය පරිභෝග කරන්නට නො නිසිවන බැවිනුදු ; මෙයින් සිද්ධ වන ආදීනව නොදන ද පරිභෝග කළ අපාය සිද්ධවන බැවිනුදු මහණ ලිඟු විනා පැවිජි නැති බැවිනුදු ; සඟුන් හා සම්භොගයට නො නිසි වන බැවිනුදු ; ලිඞගනාසනා විසින් සබ්බනාසනා විසින් නසන කලැ මෙ දසපරිජි අවන්නන්මැ නැසිය යුතු බැවින් "මෙ දස පරිජිමැ දසනාසනා නම් වෙයි" කීහු—

41 පිහිටැ (මැ.වි.) 1498

## ආදි දැක්වූ දස පරිජි පස්ලිඞගනාසනා නම් කුමට වියැ? යත්:-

එපසින් එකකුදු අවන්තන්ගෙ මහණලිගු පිළිගන්වා[42] නැසියයුතු බැවින් ලිංගනාසනා නම් වෙ. එසෙමැ නැසීමට කරුණු කිමැ? යත් :— එපසින් එකකුදු අවන් කෙණෙහි පැවිද්ද නස්සී. වත් තෙරුන් කෙරෙන් ගත් වත්පදද උපශම වෙයී. ගත් සෙනසුනුදු නොගත්තා වෙයි. සංඝ ලාභ ද නොලැබෙයි. හුදෙක් මහණලිඟු මතු තිබෙයි. එබැවින් මහණ ලිඟු නැසියයුතු වෙයි. ලිංගනාසනායෙන් නැසියැ යුතු කවරහ ? යත් : යමෙක් පරිජි වන්නට නිසි විකුම් කොටැ මා කළ දේ නොයෙදෙයි සිතා වහා සංවරයෙහි පිහිටිය මැනවැයි යන සිත් නැත්තෙ ද එසේ වූවහු සංවරයෙහි පිහිටුවන කලැ පළමු ලිංගනාසනායෙන් නසා සිවුරු දී සංවරයෙහි පිහිට වියැ යුත්තෙ යැ. ඉදින් එක්වන් පරිජි වන්නට නිසි විකුම් කරනුයෙ වීනම් සංවරයෙහි නොසිටිනෝ වීනම් නෙරියැයුතු වෙ. යමෙක් සහසා වැර දූ[43] මා කළ සේ නොයෙදෙයි සිතා වහා සංවරයෙහි පිහිටා ද, එසේ වූවාහුගේ මහණලිඟු නැසුවමනා නැති. හන්පෙරවි සිවුරු තුබූ සේ තබා පැවිද්දෙහි පිහිට වියැ යුත්තේ යැ. වත්පදද දියැ යුත්තෙයැ. සංඝලාභ ද දියැ යුත්තෙයැ. ලග්නා සෙනසුනුදු දිය යුත්තෙයි—

---

## අන්තයෙහි දැක් වූ දස පරිජි පස් සඞ්ඛනාසනා නම් කුමට විය? යත්:-

මහණලිඟු නැසියැ යුත්තෙන් යම් කවර ගුණදහම වැ පිහිට නොවන් තෙන් සඞ්ඛනාසනා නම් වී. එහි භික්ඛුණී දූසකයා විනා තුබූ සතර දෙනහට අවවාද කොටැ ගත් කලැ වැලිදඬුවම් කරවා ලිංගනාසනායෙන් සංවරයෙහි පිහිට වියැ යුතු වෙ. නො එසෙ වූවාහු නැසුවාහුමැ දුරු කටයුතු වෙත්—

(V) දස දඬුවම් වත්හි ආදියැ පස පළමු කීසෙයින් දත යුතු. අන්තයෙහි පස "පැවිද්දන් ලබන ලාභයෙන් පිරි හෙලීමැ" යූ සේයැ. යම් පියොවකින් පැවිද්දෝ ලාභ නොලබද්ද, එවැනි පියෝ කිරීමැ යූ සේයි.

---

42 හන්දවා (කු.වි.) 178
43 වැරද (මැ.වි.) 1508

''**උපද්‍රව**'' නම් :- භයකාරණා එළවීමැ. ''**ආකොසාබිණිම**'' නම්, ගොත් ඈ දක්වා හැවීමැ. ''**පරිකොසාබිණිම**'' නම්, — භය දක්වා කලකිරුවා හැවීමැ. ''**පැවිද්දන්පැවිද්දන් කෙරෙහි බිඳවීම** නම් ;—යූ සේ යැ. ඔවුනොවුන් කිපී බිඳෙන්නවැ නිසි තෙපුල් ඔවුනොවුන්ට කියා බිඳුවීමැ යූ සේයි. විකල්බොජුන් ආදි පස විකුම් කොටැ බුන්කලැ වැලිදඬුවම් කැරැවියැ යුත්තෙයැ. සිල් දූන ද නුදූන ද වවී. එතකුදු වූවත් ආයති සංවරයෙහි පිහිටුවනු සඳහා දසසිල්හි ඔහු දළකරවනු සඳහා දසසිල් දියැයුතුවෙ —

සඟරමින් නෙරනා වත් පස විකුම් කළහු නෙරනා කලැ වත් පද දුන් වත්නෙරුන් තමන් නිසා වාසය කරනුවා තමන් වසන පිරිවෙණට හෝ තමන්ට වසඟින් පැමිණි සෙනස්නට හෝ නො වැද්ද දියැ යුත්තෙයැ. සියල් සඟරමින් නෙරියැයුතු නොවේ. සඟරමින් නෙරනා වත් පස දක්වනුවන් විසින්. ''**භික්ඛූනං අලාභාය පරිසක්කති**'' යනාදින් පාය දක්වූ හෙයින් එහි අටුවා දක්වනු ලැබේ.

''**අලාභාය පරිසක්කති**'' ති යථා ලාභං න ලභන්ති එවං පරක්කමන්ති.[44] ''**අනත්ථාය**'' ති' උපද්දවාය. ''**අවාසාය**''ති කින්ති. ඉමස්මිං ආවාසෙ නං වසෙය්‍යු' න්ති පරක්කමති.''**අක්කොසති පරිභාසති**''ති අක්කොසති මෙව භයදස්සනෙන ච තජ්ජෙති. භෙදෙතී'ති පෙසුඤ්ඤං උපහරිත්වා භෙදෙති''යි—

මේ හෙරණසිඛයෙහි මුසවායෙන් වන පරිජි අයිනාදන් පරිද්දෙහි ආරාමාදි අභියුඤ්ජනයෙහි සෙයින් තමා නොගැති වත් තමා ගැත්තෙ යැයි කියනුවහට ද වෙයි. එසෙමැ උපනිධි කථාවෙහි සෙයින් තමා කෙරෙහි තුබූ වත් නොතිබුයෙයි කියනුවහට ද වෙයි. උතුරු මිනිස් ධම් පරිද්දෙහි සෙයින් තමා සතන්හි නැති මහගු ලොව් ලොවුතුරා දහම් තමාසතන්හි ඇතැයි කියනුවහට ද[45] දුට්ඨුල්ලසිඛයෙහි සෙයින් රාසිතින් මාගම් පිරිමිනීන් පඬුවන් තිරිසනුන් සිරුරැදු සිරුරු පිළිබැඳියෙහිදු, නැති අගුණු කියනු[46] වහට ද, අමූල අඤ්ඤභාගිය සිඛයෙහි සෙයින් මුල්නැති වතින් චොදනා කරනුවහට ද ; ඔමසවාසිඛයෙහි සෙයින් නැති නම් ගොත් ඈ කියනුවහට ද වෙයි. පෙසුඤ්ඤසිඛයෙහි සෙයින් බිඳිනා

---

44 පරක්කමති (නු,වි,) 18
45 කියවනු හටද(මැ,වි,)1528
46 කියා බිඳිකෙරෙහි පිරියැයුතුවතුදු දහගබ මහබොයැ පිරියැයුතු වතුදු නාවූහට (නු,වි.) 18-19 පිටු

නිසා නොකී අයුණු කියනු වහට ද ඡන්දදීන් නොපවත්වන්නාවුන්ට එසේ පවතී යි කියනුවහට ද වෙයි. එසේ හෙයින් මුසාවා නිමිත්ත කොටැ ආපත්තිවිධාන කළ තාක් සිඛයෙහි විනිස "දනැ දනැ සිනාසූ බසිනුදු මුසවා කිව පරිසී වෙයි" යන සිඛයෙහි මුසවා බැවකින් ඇතුළු වෙයි. එසේ ඇතුළු වූ තාක් සිඛයෙහි හික්මෙනුවන් විසින් හික්මියැ යුතු වෙ—

මෙකී සෙයින් අසංවරයෙන් දුරුවැ සංවරයෙහි පිහිටි කුලපුත්හු[49] විසින් කුන්දුසිරින් දුරුවැ තුන් සුසිරි පිරියැ යුතු බැවින් මෙවුන්ධම හා සමකොටැ අයුණු දක්වන ලද සුක්ක විසසයින් සිද්ධවන කායදුශ්චරිත වාග්දුශ්චරිත මනොදුශ්චරිත යෙනුදු දුරුවැ ; එසේමැ රාසිතින් මාගම් පිරිමනින් පඩුවන් තිරිසනුන් සිරුරු පිළිබැඳියෙහි පහස් විඳුමෙන් නො පිරිමට මනාතාක්-වත් පිරිමැදීමෙන් ; රා සිතින් ගිරිති කැවීමෙන් ; දියෙහි කෙළියෙන්; කෙළ ලීමෙන් ; දැහැවි[50] සිතින් මෙරමා පැහැරමෙන් අත්සැත්[51] කියපීමෙන් සිද්ධවන කායදුශ්චරිත මනො දුශ්චරිතයෙනුදු; සඟුන් බිඳිනවුනට වහල්වැ බිණීමෙන් සිද්ධවන වාග්දුශ්චරිත මනො දුශ්චරිතයෙනුදු ; එසේමැ සඟුන් බුන්නවුන්ගේ ගුණ කීමෙන් අනුන් කමනට අවවාද නොකරන්නට පැවරීමෙන් සිද්ධවන වාග්දුශ්චරිත මනො දුශ්චරිත යෙනුදු ; රාසිතින් මාගම් පිරිමනීන් පඩුවන් තිරිසනුන් සිරුරුදු සිරුර[52] පිළිබැඳියෙහි දු ඇති ගුණ අයුණු කීමෙන් හැවීමෙන් මෙවුන්ධමින් මෙහෙ කිරීමෙහි ගුණ කියන විසින් හඟවනු විසිනුදු සිද්ධ වන කුන්දුසිරිනුදු එසේමැ මාගම් පිරිමිනීන්ගෙ මෙවුන්ධම් පිළිබැඳි හසුන් පිළිගැණුම් ආදිනුදු ; කුල සංග්‍රහය සඳහා මල්පල ආදී දෙවීමෙන් ගස් තුරැ ලිය ආදිය පිරිනැමීමෙන්, මාගමක හා රහස් කැමැතිවැ, නොරඹුරහි[53] හිඳිනාදීන්, එක්තැනකට පිරිනැමූ ලාභයක් අනෙක් තැනකට පිරිනැමීමෙන්, මාගම් පිරිමනීන්ගෙ ඇති අයුණු කියා හැවීමෙන්; බිඳිනා නිසා ඇති අයුණු කීමෙන්; අවවාද කළවුන් කෙරෙහි අනාදර කිරීමෙන් ; අනුන් බැවීමෙන්; නොකියා පාසිවුරු ආදි සහවනු කිරීමෙන්; බුදුන් විසින් දෙසූ තාක් අන්තරාය කර දහමුන් අන්තරාය කර නො වෙති'යි කියන ආදි සිඛපද උගත් කලැ කුකුස් උපද්දී, එබැවින් එ නුගන්නේයැ.

---

49 කුලපුතක්හු (නු.වි.) 19
50 දුවි (නු.වි.) 198
51 අත්සැත කියා කිපීමෙන් 198
52 සිරුරු (එම
53 තොරඹුරයෙහි (එම)

යනාදීන් සිද්ධවන තුන්දුසිරිනුදු ; මෙසේ තුන්දුසිරිවැරුතාක් සිඛයෙහි විකුම් නොකරනුවන් විසින් තුන්සුසිරි පුරා මතු මතුයෙහි ලැබිය යුතු වෙසෙසටැ පිහිට වන කුල පුතක්හු විසින් සතරපසයෙහි පවත්නා විධි ද, මහලු සබ්‍රම්සරුන් සෙනසුන් සොධන වතුදු ; අත්පස් අත්දෙණි දිය වටන්හි පිරියැයුතු වතුදු, තමා ලග්නා සෙනස්නෙහි පවත්නා විධිදු; සහසතු ඇ වත්හි පවත්නා විධිදු; මතක පිරිකර පවත්නා විධිදු; කුල ගම් එළඹෙනුවහු විසින් පිරියැ යුතු වතුදු තමා ලග්නා වෙහෙරින් අනෙක් වෙහෙරකටැ එළඹෙනුවහු විසින් පිරියැයුතු වතුදු ; එළඹුණු වෙහෙර පිරියැයුතු වතුදු; තමා ලග්නා වෙහෙරටැ වැඩි ආගන්තුකයන් කෙරෙහි පිරියැයුතු වතුදු;ගිලනුන් කෙරෙහි පිරියැයුතුවතුදු;නිදෙස් විසින් කියනු නොපිළිවන් බැවින් උදෙස් විසින් එකී එකී තැන කියනු ලැබේ. එසේ කීවත් හැම කල්හි හික්මියැයුතු බැව් දැන ඉගෙනැ හැම කලමැ හික්මියැ යුතු—

## (1) මෙහි සතරපසයෙහි පවත්නා විධි කිසේයැ? යත්:—

අලුත රැඳු සිවුරු උපන මෙවෙනි වණගඳරස සපන් සිවුරු මෙ සිරුරටැ පැමිණැ පිළිකුල් බවට පැමිණෙයි. පළමු පිළිකුල් විසින් මෙණෙහි කොටැ ඉක්බිති හඳනා සිවුරු පස් විකාගෙනැ පෙකණිය ද දෙදණමඬලද වසාදණින් අටඟුලක් පාත බහා[54]වට කොටැ කහබහන් බැඳැ පොරොනා සිවුරු ද පස්විකා ගෙනැ පත්පට ඇත්පිටැ බහාලූ ඇත්ගොව්වක් සේ සමකොටැ පෙරවැ මෙනියායෙන් කයින් තොර වූ කල්හි පස්විකා සිවුරු වළඳ කටයුත්තෙයැ—

අහර වළඳන කලැ මෙවෙනි වනගඳරස සපන් මෙ අහර මෙසිරුරට පැමිණැ පිළිකුල් බවට පැමිණෙයි. පළමු පිළිකුල් විසින් මෙනෙහි කොටැ ඉක්බිති අටහ සමන්නා පස්විකා ගෙනැ දැහැවි සිතින් අනුන් සතජ්නා පා නොබලා සූපයට අවකාශ කොටැ එලවූ සූප ව්‍යඤ්ජන ගෙනැ බොහෝ කැමැති වැ අළුවා අහරින් මුවා නො කොටැ අහර අනා කැටි කොටැ මුදුනෙන් නොගෙනැ තමා දිශාවෙන් පන්තියෙන් ගෙනැ මොනර බිජුවස් මහත් නොකොටැ කිකිළි බිජු සේ කුඩා නො කොටැ පරිමණ්ඩලකොටැ ආලොපය වටා මුවට ළං නොවනතුරු මුවය විවර නොකොටැ ආලොපය සැපත් කලැ විවර කොටැ උණ්ඩිවට සේ මුවට දමා නොලා අත ඇතුළු මුවට නො බහා දිව පිටතට නොහැර

---

54 පාකහා (නු.වි.) 20

ආලොපය ගන්නා කලැ මුවෙන් සමහරක් කඩා නොගෙනැ සුසුරෙහි නොගහා මීයෙහි ඉඳුල් අහර වළඳන පය. නොවගුරුවා "සුරුසුරු" යන අනුකරණ ඇති නොකොටැ නොඋරා කබලගෙනැ මීයෙහි තුබූකබල වළුරන්සේ කොල්හි[55] කැටි නොකොටැ "චපු චපු" යන අනුකරණ ඇති නොකොටැ පස්[56] නො පැහැරැ පරගලා කොටැ අත් නොසලා ඉඳුහුළු බිමැ නොවගුරුවා දිවින් තොල් නොලෙවැ අත් නොලෙවැ පා නොලෙවැ පැන්තලු එලවුව[57] ඉඳුල් අතින් නොගෙනැ ආලොපයෙහි අවහසමන්නා පස්විකා අහර වළඳා දැහැවු කිස නිමවා අතීත පස් වීකුම් සඳහන් කටයුත්තේයැ—

සෙනස්නට වදනා කලැ දිය හෙළමෙන් නුදුරුවැ පිටතැ සිටැ සෙනස්න පස්විකා ගෙනැ සෙනස්නට වැද හස්තෙ හිඳිනා කල ද හස්න පස්විකා ගෙනැ හින්ද යුත්තේ යැ.—

ගිලන්පස බෙහෙසත් ගන්නා කලැ ඇති කරුණු සලකා ගෙනැ නැත හොත් කරුණක් ඇතිකලැ වළඳිමියි ගෙනැ පෙරවරු වළඳත් පිඩු පස් විකුමෙන් පස්විකා ගෙනැ පස්වරු වළඳත් ඇති කරුණු සළකා ගිලන් පස්විකුමෙන් පස් විකා වැළඳිය යුත්තේයැ—

මෙසේ පරිභොග කරණ සතර පසය එක්විසි අනෙස්නෙන් දුරුකොටැ ධැමෙන් ඉපදවිය යුත්තේයැ. ලදුලද්ද සහවන විසින් හැරගනු විසින්[58] අපරිභෝගයට නොපමුනුවා පිරියසනා තැනද, ගන්නා තැනැද, වළඳ කරණ තැනද පරහට දීමෙහි පමණ දැනැ දුස්සීල භාවයෙන් වන ථෙය්‍ය පරිභොගයෙනුදු නොපස්. විකීමෙන් වන ඉණපරි භොගයෙනුදු, දුරුවැ සිල්වත්වැ පස්විකා දයාද පරිභෝගයෙන් පරිභෝග කටයුත් තෙයැ. සවස ද උදය ද අතීත පස්විකුම් සඳහන් කටයුත්තෙයැ—

## මෙතෙකින් සතරපසෙහි පවත්නා විධි සැබෙවින් දක්වන ලදි.

## (2) මහලු සබ්‍රම්සරුන් කෙරෙහි පවත්නා විධි කිසේය ? යත්:-

ඔහු තුන්වේලෙහි වන්දනාදින් හරසර කටයුත්තොයි. කෙසෙනි? යත් :— පළමු කී සෙයින් හැඳැපෙරවැ "කමන්නැ වඳනම්හ"[59]යි සළමු කියා ඉක්බිති දෙපත්ල සමකොටැ තබා ඉදිවැ සිටැ මවිසින්

55 තොල්හි (නු.වි.) 208
56 සළ (මැ.වි.) 1558
57 නොඵලවුව (එම)
58 ගැරහෙන විසින් (නු.වි.) 218
59 වඳහම්හයි (නු.වි.) 218

මෙවැනි සිවුපිරිසිදු සිල්හි පිහිටි අපිස් සතොස් සලෙගුණෙන් යුත් පින්කෙත් වූ මහපිනැ'තියන් දක්නාක් වඳනාක් ලද සේ යහපතැයි සිතා උපන් සොම්නසින් පිණා ඇඳිලිබැඳැ, මෙතෙකින් හන්සිවුරෙහි පෙරටැ හියින් කතුලෙහි පහරණ පමණටැ නැමී තුන්විටෙකැ වැඳැ පත්කඩ තබා වඳුන්හොත් අනාවිහිත නුවූනම් මුහුණ පෙනේ නම් නොහිඳත් නම් නොවළඳත්[60] නම් පත්කඩ තබත් කිම් දෝහෝ?යිකියා පළමු පත්කඩ තබා ''**කමන්නැ වඳනම්හ**'' කියා පසඟ ඔබා පළමු සෙයින් ආදර බහුමානයෙන් දෙ අත්ලෙන් දෙපත්ල හඹ හඹා පත්ල සිඹැ පෙමුදු ආදරදු උපයා වැන්ද යුත්තෙයි—

වෙතගෙනැ හසර කරත්පළමු කී සෙයින් උපන් සොම්නසින් පිණා ඇඳිලි බැඳැ ආදර දක්වා නැමී ගෙනැ ඔබට යත්න කිම්දෝ හෝ? යි කියැ යුත්තෙයි. පාපිස්නියැ පා පිසුත්හොත් එසේමැ බඳ ඇඳිලි ඇති-වැ ආදර දක්වා මෙහි පාපිසුත් කිම්දෝ හො? යි කියා පිස්ස යුත්තේයැ. පෙනෙන තෙනැ හිඳුත් ආසන්නයෙ හිඳුත් කී සෙයින්මැ ඇඳිලි බැඳැ අවසර වදළ මැනවැයි කියා අවසර ඉල්වා ගෙනැ හින්ද යුත්තෙයි. තමා කියවා ගණුත්, පැණ පුළුවුසුත් බණ කියවත් අත්නවැ කියවා දෙත් පැණ විසඳුත්, පළමු කී සෙයින්මැ ඇඳිලි බැඳැ අවසර ඉල්වා ගත යුත්තෙයැ. පහන් දල්වත් පහන්වනසේ දනුත් කිම්දෝ හො? යි කියැයුත්තෙයැ. නිවත් පහන් පියවි කරත් කිම්දෝ හෝ?යි කියැ යුත් තේයැ. **ගිනි දල්වත් සෙනසුන් ගුත්තිය වනසේ දනුත් කිම්දෝහො? යි** කියැයුත්තෙයැ. නිවත් සෙනසුන් ගුත්තියැ නිවත් කිම්දෝහෝ? යි කියැයුත්තෙයැ. දෙර වරුත් හොත් දෙර වරුත් කිම්දෝහො?යි කියැයුත්තෙයැ. පියාලත් දෙර පියාලත් කිම්දෝහො? යි කියැයුත් තේයැ. සනහන්නට බස්නහු විසින් නැගෙනවුන්ට අවසර දී පහවියැ යුත්තෙයැ. නැගෙන්නහු විසින් බස්නවුන්ට අවසරදී පහවියැ යුත්තෙයැ. එක නොවැ සනහන කලැදු පෙරවැදු, උඩු හොයැදු නො සැනහියැ යුත්තේයැ. එකසෙනස්නෙහි ලඟුත් අරුණුවේලේ නො හොත යුත්තෙයි—

**මෙතෙකින් මහලු සබ්‍රම්සරුන් කෙරෙහි පවත්නා විධි සැබෙවින් දක්වන ලදී.**

---

60 නොවළඳත්නම් කිම්දෝහෝයි (මැ.වි.) 1568

### (3) දහගබ් මහබොයැ පිරියැ යුතු වත් කෙසේය? යත්:—

පාදෙවැ හමදනා මුසුන් ගෙනැ දීමනු බුදුන්කරා එළඹෙනු වක්හු සෙයින් දගබට එළඹැ හැමදෑ දිග[61] බලා දස නොබලා අනුන් හා නො බැණ[62] නවඅරහාදී බුදුගුණ සඳහන් කොටැ පිදියහැකි වතක් ඇත, පුද මහත් දගබෙක් වීනම් තුන්විටෙකැ පැදකුණු කොටැ අට තැනකැ සිටැ වැන්ද යුත්තෙයැ. කුඩා දගැබෙක් වීනම් සොළොස් තැනකැ සිටැ වැන්ද යුත්තෙයැ. මහබොයට ද මෙකී සෙයින්මැ එළඹැ හැම ද දිග බලා දස නොබලා අනුන් හා නො බැණැ නවඅරහාදී බුදුගුණ සඳහන් කොටැ එසේ වූ බුදුරජහට උපකාර වූ මහා බොධියයි ' ගුණ සළකා බුදුන් කෙරෙහි කරන ආදර කොටැ පිදියැහැකි වතක් ඇත, පුද පළමු කී සෙයින්මැ පැදකුණු කොටැ සොළොස් තැනකැ හෝ අටතැනකැ ගිඳැ වැන්ද යුත්තෙයැ—

### මෙතෙකින් දහගබ් මහබොයැ පිරියැයුතු වත් සැබෙවින් දක්වන ලදී

---

### (4) සෙනසුන් සොධන වත් කෙසේයැ? යත්:—

සෙනස්නෙහි ගහළ බොහො වීනම් බොහෝ වත් කළමනා වීනම් හෝ පළමු ගෙයි තිබූනාක් සෙනසුන් පිරිකර තුබූ තුබූ නියායෙන් සලකුණු කොටැ බිසි කඩ පන්කඩ හැඳපුටු පාඅළු පුවරුකඩ කෙළමලා බුමුතුරුණු ආදී කී පිළිවෙළින් ගෙන් පිටතට හැර සෙනස්නට උඩු සුලහින් සෙනසුන් වතින් මණ්ඩප පැන්පොකුණු සහුන්වෙතින් දුරු කොටැ ධූලි නැගෙන බිමෙක් වීනම් සුළං ගස්වා අව දක්වා පියැ ශුද්ධ කට යුත්තෙයැ. සෙනස්න හමදනා කලැ මකුළුහූ ආදි හැර පළමු උඩ හැමදෑ බිතත් හැමදෑ බිම හමදනාකලැ ධූලි නැගෙන බිම වීනම් දිය ඉසැ නො එසේ වුව දිය නො ඉසැ හමදනා කලැ හී පනින් උගහට නෙනැ ගහළ හැර හැම දෑ හමදනා මුස්නෙහි දඬුව ඉදි කොමැ සිටුවා දකුණ'තින් පාත ගෙනැ වමතින් මත්ත ගෙනැ මුස් නෙහි ඇළයෙන් නො හැම දෑ මුසුන් කොල නො ඇක්මැ මුසුන් දඬුව

---

61 දියබලා (කු.වී.) 228

62 නොබණ (මැ.වී.) 157පි

තමා දිශාවට නැමෙන නියායෙන් ධූලි උඩට නො නැගෙන සේ ගෙබස හැමඳ පිටත ද හැමඳ ගහළ තොලුව ද හීපත ද දකුණ'තින් ගෙනැ ගහළ වෙනැ බනා තබා වමතින් සිවුරැපතට එවා[63] ගෙනැ උක්කුටුකයෙන්[64] හිඳැ මහත් ගහළ ඇත. අතින් පළමු එව ගෙනැ ඉක්බිති හී පතින් ගහළ ශුද්ධ කොටැ එවගෙනැ පිටමනා තැනකටැ ගහළ බලා හැරැ අත්දෙව පළමු බුමුතුරැණු අතුට පා අළු තබා හැඳ පුටු තබා පුවරුකඩ පත්කඩ බිසිකඩ ආදීන් හැරැ පළමු පැනවූසේමැ පැනවිය යුත්තෙයැ—

## මෙතෙකින් සෙනසුන් සොධන වත් සැබෙවින් කියන ලදි

---

**(5) අතපස් අත්දෙණි දියවටන්හි පිරියැ යුතු වත් කිසේයැ යත්:—**

සිරැරු කිස සපයනු සඳහා අත්පසටැ එළඹියැහොත් ආපිළිවෙල නො ඉක්මවා දිය හෙළුමෙන් පිටතැ සිටැ සෙනස්න පස්විකා ගෙනැ නො වෙළෙවිවැ අක්දෙරියටනැගී කෙසිවිදට කොටැ නියපිටින් දෙරගසා උකසි පැහැරැ ඇතුළෙහි බිණුවන් නැතහොත් සෙමෙන් අගුල හැරැ දෙර හැරැ ගෙට වැද පාදුකායෙහි කෙලෙයුණු තැන් ඇති නැති බලා දෙර අගුළු ගෙනැ පාදුකායෙහි තැන්පත්වැ සිටැ හන්සිවුරු ගෙනැ හූන්නගු[65] විසින් නො තනනා[66] වස් පවත්වා නොකොරොස් පුසනින් පුසන්කිස සාහා පුසන්කවුළුවෙන් පුසන් පිට තට හැරැ ඉදිවැ පාදුකායෙහි සිටැ හන්යිවුරැ බනා පාදුකාවෙන් පහවැ දෙර හැරැ පාදුකායෙහි කෙලෙසුණු තැන් ඇති නැති බලා ඇතහොත්[67] දෙව ගහළ ඇත, ඇමඳ හැරැ සෙමෙන් නික්මැ දෙර අගුළු ගෙනැ අත්දෙණියටැ ගියකලැ අත්පස් ගෙයි පැවති සෙයින්මැ පිළිපැද ඇතුළටැ වන්කලැ පාදුකායෙහි[68] තැන්පත්වැ සිටැ හන්සිවුරු ගෙනැ හිඳැ ''චපුචපු'' යන අනුකරණ නැති

---

63 චවාගෙණැ (නු.පි.) 22පි
64 උත්කුටකයෙන් (එම)
65 හුන්හු (එම) 24පි
66 නොතතරකා (එම)
67 ඇතහොත් බලා ඇව (එම)
68 පාදුකාමෙහි (මැ.පි.) 159පි

කොටැ නොහඩවා දියකිස සාහානැඟී සිටැ සිවුරු බහා පාදුකායෙන් නැඟී සිටැ පහවැ ගිහිමිනිසුන් කෙළ ඔත් තැන් ඇති නැති බලා ඇත හොත්, දෙව ගහළ ඇත,[69] හැමද දියවටන්හිත්[70] මේ සේමැ පැවැත්ත යුත්තෙයැ.—

## මෙතෙකින් අත්පස් අත්දෙණි දියවටන්හි පිරියැ යුතු වත් සැබෙවින් දක්වන ලදි

---

### (6) තමා ලග්නා සෙනස්නෙහි පවත්නා විධි කෙසේයැ ? යත්

තමා හළ[71] දෙරින්වත් ආගන්තුකයන් අත්රැකැ පිටත් කටයුත්තෙයැ. නොසුරැකි තෙනැ තුබූ පිරිකර සුරැකි තෙනට පහකරන කල ද, පහ කොටැ හමදනාකල ද, පරාගෙ පාසිවුරු පහකරනකලද ගිනියෙහි අත්ලනුවන් සෙයින් විෂඝොර සපුන් වෙරැ අත්ලනුවන් සෙයින් සුරැකී තැනැ තබම්හයි පහකොටැ අමදුම්හ යන ශුද්ධ සිත් එළවා පැවැත්ත යුත්තෙ යැ. නො දක්වා දුන් පිරිකර සොරසිතින් පහකළ පරිජි වන බව දතයුතු. දක්වා දුන් පිරිකර සොරසිතින් පහකළ දරදී බව දත යුත් තේයැ. පසුවැ තමාගෙ ද, හිමියා ගෙ ද, ධුරනිඃකවේ බැවින් පරිජි බව දතයුත්තේයැ. සෙනස්නෙහි මෙරමා තුබූ පිරිකර තමා පහකළ කල්හි හිමියන්ට දක්වා දෙන තාක් තමා රැක්ක යුතු බව දතයුත්තේ යැ. තමා ගැත්තෙයයි සිතා නො හැඳිනැ ගත් පිරිකර හැඳිනි කලැ දක්වා දියැ යුත්තේයැ. සබ්‍රම්සරුන් ද ආසන්නයෙහි ද මහත් කොටැ බණ හදරත් අසනතැන් කියත් කැමැත්ත කටයුත්තෙයැ. ග්‍රන්ථධුර විදර්ශනා ධුර යෙහි යෙදී වාසය කරනු හට ද අපාසුවන කාය වාක් ප්‍රයොග නොකොට යුත්තෙයැ. සක්මන් කරත් සෙනස්නෙහි හුන් සහනටැ අපාසුවන කථාකරත් පිටතට යා යුත්තෙයැ. දෙර වරනකල ද පියාලන කල ද සෙනස්නෙහි හුන් සහනට අපාසු නො වන සේ සෙමෙන් අපිස්ලීලා දක්වා දෙර හැරියැ යුත්තෙයැ. පියා ලියැ යුත්තෙයැ හිඳිනා අස්න සලකා එලඹෙන කලැ අනුන් නො සටා සමාහිත පියොවින් ගොස් අස්නෙහි හිඳිනා කලැ සෙමෙන් අවසර ඉල්වා ගෙනැ හින්ද යුත්තෙයැ. පිරිවහත් හොත් වෙනැ හුන්නවුන්ට අපාසු නොවන සේ පිරිවහා

---

69 දෙවා (නු.වි,) 24පි
70 දියවටන්හි (එම)
71 වළ (මැ.වි.) 160පි

නො කොඳුරා නො තතනා මහත් කොමැ සුසුම් නොලා ඇසෙන ශෂ් මහත් කොටැ අන්පා නොසලා සමාහිත පියොවින් හොත හින්ද යුත්තෙයැ. සේනස්නෙහි හුන් සබ්‍රම් සරුන් බණ ඇසියැටි වූවහොත් තමාගෙ ශබ්දයෙහි තමාහට රාග නො උපදනා සේ අනුන් රාග නොකරන සේ ගිහි මිනිසුන් අවඥ නොකරන සේ ඇසුවන්ගෙ ළයලා කියනු උගන්නා සේ තමහට උපන් සමාධිය නො පිරිහෙන සේ අකුරැ දික්කොටැ ගීත ස්වරයෙන් නො කියා පරිමණ්ඩල වූ පදව්‍යඤ්ජනයෙන් උච්චාරණ ශුද්ධ කොටැ පිරිවියැ යුත්තෙයැ. තිරච්ඡාන කථා නො උපදවියැ යුත්තෙයැ. නො දූන කුළ බිණු වරදකට දූහැවිවූව වහා ක්ෂමා කටයුත්තේයැ. සතනයෙන් නවකයන් ආගන්තුකයන් සෙයින් වාසය කටයුත්තෙයැ. සෙනස්නෙන් පහවත්හොත් එසෙන-ස්නෙහි රැකවල් යම් කෙනෙකුන් පමණ විනම් ඔවුනට දක්වා දියැ යුත්තෙයැ. නො එසේ වුව ගනමනානාක් අගුළු ගෙනැකෙසි රැක්ක යුත්තේය. එරක්නට* නිස්සනට හො දක්වා දියැයුත්තෙයි

## මෙතෙකින් තමා ලග්නා සෙනස්නෙහි පවත්නා විධි සැබෙවින් දක්වන ලදි

---

### (7) සහසතු ඈවත්හි පවත්නාවිධි කෙසේයැ? යත්:—

සහසතු අරමුදු, අරම කරන්නට නිසි බිමුදූයි දක්වන ලද පළමුවන ගුරුබඩ ද ; වෙහෙරදු, වෙහෙර කරන්නට නිසි බිමුදූයි දක්වන ලද දෙවන ගුරුබඩ ද ; හැඳ පුටු බිසි කන්වයින් ඈ තුන්වන ගුරුබඩ ද; ලොහො සැළ ලොහොකටාරම් ලොහො පැණ කෙටේරි වෑ පොරො උදළු නියන් ඈ සතරවන ගුරුබඩ ද ; වේවැල් ඈ වැලුදු, රණ හුණදු, ගෙ සොයන තණ ද, මැටියෙහි කළ දඬුයෙහි කළ පිරිකරදූයි දක්වන ලද පස්වන ගුරු බඩ ද; නොද තමා ගතයුත්තෙයැ. නොද අන්නට දියයුත්තෙයැ. නොද පුහුලි කොටැ පරිභොග කටයුත්තෙයැ. නොද බෙදගත යුත්තෙ-යැ. සොරසිතින් ගත අන්නට දුන පරිජී වෙයි. ඉසුරු පමුණුවා දුන දර දී වෙයි. මෙහි තාවුරුවතින් නොතාවුරුවත් නොද ගතයුත්තෙයැ. චොනෝ වටනාක් දී මදවටනාක් නොද ගතයුත්තෙයැ. මෙහි තාවුරුවත් තමහට ගණුත් අන්නටැ ගෙනැ දෙත් වඩනාක් කට

( * මැ.වි. සංස්කරණයෙහි නොපෙනේ.)

යුත්තෙයැ. සඟහනට පිරිනැමුණු ලාභයක් ගණපුගුල් දගබ් මහබෝ ආදියට නො පිරිනැමියැ යුත්තෙයැ. එයටැ පිරි නැමුණු ද අනෙක් ගණනකටැ නොපිරිනැමියැ යුත්තෙයැ. සඟසතු සෙනසුන් පිරිකර පිළිබඳ ගුරුබඩ සිවුරු ආදී තුන් පසයෙහි නොඔත යුත්තෙයැ. ඒ තුන් පසයැ පිළිබඳ නොතාවූරුවත් වුවත් තමන් තන්හිමි බැව්නුදු දායකයන්ගේ අදහස් වැනිව ද අනෙකකට නො පිරිනැමිය යුත්තෙයැ. එබැවින් එවිනා වත්මනුයෙහි එසිමැ ඇතිනාක් දෙනා හිමි වූ නොතාවූරුවත් සෙනසුන් ආදියැ ඔවුන් සඟනට වළඳ නොවේ නම් වළඳකටැවියො නැත්නම් එහිමිනාක් දෙනා සිත ඉපද ගිවිස්ස ඔතයුත්තෙයැ. සෙනසුන් දාගැබ් මහබෝ ඈ පිළිබඳ වත් සොරසිත නැතිවැ වැම්කළ පසු තන් කටයුත්තෙයැ. බොහෝදෙනා ගිවිසිකල ඔවුන් හැම දෙනාමැ තන් කට යුත්තෙයැ. සඟසතු සෙනසුන් හැඳ පුටු ආදියැ මහලු පිළිවෙල නො ඉක්මියැ යුත්තෙයැ. සඟසතු පිඩු ආදී තුන්පසය උවසර සිමින් ඇතුළු වූ නාක් දෙනා හා සමකොටැමැ බෙද වළඳ කටයුත්තෙයැ. හැම දෙනාහට නො සැප වෙත් වරින් සැපැවියැ යුත්තෙයැ. සඟසතුවත්හි විධාන කරනුවන් විසින් සිහි නුවණ එළවා විනයානුකූල කොටැ පැවැත්ත යුත්තෙයැ. එසේ පැවැත්මෙහි සැක නො කටයුත්තෙයැ. සඟසතු වත්හි විධානකරනුවන් විසින් එයින් වරද ඇත නැතැයි සැක නො කටයුත්තෙයැ. එයින් වරද නැති.

එබැවින් සඟසතුවත්හි මෙනම් මෙනම් දැ කළ මැනවැයි පිහිටුවන තෙනා ද වරදවා පැවැත්තහොත් පරිජි ආදී වන බැවින් කුකුස් කළමනා තැනැ. එහි කුකුස් නො කරනුයෙ එක් බාලයෙකැ. සඟසතු වත්හි මෙනම් දැ කළ මැනවැයි නොවිචාරන තෙන ද මෙමැ කළ මැනවැයි නො පිහිටුවනි තෙන ද පාරාජිකාදී අසම්භ වන බැවින් කුකුස් නො කළමනා තෙනැ. එහි කුකුස් කරනුයෙ එක් බාලයෙකි. උක්ත වැනො මෙමැ අර්ථයැ :— "ද්වෙ මෙ භික්ඛවෙ! පුග්ගලා බාලා කතමෙ? ද්වෙ. යො ච කුක්කුච්චායිතබ්බං නකුක්කුච්චායති. යො ච න කුක්කුච්චායිතබ්බං කුක්කුච්චායති ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ පුග්ගලා බාලා" යි පාඨ දක්වා; "කථං කුක්කුච්චාධිතබ්බං න කුක්කුච්චායති? සඞ්ඝිකස්ස විචාරණං. පට්ඨපනං ඉදං කුක්කුච්චායිතබ්බං.. තස්මිං න කුක්කුච්චායති. කථං න කුක්කුච්චායිතබ්බං කුක්කුච්චායති? සඞ්ඝිකස්ස අවිචාරණං අපට්ඨපනං ඉදං න කුක්කුච්චායිතබ්බං නාම, තස්මිං කුක්කුච්චායති" යී අර්ථවිචාරණ කළ බැවින් සඟසතු සෙනසුන් හැඳ පුටු ඈ පනවනුවහු විසින් මොහු අප කෙරෙහි විස්වස් ඇත්තාහයි ඡන්දයෙන් අගතියට ගොස් මනා සෙනසුන් ඈ නොද

පැනවිය යුත්තෙයැ. මොහු අප කෙරෙහි නොවිසිය[72] මනාහයි ද්වේෂයෙන් අගතියටැ ගොස් නොතැන්පත් සෙනසුන් කොටැ නොද පැනවියැ යුත්තෙයැ. මොහු විෂමයහ බලවත්හ මනා සෙනසුන් ඇ නොපැනවූව තමහටමැ උපද්‍රවයැයි භයින් අගතියටැ ගොස් ඔවුන්ට නොපත් සෙනසුන් ඇ නොද පැනවියැ යුත්තෙයැ. සෙනසුන් ලද්‍දුවන්[73] නොලද්‍දුවන් නොහැඳින නොද පැනවියැ යුත්තෙයැ.

මෙසේමැ බත් බෙද දෙනුවහු විසිනුදු හඹු බෙද දෙනුවහු විසිනුදු; ඛජ්ජක බෙද දෙනුවහු විසිනුදු ; ඵලා'ඵල බෙද දෙනුවහු විසිනුදු; යටත් පිරිසෙයින් හිඳිකටු බෙද දෙනුවහු විසිනුදු ; ඡන්දදීන් අගතියටැ ගොස් නොබෙද දියැ යුත්තෙයැ. කුමක් කටයුත්තෙය? යත් :— දයකයන් විසින් දෙන ලද දෙයැ ලබන්නටැ නිස්සො ලබති. මෙහි මැදහත්වැ දෙලෝ නොවැරැද්ද වුව මැනවැයි සිතා පැවැත්ත යුතු. ආරාමිකයනටැ කම්යන් ඕනනු විසිනුදු මොහු අප කෙරෙහි[74] විස්වස් ඇත්තාහයි ඡන්දයෙන් අගතියටැ ගොස් ඔහු මෙහෙ නොගෙනැ නොද පිරිහෙළියැ යුත්තෙයැ. ද්වේෂයෙන් අගතියටැ ගොස් වඩා මෙහෙනොද කැරැවිය යුත්තෙයැ. මොහයෙන් අගතියටැ ගොස් ඔහු මෙහෙ නො-ගෙනැ නො පියැයුත්තෙයැ.[75] මේ කළවුන් නො කළවුන් නොහැඳිනැ මෙහෙ නොදකැරවියැ යුත්තෙයැ. මෙ හැම තෙනැ අගතියටැ ගිය හට කිමෙක් වෙයි? යත් ;— නරකයෙහි උපත් වෙයි. එබැවින් මෙකී තාක් තෙන වරදවා පැවැත්ත නරකයෙහි නො උපත ද එහි සිටුවාක් හු[76] වැනි වෙයි. මෙද ආයෙමැනො

''පඤ්චහි භික්ඛවෙ! අඞ්ගෙහි සමන්නාගතො සෙනාසන පඤ්ඤාපකො යථා'භතං නික්ඛිත්තො එවං නිරයෙ; කතමෙහි? පඤ්චහි: ඡන්ද ගතිං ගච්ඡති ; දොසාගතිං ගච්ඡති මොහාගතිං ගච්ඡති භයාගතිං ගච්ඡති පඤ්ඤත්තා, පඤ්ඤත්තං න ජානාති; ඉමෙහි ඛො භික්ඛවෙ! පඤ්චහි අඞ්ගෙහි සමන්නාගතො සෙනාසන පඤ්ඤාපකො. යථා' භතං නික්ඛිත්තො එවං නිරයෙ.

---

72 නොසිය (මැ.වි.)163පි
73 ලද්‍දුවන් නොලද්‍දුවන් (ම.වි )27පි
74 මෙ අප කෙරෙහි ... (නු.වි.)27පි
75 නොදපිරිහෙළියැයුත්යේයැ (එම)
76 සිටුවුවාක්හු එම)

පඤ්චහි භික්ඛවෙ! අංගෙහි සමන්නාගතො භත්තුද්දෙසකො යථා' භතං නික්ඛිත්තො එවං නිරයෙ; කතමෙහි? පඤ්චහි ; ඡන්දගතිං ගච්ඡති දොසාගතිං ගච්ඡති මොහාගතිං ගච්ඡති භයාගතිං ගච්ඡති උද්දිඨානුද්දිට්ඨං න ජානාති. ඉමෙහිඛො භික්ඛවෙ! පඤ්චහි අංගෙහි සමන්නාගතො භත්තුද්දෙසකො යථා'භතං නික්ඛිත්තො එවං නිරයෙ.

පඤ්චහි භික්ඛවෙ! අංගෙහි සමන්නාගතො යාගු භාජකො ඵලභාජකො ඛජ්ජකභාජකො යථා'භතං නික්ඛිත්තො එවං නිරයෙ ; කතමෙහි පඤ්චහි:—ඡන්දගතිං ගච්ඡති දොසාගතිං ගච්ඡති මොහාගතිං ගච්ඡති භයාගතිං ගච්ඡති භාජිතාභාජිතං නජානාති ; ඉමෙහි ඛො භික්ඛවෙ! පඤ්චහි අංගෙහි සමන්නාගතො යාගුභාජකො ඵලභාජකො ඛජ්ජක භාජකො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ—

පඤ්චහි භික්ඛවෙ! අංගෙහි සමන්නාගතො අප්ප මත්තක විස්සජ්ජකො යථා'භතං නික්ඛිත්තො එවං නිරයෙ කතමෙහි? පඤ්චහි:— ඡන්දගතිං ගච්ඡති දොසාගතිං ගච්ඡති මොහාගතිං ගච්ඡති භයාගතිං ගච්ඡති විස්සජ්ජිතා' විස්සජ්ජිතං නජානාති; ඉමෙහි ඛො භික්ඛවෙ! පඤ්චහි අංගෙහි සමන්නාගතො අප්පමත්තක විස්සජ්ජකො යථා'භතං නික්ඛිත්තො එවං නිරයෙ—

පඤ්චහි භික්ඛවෙ! අංගෙහි සමන්නාගතො ආරාමික පෙසකො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ; කත මෙහි පඤ්චහි :— ඡන්දගතිං ගච්ඡති දොසාගතිං ගච්ඡති මොහාගතිං ගච්ඡති භයාගතිං ගච්ඡති පෙසිතා පෙසිතං න ජානාති ; ඉමෙහි ඛො භික්ඛවෙ! පඤ්චහි අංගෙහි සමන්නාගතො ආරාමික පෙසකො යථා'භතං නික්ඛිත්තො එවං නිරයෙ''යි—

**මෙතෙකින් සඟසතු ඇවත්හි පවත්නා විධි සැබෙවින් දක්වන ලදී**

---

**(8) මතක පිරිකර පවත්නා විධි කෙසේයැ[77]? යත්:—**

පරා ගැති විස්වයින් ගන්නා කලැ දුටුවිරූ මිතුරන් ගැතිවත් ඔවුන් නොමළහොත් ගත්කලැ සතුටුවත් ගතයුත්තේ යැ. දළ මිතුරන් ගැතිවත් ඔවුන් නො මළහොත් ගත්කලැ සතුටුවත් ගත යුත්තේයැ.

---

77 කිසෙයැයත්? (එම)29වි

"අප අයිනි කැමැත්තක් කරව"යි පැවරුකලැ ඔවුන් නොමළහොත්[78] ගන්කලැ සතුටුවත් ගතයුත්තේයැ. පස්සග.ධැමියන්කෙරෙහි දුටුවිරු මිතුරනුදු දළ මිතුරනුදු පැවරුවනුදු ගැතිවත් විස්වසින් ගන්නාතුරු ඔවුන් මළහොත් සාංඝිකවන බැවින් නොගත යුත් තේයැ. "අපගෙ පිරිකර තොපටදෙම්හ"යි කීකලද,"තොප්හැතිකොටැ ගන්ව"යි, කීකලද දුන්නානම් නො වන බැවින් ඔවුන් මළහොත් සංඝිකවන බැවින් නො ගතයුත්තේයැ. "අප මළහොත් අපගේ පිරිකර තොප ගන්ව"යි. කී කල එහි ගිහි මිනිසුන් අයත් ගත හැක්ක. සඟුන් අයත් සාංඝිකවන බැවින් නොගත යුත්තේයැ. මෙහි භික්ඛුණී සික්ඛමානා සාම ණෙරීන් අයත් පිරිකර මාගම් සඟුන් පමණ වෙයි. භික්ඛු සාමණෙර දෙදෙනා අයත් පිරිකර පිරිමි සඟුන් පමණ වේ. "මාගැති පිරිකර තොපට දෙමි"යි,"දින්මි"යි දුන් කලැ දූනනම්. මළද,නො මළද,ලදුවන් ගැතිවෙයි. "තොපට දෙමි"යි "තොපට ගැතිකරමි"යි.[79] දියැවි සිතින් කීකලැ "ඉතා මැනවැ මාගැත්තේයැ"යි ගන්කලදු, ගත්නාමැ වේ. මෙ මෙසේ වන බැවින් දනලක්ෂණ යෙන් නුදුන් පිරිකර පළමුකී කලැ සෙයින් දයකයන් කෙරෙහි විස්වසින් ගතයුත්තේයැ. දනලක්ෂණයෙන් දුන් පිරිකර ලබන්නාහු මියන්හොත් නොමියනතුරු ඔහුකෙරෙහි විස්වසින් ගතයුත්තේයැ—

මෙකීසෙයින් නුදුන් නොගත් පිරිකර තබා මළ හොත් එපිරිකර පළමුකීසෙයින් සිමැ ඇතුළුවූනාක් දෙනා බෙදගත යුත්තේයැ. උවසර සිමැ ඇතිනාක් දෙනා එක්කෙනෙකුන්ට දුන්නුනම්, දුන්නානම්වෙත් යම්කලෙකැ හුදකලාවුවහොත් කොටස්කොටැ බෙද තබා ගෙඩි ඇත. ගෙඩිගසා නැතහොත් ආගන්තුකයන් බලාහිඳැ ආවන් නැතහොත් මෙමට පැමිණෙයි, එක් කොටසක් ගතයුත්තේයැ. වැලිදු බලාහිඳැ ආවන් නැතහොත් මෙයිදු මට පැමිණෙයි, ගතයුත්තේයැ. මෙසේ ගන්කලැ වැලිදු මතක පිරිකර බෙදත තැනින් කොටසක් ලැබේ. නොබෙද එක්කොටැ තබා පළමු කීසෙයින් ආගන්තුකයන් බලාහිඳැ නොආකලැ මෙමට පැමිණෙයි එකවටකැ පාවාගත් නමුදු ගත්තානම් වෙයි. මෙසේ ගන්කලැ වැලින් මතකපිරිකර බෙද තැනින් කොටස නොලැබෙයි. පරාජිලිබද පිරිකර ගෙනැ අධන්මග පිළිපන් කලැ පිරිකර හිමියන් මළ හොත්, මළහයි යනු ඇසූවහොත්, ආසන්න

78 නොමළකලැහොත් (ෆැ.වි.) 166පී
79 තොපට ගැති කරත්වයි (නු.වි.)29

යෙහි සඟුන් ඇති වෙහෙරකටැ එළඹැ පළමු කීසෙයින් පිළිපැද්ද යුත්තේ යැ. සඟුන් වෙහෙර නැතහොත් පළමු කී සෙයින්[80] පමුණුවා ගත යුත්තේ යැ. හෙරණ පැවිද්දෝ වනාහි මේ කීසෙයින් නො මියනතුරු විස් වසින් ගන්නට තිස්සභ, දෙනකලැ වනාහි භාග ලැබෙති—

**මෙතෙකින් මතක පිරිකර පවත්නා විධි දක්වන ලදි**

---

**(9) කුලගම් එළැඹෙනුවහු විසින් එළැඹියහු විසින් පිරියැ යුතු වත් කිසේය? යත්:—**

කුලගම් එළැඹෙන වෙලේ හඳනාසිවුරු පළමු කී සෙයින් වට කොටැ පිළිසන්වැ හැඳැ සහලසිවුරු පෙරවැ ගම්වැද එක්තෙනකැ සිටැ අතුරු වෙයැ උවදුරු ඇති නැතිබලා ඉක්බිති අත්නොසලා පානොසලා සිනාවට නිසිතන්හි සතුටු පමණකින් මහත්සේ නොසි දෙළොස් රියනකටැ ඇසෙනසේ මහත්කොටැ නොබැණැ කයත් දසරුවත් නොසලා කර ඉදිකොටැ ඉස ඉඳුවා උකුලෙහි අත නොතබා හිසින්වටා නො පෙරවැ විළුඹෙන් නො ඇක්මැ විය දඬුපමණින් වඩා නොබලා සමාහිතවැ ඇතුළු වෙහෙර සිටැ යන්නහු විසින් දොරටැ සැපත්කලැ සෙනහට ඉතා නුදුරුවැ ආසන්න නොවැ ගෙට ඉදිරිවැ සිටැ හූ කටිනා මාගමක හුයක් කැටැ හෝනා[81] පමණ කලක් සිටැ බික නො අළහොත් ගෙය බලා ගෙයි සිටියවුන් බඳුත් පිරිමදුත්හොත් සරළු කෙනෙසි ගණුත්හොත් බලා බික අළහොත් වමතින් සහලසිවුර පටලා සිටියන් පහකොටැ දෝතින් බික සිඟනපය ගෙනැ බිකගෙනැ සූපාදී දෙනු නොදෙනු බලා නොදෙනසේ හැඟුන වමතින් සිවුරුපට ගෙනැ පාමුව වට වසා මෙ කී සෙයින් දොරදොර සිටැ සිඟනුවහුවිසින් යපෙන පමණක් සිඟාගෙනැ කුලගෙයි උපාසකයන් විසින් නවතා ගෙට වැඩුව හොත් තම හටපත් අස්නෙහි අත ඔබා විමසා බලා සුපිළිසන්වැ හිඳැ අත් නොසලා පා නොසලා සිනාවට නිසිතන්හි සතුටු පමණකින් වඩා නොසී දෙළොස් රියනකට ඇසෙනසේ මහත් කොට නොබැණැ කයද දසරුවද නොසලා කය ඉදිකොටැ ඉසැ ඉඳුවා උකුලෙහි අත් නොතබා ඉසින්වටා නොපෙරවැ අතින්හෝ සිවුරෙන් හෝ අකවටු නොගන්වා වියදඬු පමණකින් වඩා නො බලා සමාහිතවැ ඉඳැ එළවූ අහර ගෙනැ පළමු කී සෙයින්මැ පරිභෝග කොටැ දුහැටිකිස නිමවා අතීත පස්විකුන් සඳහන්

---

80 කීසෙන් (එම) 30වි
81 කැටැ හෙනා (මැ.වි.) 167වි

කොටැ හුනස්නෙන් නැඟීසිටැ හුනස්න දක්වා පළමු කිසෙයින්මැ සමා හිත පියොවින් වෙහෙරටැ අවුත් සහළසිවුර මැද නොබිදෙනසේ සතර හුල ක්[32] උස්කොටැ තබා හකුළුවා සිවුරු වසැ තබන කලැ එකතින් සිවුරු ගෙනැ එක්අතකින් සිවුරුවසපිසැ බිත්දසාවට[83]නුවා ගෙකුසට හොග වනසේ සිවුර තබා පයද- වියලා මනාකොටැ අවදක්වා යට හැදෙක තබත්හොත් එක් අතකින් පය ගෙනැ එක් අතකින් පය තබනතැන නියම කොටැ පය සිවි නොනස්නාසෙ කිසිවක් අතුට පාමුවච්චින් තිබියැ යුත්තේයැ—

**මෙතෙකින් කුලගම් එළැඹෙනුවහු විසින් එළඹියහු විසින් පිරියයුතු වත් සැකෙවින් දක්වන ලදි**

---

**(10) තමා ලග්නා වෙහෙරින් අනෙක් වෙහෙරට එළැඹෙනුවහු විසින් පිරියැ යුතු වත් කිසේය? යත් :—**

අනෙක් වෙහෙරකට එළඹෙනුවනුවිසින් තමාලැගි වෙහෙරවන් ආවාසිකයන් ඇත, ඔවුනට දක්වා දියැ යුත්තේයැ. නොහොත් සෙනසුන් සොධනවත්හි කී සෙයින් සෙනසුන් සොධනකල හැඳපුටු ඇත, වේයන් නොකන හැකි සේ පහණපිට[84]තබා පුවරුකඩ පත්කඩ ඇළ ඇඳ පුටුමත්තෙහි තබා නොහොත් උඩුමහල් ඇත, එහි තබා පිදූ මල්ඇත, හැමදැ හැර පාපිස්නියදූ පිටතැ තුබූ බණසුන් සෙනසුන්ද ඇතුළෙහි තබන්ට නිසි සෙනසුන් පිරිකර ඇතුළෙහි තබා අගුළු ගෙනැ සෙනස්න වට ඇවිද, දෙරකවුළු ඇත, බලා අත්පස් ගෙය හැමදැ වේයන් නැගෙන්නට නිසිවැ තුබූ කවුළුවෙන් පීහුසන්දුරුකොටැ හැර ඇතුළෙහි තුබූ පුසනුදු මුසුනුදු නො නස්නාසේ තබා අත්දෙණි දියවටනුදු හැමද මෙකී සෙයින් තැන්පත් කොටැ තබා මලු හැමදූ පුවරුගහා වෙහෙර පිටැත ලූවන් බලා සහවා කෙසි රක්නවුන්ට[85] දක්වා ''කරණියමෙත් සුත්'' සඳහත් කරනුවහු විසින් එළඹියැ යුත්තේයැ –

**මෙතෙකින් තමා ලග්නා වෙහෙරින් අනෙක් වෙහෙරකට එළැඹෙනුවහු විසින් පිරියයුතු වත් සැකෙවින් දක්වන ලදි**

---

82 අතගුලක් (හු.වි.)31වි
83 බිතතු (එම)
84 පවාන පිට (එම)
85 කෙසිකරන්නවුන්ට (හු.වි.31) මැ.වි. 169වි

**(11) එළැඹුනු වෙහෙර පිරියැයුතු වත් කිසේය? යත්: —**

ආගන්තුකවැ අනෙක්වෙහෙරකටැ එළඹෙනුවහු විසින් උවසරසිමින්[86] පිටතැ පයලූ වහන් ඇත හිසට කළ සත් ඇත සිවුරු ඇත, පහකොටැ, ''කරණියමෙත් සූත්'' සඳහන් කෙරෙමින් ආවාසයට වැදැ පාසිවුරු තිබූවමනා තන්හි තබා පැන් පොකුණෙහිදු පැන් කෙම්හිදු පා නොදෙවැ ආවාසිකයන් පිළිවිසැ පරිභොගයට නිසි දියෙන් පාදෙවැ මහලු සබ්‍රම්සරුන් වැඳැ ලග්නාසෙනසුන් ඉල්වා ගෙනැ වාසය ඇති සෙනස්නෙක් වීනම් හැමඳු වාසය කටයුත්තෙයැ. වාසය නැතිවැතිබූ සෙනස්නෙක් වීනම් කෙසිසිදට කොටැ නියපිටින් දෙරගසා ඉක්බිති දෙරවරුක් කිම්දෝහෝ ?යි කියා කෙසි විවර අගුළුහැර මඳක් බලා සිටැ ඉක්බිති එහි මූසවැ හොත් සත්කෙනෙකුන් ඇත, යාහැකි සේ දෙරසිඳින් පහවැ සිටැ දෙර මඳක් හැර ඉක්බිති දෙර වැර බිමද උඩ ද බලා ගෙටවැදූ කවුළු හැර සෙනසුන්සොධන වත්හි කීසෙයින් සෙනස් නෙහි වත් සපයා සෙනසුන් ගුත්තියැ තුබුව මනා සෙනස්නෙක් වීනම් සෙනසුන් ගුත්තිය තබා වෙහෙර වැටෙන විනයානුකූලවූ කතිකාවතුදු කුලගමුදු පිළිවිස්වා වාසය කටයුත්තේයැ.

**මෙතෙකින් එළඹුණු වෙහෙර පිරියයුතු වත් සැබෙවින් දක්වන ලදි.**

---

**(12) තමාලග්නා වෙහෙරට වැඩි ආගන්තුකයන් කෙරෙහි පවත්නා විධි කෙසේයැ? යත්:—**

ආවාසිකයන්විසින් ආගන්තුකයන් පෙරමගැ දකිත්මැ පෙර ගමන් ගොස් පාසිවුරුගෙනැ තැන්පත් කොටැ තබා හිඳිනා අසුන් පණවා මඩාහිඳුවා දහනිවා පන්සලා නොදෙවි පාතබන පාදපීඨද, දෙවිපාතබන පාදකඨලිකාද, පාදෝනා දියද එළවා පාදෙවිකලැ ආගන්තුකයන් දස ැවෙහි 3ටැ රුජා ඇත, කැමැත සම්බාහන කොටැ පැන්පවස් පිළිවිසැ

---

86 සිමන් (මැ,වි.)169වි

කැමැත පැන් වළඳවා පයැ තෙල් ගල්වා සෙනසුන් පණවා සෙනස්න වත්[87] වෙලා ද අත්පස් අත්දෙණි දිය වටනුද කතුරු යටදු එළඹුනමනා කුලගම් ද වෙහෙර වැවෙන විනයානුකූල කතිකාවතුදු, කුලගමුදු කියැ යුත්තෙයැ—

## මෙතෙකින් තමා ලග්නා වෙහෙරටැ වැඩි අගන්තුකයන් කෙරෙහි පිරිය යුතු වත් සැබෙවින් දක්වන ලදි

**(13) ගිලනුන් කෙරෙහි පිරියයුතු වත් කෙසෙනි? යත්:—**

ගිලන් වූ සිල්වත්හට පස්සහධැමියන් විසින් සතරපසයෙන් අත්පා මෙහෙයෙන් සැපවීයැයුතු වත්[88] කෙසෙ? යත් :- "මහණෙනි තොපට උපස්ථාන කරන මවු නොද ඇත, පියා නොද ඇත, ඉදින් තෙපි[89] ඔවුනොවුන්ට මෙහෙ නොකරන්නා හු[90] වීනම් අනෙක් කවුරු තොපට මෙහෙ කෙරෙති. යමෙක් මාගෙ අවවාද අනුශාසනායෙහි පවතිත්ද ඔහු විසින් ගිලන්හට මෙහෙ කටයුත්තෙයැ. යමෙක් ගිලන් වීනම් වත්පද දුන් වත්තෙරුන් ඇත ඔවුන් විසින් දිවිහිමි යෙන් ලෙඩ මනාවනතාක් මෙහෙ කටයුත්තෙයැ. නිස දුන් ඇදුරු තෙරුන් ඇත වත්පද ගත් සෑඩිවිහාරිකයන් ඇත නිසගත් අන්තේවාසිකයන් ඇත, ඔවුන් විසින් උපස්ථාන කටයුත්තෙයැ. ඔවුන් හැමදෙනාමැ නැතහොත්, සබ්‍රම සරුන් විසින් උපස්ථාන කටයුත්තෙයැ, නො කළහොත් දුකුළා ඇවැත් වෙ"යි වදළ බැවින් පස්අඟින් යුත් ගිලන් උවටාවන් ගිලන් හට මෙහෙ කරන්ට නිසි වෙත්.

ඒ කවරේද? යත්:—ගිලන්හට හිත බෙහෙත් නියත කොටැ සංවිධාන කරන්ට නිසිවේද, ගිලන්හට මෙ සැපය මේ අසැපය යනු දැනැ සැප වූ බොජුන් ආදී එළවාද අසැප වූ බොජුන් ආදී පහකෙරෙද, මෙත් කුළු ණෙන් යෙදී පාසිවුරු[91] ආදී නොතීසා මෙහෙ කෙරෙ ද, සිරුරු වළඳ ගත් වටින් කෙළ-දු නැගුබත් ආදිදූ පියන කලැ පිළිකුල් නැති වේද, ගිලන් හට කලින්කලට බණකියන්නට නිසිවේද යන මේ පස්අඟින් යුත් ගිලන් උවටා ගිලන්හට මෙහෙකරන්නට නිසිවේ. මේ කීවාට විපිරිත අඟින් යුත් ගිලන් උවටා ගිලන් හට මෙහෙකරන්ට නොනිසි වේ.

---

87 සෙනස්නවටවත්වෙලාද (නු.වි.)32වි
88 සැපියැයුතුවත් (එම)
89 තොපි (එම)
90 නොකරණු (එම)
91 පත්සිවරු (ලම) 34වි

පස්අඟින් යුත් ගිලන් උවටාවන් විසින් මෙහෙකරන්ට නිසිවේ. ඒ කවරේ? යත්; සැප වූ ආහාර විහාරාදියැ පවති ද, සැප වූ ආහාර විහාරදියැ පමණ දැනැ උනු'තිරි නො කොටැ පවත්වා ද, හිතපිළිවෙළ බෙහෙත් එළ වූ කලැ[92] වළඳා ද තම හට හිකකැමැති ගිලන් උවටාවනට ඇතිතාක් ලෙඩ නොවළඳා වඩනා ලෙඩවඩනා සේ නො වඩනා ලෙඩ නො වඩනා සේ කියා ද සිරුරැ උපන් තියුණු වූ කැකුළු වූ නො මිහිරි වූ දිවි නො තිබෙන පමණ වූ ලෙඩ අධිවාසනා කෙරෙ ද මෙ පස්අඟින් යුක් ගිලන් උවටාවන් විසින් මෙහෙකරුන්ට නිසි වේ. මේ කීවාට විපරීත අඟින් යුත් ගිලන් උවටාවන් විසින් මෙහෙකරන්නට නො නිසි වේ. ගිලන් උවටාවන් විසින් ගිලනුන් යම් දුකකුදු විඳින් මළදහයි නො සිතා කුළුණු නුවණින් යෙදී ලෙඩ මනාවුව දහයි සිතා දිගාවැ පවතිත්වයි.සිතා මෙහෙ කටයුතු, ගිලනුන් හා කථා කරනුවන් මළදහයි යන සිත් ඇතිවැ කථා නො කටයුතු. එසේ සිතූ සිතින් නරකයෙහි උපත්වෙයි. මොහු තමා කීවා සිතින් ගෙනැ මියන්නාහු විනම් පරිජි වෙ—

## මෙතෙකින් ගිලනුන් කෙරෙහි පිරියයුතු වත් සැබෙවින් දක්වන ලදි

මෙසේ සැමවත් පුරණුවහු විසින් හැමගුණයට මුල් වූ හිරිඔතප් දෙක්හි ඉන්ද්‍රියසංවරයෙහි පළමු පිහිටා අරිවස්හි කීසෙයින් අපිස් සතොස් යමල් ගුණයන් එළවා තමහට වත්අංග සමාදන්වැ කෙලෙසුන් පළා පෙරයමෙහිද සිට සක්මන් කොටැ පස්නීවරණයන් දුරුකොට රිසි යෙන කමටහනකින් දවස් යවා මැදියමැ දකුණැළයෙන් හෙවැ සිහිනුවණ එළවා මනසිකාර යෙන් යෙදී අලුයම නැගෙමිය යන සිත්ඇතිවැ නිදි ගෙනැ[93] පුබුදුනා කලැ නිදිපෙරට ගත් කමටහන් සඳහන් කෙරෙමින් පිබිද හිඳැ අලුයමැ සිට සක්මන් කොට රිසියෙන කමටහනින් දවස්යවා මහලු සබ්‍රම් සරුන්ට වත් දක්වා දැහැටි දියදී හිදිනා අසුන් පණවා නිදිගත් පත්කඩ සඳහන් කොටැ නහන සෙනස්න හැමදූ බොජුන්හල කළමනාතාක් වත් සපයා පෙරවරුද පස්වරුද පැන්බඳනෙහි කළමනා තාක් වත් සපයා සතරපසය ආදිකොටැ දුක් වූ කෙළෙස් තන්හි අහිකුණප පිළිකුල් ආදී අර්ථ ද අනර්ථ ද නියම කොටැ අනර්ථ පිළිබහා අර්ථ සයනා බැවින් සාත්ථකසම්පජඤ්ඤයෙන් යෙදී, අර්ථ ඇතිදු කැලැ

92 හෙළ වූ කලැ (එම)
93 දයස් ගෙණැ (එම) 35වි

සැප අසැප රූපාදිය නියත කොට, අසැප පිළිබඹා සැප සෙවනහු විසින් සප්පායසම්පජඤ්ඤයෙන් යෙදී ; මේ හැම තන්හිමැ කමටහන් මෙනෙහි කරනුවන් විසින් ගොචර සම්පජඤ්ඤයෙන් යෙදී ; මෙ හැමතන්හිමැ මෙකී තාක් සිතසැපයෙන පස්කදින් පිටත් ආත්මාදී නම් නැති කම් ඇ පසයෙන් උපදනා දහම්හුමැ නොපමා බැව් පිණිසැ මෙසේ පවත්තී සලකණ විසින් අසම්මොහසම්පජඤ්ඤයෙන් යෙදී හැම අකුසලින් දුරුවැ හැම කුසලුන් පුරන්නහු විසින් තමාගේ අධිමුක්ති වූ පරිද්දෙන් තුන්බොධියෙන් එක්තරා බොධියකටැ පැමිණියැ යුතු—

හෙරණසිඛ විනිස නිමි.

# හෙරණසිඛ විනිස ගැටපදය

අග්දෙරිය ( <අග්ගද්වාර) ... ඉස්තෝප්පුව ; පිළ

අකවටුනොගන්වා ... අවුළුවා නොගෙන ; පටලවා නොගෙන

අගුළ්ගෙනැ ... අගුළ්ලාගෙන; වසා ගෙනැ

අත්තානුවාදභය ... තමාට තමා විසින්ම දෙස් නගා ගන්නට සිදුවෙතැයි බිය; පසු තැවීමට හේතු වෙතැයි බිය (උශ්‍රු. 2 බ.)

අටඟසමන්නා පස්විකාගෙනැ අංග අටකින් යුත් ප්‍රත්‍යවෙක්ෂාව කර (උ.ශ්‍රු. 2 බ.)

අත්දෙව ... අත්සෝද

පසාව ... පස්

අත් පස් ... මළ, වර්චස්

අත්පස් ගෙයි ... වැසිකිළියෙහි

අත්රැකැ ..., දිවි රැක (උ.ශ්‍රු. 3 බ.)

අත්ලනුවන්සෙයින් ... අත්දන්නවුන් සෙයින්

සතරහුල ... අහල් හතර

අතුට ... අතුරා / අතුර (ඇතිරීමෙහි)

අත්සැතකියාපැමෙන් ... අත අවියක් මෙන් අමෝරා තර්ජනය කිරීමෙන් (?)

අනාවිහිතනුවූනම් ... අනාකරුණකට සිත් යොමු කර නැතිනම්

අනුන් ගැතිවත් ... අනුන් අයත් වස්තු

අද්දෙණි ... පස්කිස නිමවා "අකපය සෝදන තැන මළ පහකිරීමත්, සේදීමත් එකම කුටියේ කරන සිරිත ඇති වූයේ මෑත කාලයේදීය. පෙරදවස ඒ කරුණු දෙකට වෙන් වූ කුටි දෙකක් විය.

අධන් මග ( <අද්ධාන මග්ග)... දීර්ඝ මාර්ගය

අධිමුක්ති ... බලාපොරොත්තුව

අධිවාසනා ... ඉවසීම

අපමාර ... අපස්මාරය ; මීමැස්මොර

අපලෝකන කර්මය ... එනම් විනය කර්මය (උ.ශ්‍රු. 4 බ.)

අපිස් ලීලා ... (අපපිච්ඡා > අපිස්) මඳ ආසා ඇති විලාසය

අපිස්සතොස් ... ලද දෙයින් සතුටු වන

අභව්‍ය ... නුසුදුසු

අභිවිනය ... සියලු විනය පිටකය

අභියුඤ්ජන ... "අයිතිවාසිකම්කීම"

අයිනා දත් පරිද්ද ... අදත්තාදනා පාරාජිකාව

අයුණු ... අගුණ

අරයි ... පිහිටයි

අරිවස්හි කී සෙයින් ... අරියවංස සූත්‍රයේ කියන ලද අයුරින් (උ.ග්‍ර.5)

අලච්ජින්නක ... මහපට ඇඟිලි සිඳින ලද තැනැත්තා

අවදු (< ආගන්ත්වා) ... අවුත්, ඇවිත්

අළුවා ... බෙදූ කොටස

අව්ල ... "මාලුව" ව්‍යඤ්ජනය, යි මෙහි අදහස් දක්වාඇත.

අවුත් ... (ආපන්න) පැමිණි, පත් වූ.

අසම්භව ... අනියත ; නියතවශයෙන් තීරණය කළ නොහැකි

ආකොසා < (අක්කොසෙත්වා නින්ද බස් කියමින් බැණීම "ආකොසා බිණීම් නම්, ගොත් ඈ දක්වා හැවීමැ" (මහ.වි.)

ආයතිසංවරය ... නැවත සංවර වීම

ආලොපය – (< ආලොප) ... අහර පිඩ

ඈණවා - (< ආණාපෙත්වා) අණකොට, නියමකර

ඈක්මෙන ... නොණ්ඩිගසන

ඈර සිවුවාක්හු වැනිවෙයි ... ගෙනවුත් තැබූ තැනැත්තකු හා සමානවෙයි.

ඉඳුළු (<උච්ජිට්ය) ... අනුභවකොට ඉතිරි කළ

ඉදිව - සෘජුව ... කෙළින්

උක්තමැනො ? ... කියන ලද්දේම නොවේද?

උච්ඡෙදදිට්ඨි ... පුනර්භවයක් නැතැයි විශ්වාස කිරීම

උණ ඕවටසේ ... ගුලිකර

උගහට ... දුෂ්කර (අපහසු)

උපශමකටහැකි ... සන්සිඳුවියහැකි

උපනිධි ... කෙනෙකු ළඟ ආරක්ෂාව පතා තබන දෙය උපනිධිනම්වේ.

උවසර සිමින් ... උපචාර සීමාවෙන් (උ.ග්‍ර. 6 බ.)

උනුතිරි ... අඩු වැඩි

උදෙස් (< උද්දෙස) ... පෙළ පාලි ධර්මය —

උකසි පැහැර (< උක්කාසිත්වා) තමා පැමිණි බව ඇඟවීමට) උගුර සෑදු

එකතින් ... එක් අතකින්

එකස් කොට ... ඒකාංශ කොට

එක්විසි අනෙස්න ... "සිවුපසය සෙවීමෙ අයුතු ක්‍රම විසි එක (උ.ග්‍ර. 7 බ.)

| | |
|---|---|
| එව ගෙන | ... බහා ගෙන, දගෙන |
| එළ වූ | ... ඉදිරියට ගෙනෙන ලද; පිළිගන්වන ලද |
| ඔකප් < (ඔත්තප්ප) | ... පව් කිරීමට ඇති බිය |
| ඕලවා | ... ඔහු ලවා |
| ඔමසවා (ඔමසවාද) | ... "මුසාවාද වර්ගයෙහි දෙවන ශික්ෂා පදය" (උ.ග්‍ර. 8 බ.) |
| කටී වාමනක | ... "කටියෙන් පහළ කොටස ඉහළ කොටසට වඩා මිටි වූවෝ" (මැ.වි.) |
| කණ්ඩුයා බොහෝද්දඇති | ... කැසීම බහුල දද ඇති (කඩුවේගත් රෝග යෙන් පෙළෙන |
| කර්ණභගන්දර | ... කන් කුණුවී සැරව ගලන රෝගය |
| කතරමග | ... දුර්ග මාර්ගය; ගමන් කිරීමට අපහසු මාර්ගය |
| කතුරුයට | ... හැරමිටිය (කත්තරයට්ඨි) |
| කදව | ... ග්‍රීවාව ; බෙල්ල |
| කඳුවිතු | ... විනයෙහි ඛන්ධකවල පැනවූ වස්තු(උ.ග්‍ර.9බ.) |
| කන්පී | ... කන් පෙත්ත |
| කන් වැල් | ... කන්පෙත්තේ එල්ලෙන කොටස එල්ලෙන කන්පෙත්ත |
| කප්කරුවක් | ... "දෙකට බෙදුණු කණු හිස" (සිං.ශ.කෝ.i) |
| කබල | ... "එක්වරකට කටට අල්ලන ආහාර ප්‍රමාණය (සිං.ශ.කෝ.) |
| කමා කම විනිස | ... කම—අකම් විනිශ්චය "භික්ෂූන් වහන්සේලා ගේ අප ලෝකනාදී විනය කර්ම පිළිබඳ සම්පත්ති හා විපත්ති විනිශ්චය කිරීම සම්බන්ධයෙන් කියනු ලැබේ (සිං. ශ. කෝ.) |
| කම්පථ | ... කර්මපථය ; මුහුකුරාගිය කර්මය |
| කම්සත් ඔනහු | ... කටයුතු විධාන කරන්නා හු |
| කම් සමුට්ඨානි | ... කර්මයෙන් හටගන්නා |
| කලමුයෙහි | ... කලාපයෙහි } (උ.ග්‍ර. 10 බ.) |
| රූදිවිදූ | ... රූප ජීවිතද } (උ.ග්‍ර. 10 බ.) |
| කයින්තොර කොට | ... සිරුරින් බැහැර කර ; සිවුරු හැර |
| කලාකුරකින් | ... කාලාන්තරයකින් ; පසුකලෙක |
| 'කසබොහෝ | ... කැසීම බහුල |
| කහා | ... සිවුර |
| කාරභෙදකයෝ | ... හිරගෙයින් පලා ගිය අය |
| කැකුළු වූ (< කක්ඛල) | ... කටුක වූ ; රළු |

කිම්දෙහොයි ... "මොකදැයි හොඳද නරකදැයි" (මැ.වි.)

කිසෙයයත් ... "කෙසේදැයි කියතොත්" (මැ.වි.)

කිලාස ... "ඉස්ම නොගලන කුෂ්ඨ විශේෂයක්" හෝරි (වැ.සෝ.)

කුකුස් ... (< කුක්කුච්ච) කුක්කුච්ච යන්නෙන් පසුතැවිල්ල ගැනෙතත් මෙහි සැකය යන අදහසය

කුණි ... කොරා

කුළ දූෂණ ... විහාරස්ථානය සතු දේවල් දීම ආදියෙන් දායකයන් හා නොමනා සම්බන්ධකම් ඇති කර ගැනීම

කුස වැහැරි ... කුස තණ වලින් තැනූ වස්ත්‍රය

කෙණෙසි ... (< කටච්ඡු)—හැන්ද" මෙය කැඳ බෙදීමට භාවිතා කළා විය හැකිය. (වැ.සෝ.)

කෙළඹත්තැන් ... (හොතු > හොත් > ඹත්) කෙළ ගැසූ තැන්

කෙළලීමෙන් ... වතුරට කෙළ ගැසීම නොකළ යුතු බව දක්වීමට යෙදූවා විය හැකිය.

කෙළමලා ... කෙළබඳුන; පඩික්කම (< බෙලමල්ලකො)

කෙලෙස් කමට ... ක්ලේශ කර්මයට (උ.ග්‍ර. 11ඛ.)

කෙසිවිද ... යතුරු කපොල්ල

කෙහෙවරළු ... "කෙශකලාපයෙහි නැගී තිබෙන වරල්" මැ.වි.)

කොරොස් ... ගොරෝසු; රළු

කොලත්තකුදු ... කොල අත්තක්වත් (?)

කොල්හි ... "කපොලයෙහි ; හක්කෙහි (මැ.වි.)

කොසෙයින් .. "සර්පවිශේෂයක්" (වැ.සෝ.)

ඛජ්ජක ... කටින් කඩා කෑ යුතු දේ; පළතුරු ආදිය

ඛඤ්ජ ... නොණ්ඩි

ගණ ... දෙදෙනකු හෝ තිදෙනෙකු (උ.ග්‍ර. 12.ඛ.)

ගඳ සුණු ... සුවඳ කුඩු

ගන්නාතුරු ... ගන්න ට මත්තෙන්

ගහළ .... කසල

ගහළ නොළුව ... කසළ බදුනට දමා ගන්නා ලෑලි කැබැල්ල "මෙය —"නෙළුව" යන්නේ අපපාඨයක් විය හැකිය" (වැ.සෝ.)

ගළසර ... ගළවළුව "බෙල්ලේ වළවල් තුනක් ඇත්තේය. එයින් දෙකක් ඉදිරි බෙල්ලේ ද, එකක් පසු බෙල්ලේද වෙයි. ඉදිරි බෙල්ලේ

ඇති දෙවළ අතුරෙන් අකු ඇට දෙක එක් වන තැන බෙල්ලේ පහළම තිබෙන වල මෙහිදී අදහස් කරන ලදී'' (මැ.වි.)

ගැනෙත්තේ යයි — අයත්යයි

ගැළවුව — ගැළවුව හොත්, තොරකළහොත්

ගිහිඇලකරත් ... ගිහිදල්වතොත්

ගිගිනි කැවීම ... කිතිකැවීම

ගිහිසදල ... ගිහිදැල් සහිත (උ.ශු. 13 බ.)

ගිලන් උවටා ... ග්ලානෝපස්ථායකයා

ගිහිපිළි ... ගිහියන් අඳින රෙදි

ගිහිවියැවිව ... ගිහි විය—අවිචා — ගිහිවීමට (සිවුරු හැරීමට කැමැතිව

ගුත්තිය ... ආරක්ෂාව

ගෙගකුස ... ගේ ඇතුළ

ගෙඩි ගසා ... මිටි බැඳ, පොදිබැඳ

ගෙරිහණු සේ ... ගවයන්ගේ හකුමෙන්

ගුරුබඩ (< ගරුභණ්ඩ) ... පෞද්ගලිකව බෙද හද ගැනීමට යෝග්‍ය නොවන භාණ්ඩ (උ.ශු. 14 බ.)

ගෝචර සම්පජඤ්ඤ ... ''හැමතන්හිදීම කර්මස්ථානයක් මෙනෙහි කිරීමෙන් යුක්තව ක්‍රියා කිරීම'' (මැ.වි.

ජඝසවාමනකයෝ ... ''ඉහටියෙන් ඉහළ හරිය අසම්පූර්ණවූත් පහළ හරිය සම්පූර්ණවූත් මිටවෝ''(මැ.වි.)

ජාත්‍යන්ධ ... උපතින්ම අන්ධ

ඡන්දය ... කැමැත්ත

ඥප්ති ... දැන්වීම

ඥප්තිකර්මය ... දැනුම්දීමෙන් පමණක් කරන විනය කර්මය (උ.ශු. 15 බ.)

ඡබ්බර ... මසත්

තන්කටයුත්තේය ... තැන්පත් කළ යුතුය.

තන්හිමි ... ස්ථානයේ අධිපති ; ප්‍රධානයා

තනුවැ ... නැමී

තමානිමිත්හි ... තමාගේ නිමිත්තෙහි: ලිංගෙන්ද්‍රියෙහි

තමා නොගැතිය ... තමාට අයත් නැත

තල් කැනක් සේ ... තල්වල්ලක් මෙන්

තල් සිරිවැනි ... තල්කෙඳිවගේ

තාටසා ... තළු; තලිය, පා; බඳුන; පාත්‍රය, පාත්‍රයක් සොයාගත නොහැකිවූ විට තලියක්වත් දී

පිවත්කළ බව මෙයින් හැගේ "තලි සංඛ්‍යාත පාත්‍රය)" පාත්‍ර තැටිය (?)

තරණු නිසා ... තරණය කිරීම, එතරවීම පිණිස

තාවුරුවත් ... නිශ්චල දේපල

තිත්පිය පක්කන්තකයෝ ... තීර්ථක ලබ්ධිගතුවෝ (උ.ග්‍ර. 16 බ.)

තිදඬු ... දිය බඳුන (කුණ්ඩිකාව) තැබීම සඳහා ප්‍රයෝජනයටගත් කකුල්තුනේ පුටුව ; නැත හොත් කනප්පුව

තිරසේවායෝ ... "රජුගෙන් පඩි ලබමින් සිටින ස්ථිර යුද්ධ භටයෝ (මැ.වි.)

තිරිසන්ගිය ... තිරිසන් ජාතියට අයත්

තිළි ... මෙට්ටය

තුන්දුසිරි ... තිදෙරින් කෙරෙන දුසිරිත්—(උ.ග්‍ර. 17 බ.)

තුන් සුසිරි ... තිදෙරින් කෙරෙන දුසිරිතෙන් වැළකීම (උ.ග්‍ර.17 බ.)

තුන් මගින් ... මුඛයෙන්, අධෝමුඛයෙන් හෝ යෝනියෙන්

තුනුතොල් ... කුඩා තොල්

තෙලිපත්තක් ... තෙල් ස්වල්පයක්

තුළුල් ... (< "දුව්වුල්ල) දෝෂ බහුල" (වැ.සෝ.)

දණ්ඩභය ... දඬුවම් ලැබෙතැයි ඇතිවන බිය

දඬුලායෙහිකළ ... දඬුවයෙන් හා ලාකඩින් කළ

දතුවයෙන් ... දත් හෙයින් :—මෙය "දතුයෙන් හෝ "දතුවෙන්" කියා ශුද්ධ විය යුතුය.

දරදී ... "උද්ධාරය හෙවත් පොළිය; ණය; භණ්ඩ දෙයා යන අර්ථයන්හි මේ ශබ්දය වැටෙන බැව් පෙනේ. දර ශබ්දය උඩාර ශබ්ද-යෙනුත් (උද්ධාර උදර - දර) දී ශබ්දයෙනුත් ආ හැකිය" (උ.ග්‍ර. 18 බ.)

දවස් ගෙන ... දවස් ඇරඹී ; දවස උදවී

දවස් යවා ... දවස ගත කොට

දසරුව ... උරහිස

දය ... "දිශාව ; පැත්ත" (වැ.සෝ.)

දස්සු ... දසයෝ

දහපා ... "(උපජ්ඣාය පාද?) ස්වාමීනි; වහන්ස යන අරුත්හි (වැ.සෝ.)

දළ මිතුරන් ... ළඟ මිතුරන් "අඹයාළුවෝ"

දළකරවනුසඳහා ... දැඩිකරවනු සඳහා; උණන්දු කරනු සඳහා

දුහු වැලයකුදු ... දවලූයෙහි නූල් පටකුදු; රෙදි වාටියක නූල් පටක්වත්

දූහැවි සිතින් ... ද්වේශ සහගත සිතින්; තරහෙන්

දූළි ... උඩුරුවුල

දික් දැ ... දීර්සජාතිහු, උරගයෝ ; සර්පයෝ

දිග බලා - දසනොබලා ... ඉදිරිය බලා වටපිට නොබලා

දියවටන් ... ශරීරකෘත්‍යය කර සේදීමට දිය තබා ඇති තැන (උ.ග්‍ර. 19 බ.)

දිය හෙලුම ... අගුව

දිගා වැ ... දික්—ආවැ—දීර්ඝායුෂ්කව

දිවිහිමියෙන් ... ජීවිතාන්තය දක්වා; යාවජීව

දිමනු ... ජීවමාන

දුටුමිතුරන් ... දැකීම්මාත්‍රයෙන් මිතුරුවූවන්

දුබැටිසාවියෙන් ... "දුර්භික්ෂ ස්වභාවයෙන් -මැ.වි.)

දුර්ගතිභය ... දුගතියට යතැයි ඇතිවන බිය (උ.ග්‍ර. 01 බ.)

දෙවා නොගෙන ... නොලබාගෙන ; තමන්ම ගෙන

දෙරවරුත් ... දෙර අරිනොත් ;

දෙරසිදින් ... දෙරකඩින්

ධූරනිකෙවි ... ධූරනික්ෂෙපය ; බලාපොරොත්තුව අත්හැර දැමීම.

නර ... ඉදුනු කෙස්

දිවුකුෂ්ට ඇත්තෝ ... "හටගත් කුෂට ඇත්තෝ" (මැ.වි.)

නස්සි ... නසියි

නැගු බත් ... වමනය

නිත්තෙන් ... නිරන්තරයෙන් (නිති—එන්)

නිදි පෙරට ... නින්දට පෙර

නිස ... ගුරුවරයකු ඇසුරු කරමින් විසීම

නිසදුන් ඇදුරු තෙරුන් ... ආචාර්යවරයා

නිසදුන් ... නිසීදන මාංගය ; සට්ටම ; තට්ටම

නිසරුණු ... බැහැර කිරීම; නිස්සරණය

නියායෙන් ... ආකාරයෙන් ; විදියට

නෙරණ ලදුව ... නෙරපන ලදුව ; පිටත්කරණලදුව

නො ඇක්මැ ... නොපැකිල

නොඔන යුත්තේ ... බහා නොතැබිය යුතුය.

නොකට හුන ... නොකළ හැකි වි නම්

නොකොරස්පුයකින් ... රළු නොවූ පුසන්කුරකින්

නොඝටා ... නොගටා ; නොහැපී ;

නොතාඹුරුවක් ... චංචල දේපල

නොපස්කා ( < අපච්චක්ඛාය) ප්‍රතික්ෂෙප නොකොට

නොපැහුවන් ( < අප්පහීනා) ... ප්‍රහීන නොකළ අය ; දුරුනොකළ අය

නොබැණ ... කථා නොකර

නොරඹුරයෙහි ... රහස්තැන

නොහඬවා ... ශබ්ද නොකර

පක්ඛහත ... පක්ෂාඝාතරෝගියා

පඬුවන් ... පණ්ඩකයන් (උ.ග්‍ර. 21 බ.)

පණති ... පැනවීමයි ; ප්‍රඥප්තියයි

පත්කඩ ... වැදීමට හා හිඳ ගැනීමට එලා ගන්නා උපකරණය

පත්පට ... හිඳගැනීමේදී ඇතුළිට එලන ඇතිරිල්ල ; සැදලය

පත්සලා ... පවත්සලා

පනවනවහුවිසින් ... පිළියෙල කරන්නාහු විසින්

පය ... පාත්‍රය

නොපැහැර ... නොගසා

පරහලා කොටැ ... ගිල

පරාගේ ... අන් කෙනකුගේ

පරාගැති ... අන් කෙනකු සතු

පරානුවාදභය ... අනුන්ගෙන් දෙස්නැගෙතැයි ඇතිවන බිය

පරිකොසා ... තර්ජනය කිරීම ''පරිකොසා බිණීම් නම් භය දක්වා කළ කීරුවා හැමීම (මහ. වි.

පරිජි ... පාරාජිකා; සසුනෙන් පැරදීම

පරිජි ඇවැද්ද ... පාරාජිකා වූයේ

පරිමණ්ඩලවූ පදව්‍යඤ්ජනයෙන් 'වටකුරු'' යනු මෙයට ලැබෙන අදහස වුවත් එය මෙහි, නොසැයදේ - පද අතර මග නොකැඩෙන සේ, ගීතස්වරයෙන් නොරව, අර්ථයට හානි නොවන සේ පදයෙන් පදය කීම මෙහි අපේක්ෂිත බව හැගේ.

පරිසුපට්ඨායක ... වත්පද දීමට ද තිය දීමට ද සුදුසු භික්ෂූන් වහන්සේ

පස්කඳ ... පඤ්චස්කන්ධය (උ.ග්‍ර. 22 බ.)

පස් විකා ... ( < පච්චවෙක්ඛිත්වා) ප්‍රත්‍ය වෙක්ෂා කොට

පස්කම් රා ( < පඤ්චකාමරාග) පඤ්චකාමවස්තු කෙරෙහි ඇලීම (උ.ග්‍ර.23 බ)

පස් නිවර්ණ ... ( < පඤ්චනීවරණ — (උ.ග්‍ර. 24 බ.)

පස් විසි අවහාර ... අවහාර ශබ්දය පැහැර ගැනීම හොරකම්කර ගැනීම යන අරුත්හි වැටේ. එහි ප්‍රභෙද විසි පහ පස්විසි අවහාර නම්. (උ.ශු. 25 බ)

පස්සහධැමියන් ... භික්ෂු, භික්ෂුණී, සාමණේර, සාමණේරි ශික්ෂ මාතා යන පස් දෙනායි.

පස ... ප්‍රත්‍යය

පහණපිටතබා ... ගලමත තබා

පහළවූ සොරහු ... නමගිය හොරා ; ප්‍රකට හොරා

පහන් පියවිකරත් ... පහන් නිවුවොත්

පාදුකා ... වැසිකිළිය කැසිකිළිය ඇතන්හි පයතබන පුවරු, පාද උකාගන්නේ යමෙකද එය පාදුකානම්. උකා ගැනීම නම් ඔසොවා ගැනීමයි. කිළියේ බිමින් පා ඔසවා තැබෙන්නේ පදුකාවෙහිය.

පාහළ ... (< පාදපීඨ) නොසේදූ පා තබන ලෑල්ල (පය සේදීමෙදී ප්‍රයෝජනයට ගැනේ)

පා පුවරු ... (< පාදකඨලිකා) පා සෝද තබන ලෑල්ල

පාපිස්නිය ... පාපිසින උපකරණය; පාපිස්ස

පැදකුණුකොට ... ප්‍රදක්ෂිණාකොට; දකුණත පූජනීය වස්තුව දෙසට සිටිනසේ ඒ වටේ ගමන් කිරීම ප්‍රදක්ෂිණාවයි.

පැන්කෙම්හි ... බිමට නිසි ජලය තබාගත් බඳුනෙහි

පැස ... වට්ටිය, පෙට්ටිය වැනි උපකරණයක්

පිණිබිඳක් සා ... පිණිබින්දුවක් පමණ

පියල් වැ ... ප්‍රකෘතියෙන්

නොදපිරියස්ස යුත්තෙය ... නො සෙවිය යුතුය.

පී පුසන් ... (පී < පිහිත) දමන ලද පුසන් කුරු

පිරිවහා ... පාඩම් කියා

පිවමනාතැනකට ... දැමියයුතු තැනකට

පියෝවකින් ... ප්‍රයෝගයකින් ; උපක්‍රමයකින්

පිළිබහා ... ප්‍රතිබාහනයකොට ; අත්හැර

පිළිවක්කොට ... පෙරලා; ඇති තතු නැතිසේ

පිළිසඳ පටන්ගෙන ... ප්‍රතිසන්ධියේ සිට

පිළිසන් ... (< පටිච්ඡන්න) වැසුණු

පිළු ... කොරා

පුහුලිකොට ... පෞද්ගලිකව

පූජ්ඛත්ලි ... මල්දමා සකස්කළ මෙට්ටය

පූවතත් ... "(<පකතත්ත) ප්‍රකෘති ආත්මය හෝ ස්වභාවය ඇති; පාරාජිකා පත්තියට නොපැමිණි නොහොත් උත්ක්ෂෙපණීය කර්මයෙන් තහනම් නොකළ (වැ.සෝ.)

පූවතත් මෙහෙණක හා ... භික්ෂුණී ස්වභාවය ඇති මෙහෙණක සමඟ

පූවරු පිළි ... "ලී පතුරු එකට ගොතා සැදූ තවුස් සිවුර" (වැ.සෝ.)

පූවරු ගහා ... ලැලි ගසා ? අන් වෙහෙරකට යන්නට සූදනම් වන භික්ෂුව විසින් මළුව හැමද ඊළඟට කළ යුතු කාර්‍ය්‍ය වශයෙන් මෙය දක්වේ. මළුවේ ආරක්ෂාවට, ඊට ඇතුළුවන තැන ලැලි ගැසීම මෙයින් අදහස් කළා යයි හැඟේ.

පූයා ... සැරව

පූස ... පිසිනුයේ යමකින් ද එය පූසය. ශරීර-කෘතාසය නිමවා සේදීමට කලින් පාවිච්චි කළ කුර.

පූසන්කිස ... පිසීමේ කෘතාසය

පෙසුඤ්ඤසිඛ ... ප්‍රාතිමෝක්ෂයේ ශික්ෂාපදයක් ; පෙසුඤ්ඤ නම් ප්‍රියභාවය නැතිව යාමයි. අසමගිවීමයි කේලමෙන් එය සිදුවන බැවින් පෙසු-ඤ්ඤවාද; පිසුනාවාචා යන වචනවලින් එය හැඳින්වේ.

පෙරයම ... පළමු යාමය (උ.ග්‍ර. 29 බ.)

පෙරලා ගෙන ... මාරුකරගෙන (අකැපවස්තුවට කැපවස්තු මාරුකරගැනීම වරද බව දක්වීමට යෙදිණි

පෙරෙව් ... පොරවන ලද

පොලුලා අඹරනු ... තිරිංගයක් යොද ඇඹරුව හොත්

බඳුන් මුවවිටි ... භාජනයේ ගැට්ට

බණ හඳරත් .. ගුරුවරයා ඉදිරියේදී පාඩම්දීම

බලා ... දමා ; හැර

බැවීම ... බයගැන්වීම, බියකිරීම

බික ... භික්ෂාව ; ආහාරය

බිතක් ... බිත්තිය

බිත්තදසාවට ... බිත්තිය පැත්තට

බිසි කඩ ( > හිසි ) ... පාපිස්නා රෙදි කැබැල්ල

බුන් ... බිඳුණු

බුමුතුරුණු ... බිම අතුරණු, බිමතුරුණු (< භූම්මත්ථරණ) බුමුතුරුණු; බිමට එළන ඇතිරිල්ල

බෙහෙසත් ... බෙහෙත්

බ්‍රම්සරුන් ... (බ්‍රහ්මචාරී) සහ බ්‍රහ්මචාරීන්; උසස් හැසිරීම් ඇතිව එකට වෙසෙන්නන් (උ.ග්‍ර. 30 බ.

බොරු කියන පෙරට ද ... බොරුවක් කියන්න කලින්ද

භගන්දරා ... (මළ මාර්ගාසන්න ප්‍රදේශය) විද රණය, කරණා ගෙඩියක්

භොගවනසේ ... සිවුරේ මැද කොටස

මකුළුහූ ... මකුළු දැල්

මනාකොට ... මැනවින්

මම්මන ... මුක්කමා

මස්ස ... මාසකය; මසුරම (උග්‍ර. 31 බ.)

මහණවියැටිව ... මහණවිය අටිව; මහණ වීමට කැමැතිව

මහණලිඟු ... මහණ වෙස ; ශ්‍රමණවේශය

මහබොය ... මහාබෝධිය

මහ අසුන් ... සැපපහසුකම් වැඩි, වටිනාකමින් වැඩි අසුන්

මහ ඇඟි ... මහාර්ඝ ; බොහොම වටිනා

මළ දහයි ... මැරුණොත් හොඳයි ; මැරේද

මාගමක හාද ... ස්ත්‍රියක සමඟ

මැදියම ... මධ්‍යම යාමය

මිනිස්වීකා පරිද්දෙහි ... මනුෂ්‍යවිග්‍රහ පාරාජිකාවේ

මියෙහි ... මුඛයෙහි

මුඩුව ... මුණ්ඩව; හිස බූගා

මුවනොකොටැ ... මුවහනොකර: නොවසා

මුවහනොව ... නොවැසෙන

මුල් පණසක ... (<මූලපණ්ණාසක) මුල් සූත්‍ර පණහ.

මුළාවැ ... මුළා වැ

මෙ පියොවින් ... මේ ප්‍රයෝගයෙන් ; මේ උපක්‍රමයෙන්

මෙවුන්ධම් පරිද්ද ... මෛථුනධර්මපාරාජිකාව

මොහොලගෙන ... පිරි ඉතිරි
වැවේ බිසෝ කොටුවේ ජලය පාලනයට යෙදූ උපකරණය මොහොල නමින් හැඳින්විණි. එය ගත්විට වැවේ ජලයගලායයි එම කරුණ ඇසුරින් තැනුණු වදනක්වේ.

යමක් ... යෂ්ටියක්; රිටක්

යට හැදෙක ... ඇදක් යට
යත්න ... උත්සාහය
යපට ... (අය-පට, යපට) යකඩ වස්ත්‍රය
යොනුන් විනා ... ග්‍රීකයන් හැර (?)
රන්විසිවියැටෙකින් ... වී ඇට විස්සක බර රනින්
රිසියෙන ... කැමැති
රුවාරු ... රූප අරූප
රුස්වාගෙන ... කැමතිකරවාගන
රුදිවිදු ... රූප ජීවිතද?
රූ නගා ... සටහන් රූප යොද
ලග්නා ... වාසයකරණ, ලගින
ලද ... ලබ්යිය
ලදු ... ලැබුණු දේ
ලද්ද ... ලැබූ තැනැත්තා
ලිඛිතකයෝ ... වරෙන්තුකරුවෝ
ලිඞ්ගනාසනා ... මෙයින් කියැවෙන්නේ සිවුරු හැරවිය යුතු බවයි.
ලිහිණිවැ ... නග්නව
ලෙඩමනාවනතාක් ... ලෙඩ සුවවන තුරු
ලොවි ලොවිතුරු ... ලෞකික, ලෝකෝත්තර
වමන් ... මූත්‍ර
වඩනාක්කටයුත්කේය ... වැඩී වටිනාකමින් යුත් දෙයක් කළ යුතුය.
වණ ගඳ රස ... වර්ණ, ගන්ධ, රස ; පැහැය, සුවඳ, ශෝභනත්වය
වත් තෙරුන් ... ''උපාධ්‍යාය වූ තෙරුන්වහන්සේ''(වැ.සෝ.)
වත් පද ... ශික්ෂාපද
වමරුස් ... වපර ඇස්
වරණ කල ... විවෘත කරන කල්හි
වරා ... වළකා
වරින් ... වාරයෙන් වාරය
වසගින් ... පරම්පරාවෙන්
වාමනක ... මිටි
වාසය ... විසීම
වැටුමින් ... පවතිමින්
වැටෙනු නිසා ... පැවැත්ම සඳහා
වැම්කළ පසු ... අස්කළපසු (?)
වැරුතාක් ... අත්හළ තාක්

වැලිදඬුවම් ... වැරදිකරන හෙරණුන්ට දීමට නියමිත දඬුවමක් වැරදිකළාහු ලවා වෙහෙර මළුවට වැලිගෙන්නා දූමිමම් දණ්ඩ කර්මය

විකුම්කටයුතු වතින් හැකිළෑ (ශික්ෂාපදය) ඉක්මවීමට කැඩීමට හේතුවන වස්තුවෙන් ඈත්ව

විකුම්නොකරන පියල් වැ ... (ශික්ෂාපද) ව්‍යතික්‍රමය නොකිරීමේ ස්වභාවය ඇතිව: සිකපද කඩ නොකිරීමේ ස්වභාවය ඇතිව.

වීකුම් සාදක කෙරෙත් ... (ශික්ෂා පද) ව්‍යතික්‍රමය, (කඩකිරීම) ඉවසත්

විනිස ... විනිශ්චය

විලික්සුණු ... (√විලිකුස්) ඉඳුණු

විවේක නොකරන පමණද උමතු නොවැ උමතුවේ ප්‍රමාණය දැක්වීමට පැ උපමා සමග දැක්විණි. වෙන්කර දැනගැනීමට නොහැකි තරමට උමතුව ඇති බව මෙයින් අදහස් කෙරේ.

වෙනගෙනැ හසරකරත් ... කැටිව ගමන්කරතොත්

වෙලෙවිය ... හදිසිය

සංඝ භෙද ... එක්ව පොහෝ පවුරුණු කරණ භික්ෂූන් අතර අසමගිය ඇතිකිරීම; මෙය ආනන්තරිය අකුශල කර්මයකි

සහල සිවුර ... දෙපට සිවුර

සඟරමින් ... සංඝාරාමයෙන් (උගු 32 බ.

සත් - සත් කෙනෙකුත් ... සතකු

සස්සතදිට්ඨී ... ස්ථිර ආත්මයක් ඇති බවට සිතන මිථ්‍යා දෘෂ්ටිය

සතප්නා ... සැතපෙන

සන්නිධි ... තැන්පත් කොට තැබීම

සනහන්නට ... නාන්නට

සබ්බනාසනා ... මහණකමත් ගුණධර්මත් යන සියල්ල නැසෙන බව

සබ්‍රම්සරුන් ... එකට බඹසර පුරන්නන්; (සහ බ්‍රහ්මචාරීන්)

සම්කමත්සැපියුතු ... සම්මාකම්මන්ත සම්ප්‍රයුක්ත; යහපත් ක්‍රියාවල යෙදිය යුතු (?)

සමන්තා ... යුක්ත

සමාහිත ... සන්සුන්; හිතේ එකඟත්වය

සම්බාහනා ... අතපය මැඩීම ආදිය; උවටැන්

සම්භෝගය ... එකට කටයුතු කිරීම (සමභෝග; සම්භොග) එකට වැළඳීම

සම්පජඤ්ඤ ... මනා දැනීම (උ.ශු. 33)

සරළුව ... හැන්දට අල්ලන ප්‍රමාණය

සලේගුණෙන් ... සල්ලෙඛ ගුණයෙන්; කෙලෙස් දුරු කිරීමේ ගුණයෙන්

සවනේ ... සර්වඥෙයය මණ්ඩලය, දතයුතු සියල්ල

සවාරෙන් ... සර්වප්‍රකාරයෙන්; මුළුමනින්ම

සහසා ... වහා

සා ... සමාන

සාහිලි ... සය ඇඟිලි, ඇඟිලි හයක් ඇති

සාහා ... සාධා

සැබැවි වූ ... ස්වභාවය වූ

සැපිය යුතු ... සප්පාය ; උචිත

සිඛපස්කා ... (<සික්ඛං පච්චක්ඛාය) ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යානය කොට

සිඛනොපස්කා ... (<සික්ඛං අපච්චකඛාය) ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යානය නොකොට

සියගාවග ... (<සගාථක වග්ග

සිරුරුවළද ... මළ

සිවිනොනස්නාසේ ... සිවිය නොසිරෙන ලෙස

සිවුරු වසැ ... සිවුරු දැමීමට යොදගත් උණ බට ආදී ලීය හෝ වේවැල් ආදී යමක්

සීපද ... සිවුපා ;

සීපූ කැළලගැට ... කසයෙන්; කෝටුවෙන් තැලීමෙන් හටගත් කැළැල් (?) උ.ශු. 34 බ.)

සුක්කවිස්සට්ඨි ... සුකුරු මිදීම

සුභොජන ... යහපත් ආහාර

සුවවිහාර ... (<සුඛ විහාර) පහසු හැසිරීම

සුසුරෙහි නොනගා ... ''සුරු'' ''සුරු'' යන ශබ්ද නොපවත්වා

හත් ... ඇදී ; අදින ලද

හඹු ... කැඳ විශේෂයක්

හවා ... දෙස්නගා ; බැණ

හසර කරමින් ... හැසිරෙමින්

| | | |
|---|---|---|
| හැකිළ | ... | ඉවත්ව ; |
| හැවීම් | ... | දෙස්නැගීම ; බැණීම |
| හිහුරු පෙණ | ... | එනම් වැල්වල පෙණ |
| හිරි | ... | පව්කිරීමට ලජ්ජාව |
| හීපතින් | ... | ඉලපතින් , මුස්නෙන් |
| හූ කටින | ... | නූල් කටින |
| හෙරණ | ... | සාමණේර |
| හෝනා | ... | සැතපීම, සයනය කිරීම. |

# උපග්‍රන්ථය I

1. භය. — මෙයින් අදහස් කරන්නේ වරද කිරීමට ඇති බියයි. එය තෙවැදෑරුම්.

   (i) අත්තානුවාද භය
   (ii) පරානුවාද භය
   (iii) දුග්ගති භය යනුවෙනි.

   (i) තමා කළ වරද පසුව සිහිවීමෙන් පසුතැවිලි වෙන්නට සිදු වේතැයි යන බිය අත්තානුවාද භය නම් වේ.
   (ii) තමා වරදක් කළොත් අනුන්ගෙන් ඊට දෙස් නැගේතැයි ඇති බිය පරානුවාද භය නම්.
   (iii) දුග්ගති භයනම් අපායාදි දුගතියේ උපදින්නට සිදුවේතැයි යන බියය.

2. අවශ්‍ය සම්පන්නා පස්ටිකාගෙන

අංග අටකින් යුක්ත ප්‍රත්‍යවේක්ෂාවයි. මෙය පිඬු වැළඳීම සම්බන්ධ යෙනි.

   (i) මම මේ ආහාර වැළඳීම කරන්නේ ක්‍රීඩා පිණිස නොවේ (නෙවදවාය)
   (ii) පුරුෂ මදදිය වඩනු පිණිස නොවේ. (න මදය)
   (iii) සිරුර සැරසීම පිණිස නොවේ. (න මණ්ඩනාය)
   (iv) සිරුර පැහැපත්කරගනු සඳහා නොවේ (න විභූසණාය)
   (v) මේ සිරුරේ පැවැත්ම සඳහාය (යාවදේව ඉමස්ස කායස්ස ඨිතියා)
   (vi) බඩගිනි වේදනා නසනු පිණිසය)
   (vii) බඹසර රකිනු පිණිසය (බ්‍රහ්මචරියානුග්ගහාය)
   (viii) පැවැති බඩගින්නත්, (අධිකව ආහාර ගැනීමෙන්) අලුත් වේදනාත්නුපදවමි. (පුරාණඤ්චවේදනං පටිහඞ්ඛාමි, නවඤ්ච වේදනං න උප්පාදෙස්සාමි)

3 අන්ඨකෑ :

ඇතුළත තිබෙන දේවල් ආරක්ෂා කොට යන අර්ථය වන්නට පුළුවන''යි මැද උයන්ගොඩ විමලකීර්ති හිමියෝ .මෙහි අදහස් දක්වති. එහෙත් දිවිඨක'' යන අදහස වඩා උචිතය. ආගන්තුකව පැමිණියහුගේ ජීවිත ආරක්ෂාව සැළසෙන සේ ක්‍රියා කළ යුතු බව මෙයින් අදහස්

කළා විය හැකිය. ''තමා හළ දෙරින් වන් ආගන්තුකයන් අත් රැකැ සිටක්කට යුත්තේය.'' යන සම්පූර්ණ වාක්‍යය ගත් විට මේ බව මැනවින් පැහැදිලිවේ. (378)

4. අප ලෝකන කර්මය

සංඝයාගේ දැන ගැනීම සඳහා විචාරීම මෙයින් අපේක්ෂිත අරමුණයි. පැවිද්දට යෝග්‍ය කුලදරුවා පැවිදි කිරීමට මත්තෙන් කෙස් බෑමට සංඝයාට දැනුම් දිය යුතුය. මෙම කර්මය පණවා ඇත්තේ බුද්ධ කාලයේ සිදු වූ එක් සිද්ධියක් මුල් කර ගෙණය. එක් කුල දරුවෙක් විහාරයට පැමිණ භික්ෂූන් වහන්සේනමක් ළඟ පැවිදි විය. සෙස්සෝ ඒ බව නොදත්හ. ළමයාගේ මව විහාරයට පැමිණ තම ළමයා එහි පැමිණියේ දැයි විමසූ විට ඒ ගැන නොදත් බැවින්ම භික්ෂූහු තමා නොදුටු බව කීහ. පසුව ඒ ස්ත්‍රියට තම පුතු පැවිදිව උන්බව දක්නට ලැබිණි. ඉන්පසු ඕ බොරු කියන දුසිලුන් යයි භික්ෂූන් වහන්සේට චෝදනා කළාය. මේ බව දැනගත් බුදු රජාණන් වහන්සේ, ''අනු ජානාමි භික්ඛවේ, සංඝං අපලෝකෙතුං භණ්ඩුකම්මාය''යි පැවිදිං කිරීමට පෙර භණ්ඩුකර්මය (කෙස් බෑම) සංඝයාට දැනුම් දෙන ලෙස අනුදැන වදාළහ. මෙහි අපලෝකන කර්මය නම් එසේ දැනුම් දීමයි.

5. අරිවස්හි කී සෙයින්.—මෙහි අදහස අරියවංශ සූත්‍රයේ දේශනා කර ඇති ආකාරයට යන්න විය හැකිය. එය අංගුත්තර නිකායේ ඇතුළත් සූත්‍රයකි. චීවර, පිණ්ඩපාත, සේනාසන යන තුන් පසයේ අල්පේච්ඡතාවත් සිත, භාවනාවක පිහිටුවා ගැණීමත් සම්බන්ධ යෙන් එහි ඉගැන්වේ.

6. උපසර සිමින්.—ආසන්න සීමාව යනු තේරුමයි. සංඝාරාමයක් වටා ඉදිකළ වැට, පවුර ආදී සීමාවක් මින් ගැනේ. එවැන්නක් නැති විට ආරාමයේ කෙළවර පිහිටි සෙනස්නේ සිට ගල්කැට දෙකක් ගැසිය හැකි දුර ප්‍රමාණය මින් අදහස් කර ඇත.

7. එක්විසි අනෙස්න

සිවු පසය ලබා ගැනීමේ අවියෙන් කරණ වැරදි විසි එකක්

(1) ගිහියන්ටසඟසතු උණගස් දීම (වේළුදාන)
(ii) පත්‍ර (කොළ) දීම (පත්තදාන (iii) මල්දීම (පුප්ඵදාන) (iv) ගෙඩි දීම (ඵලදාන) v නහන පැන් දීම (සිනානදාන) (vi) දන්තකට්ඨ (දැහැටි) දීම (vii) මුවදෝනා පැන් (මුඛොදක) දීම. (viii) මැටි -(මත්තික) දීම, (ix) සුවඳසුණු (චූණ්ණ) දීම, (x) චාටු පැවතුම (චාටුකම්මතා) (xi) මදක් ඇත්ත හා බොරු වැඩි කථාව (මුග්ග සූප්පතා)

(xii) කුළුදරුවන් නැළවීම (පාරිභට්ටකතා) (xiii) ගිහියන්ගේ හසුන් ගෙනයෑම (ජංඝපෙසනියකම්ම) (xiv) වෙදකම (xv) දූත මෙහෙවරෙහි යෙදීම. (xvi) ගිහියන්ගේ පණිවුඩ ගෙනයාම (පහිණගමන) (xvii) ස්ව පිණ්ඩපාතය ගෙන් ගෙට මාරුකිරීම (පිණ්ඩ පතිපිණ්ඩ) (xviii) අල්ලස්දීම (දනානුප්පදන), (xix) වත්ථුවිජ්ජා (වාස්තු විද්‍යාව) හෙවත් බිම් ලකුණු කීම. (xx) නැකැත් කීම (නක්ඛත්ත විජ්ජා) (xxi) ශරීර ලක්ෂණ බලා අනාවැකි කීම "ශාස්ත්‍ර කීම", (අංග විජ්ජා)

භික්ෂූන් වහන්සේ නමක් සිවුපසය ලැබීමේ අරමුණින් මේ ක්‍රියා වලින් එකක හෝ කීපයක යෙදීම නුසුදුසුය.

8. ඔම්සවාද.—ජාත්‍යාදීන් සවා බැනීමයි.

9. කඳුවතු.—මහවග, සුළුවග යන විනය පොත්වල ඛන්ධකවත්ථු; හෙසජ්ජක්ඛන්ධකය, වත්තක්ඛන්ධකය ආදියයි.

10. කම්සමුඨනි කලලමුයෙහි රූ දිවිදූ.—කර්ම චිත්ත, ඍතු ආහාර යයි රූපකලාප හතරකි.

මෙයින් අදහස් කරන්නට ඇත්තේ කම්ම සමුට්ඨාන රූපකලාපය. චක්ඛුදසක, සොත දසක, ඝාණ දසක, ජිව්හා දසක, කායදසක ඉත්ථි භාවදසක, පුම්භාවදසක, ජීවිත නවක යන මේ කලාප නමය කම්ම, සමුට්ඨාණ රූපයෝයි. මේවා ප්‍රතිසන්ධියේ පටන් හටගැනේ. එයින් පෙනියන්නේ මවුකුස පිළිසිඳගත් මොහොතේ පටන් සත්වයකු සේ සැලකෙන බවයි. එබඳු කලල රූපයක් වූවද නැති කිරීම වරදකි. උපසම්පදූ භික්ෂුවක් වූවද ගැබ්හෙළීමක් සිදූ කළහොත් පාරාජිකා පත්තියට පත්වේ. එහෙත් එබදූ ක්‍රියාවකින් දරුවා නොමැරී මව පමණක් මළහොත් පාරාජිකා පත්තියට යටත් නොවේ.

ලංකා දණ්ඩනීති සංග්‍රහය අනුව (303) ගබ්සා කිරීම , මිනීමැරීම තරම්ම බරපතල වරදක් සේ සලකා නැති බව පෙනේ. එහෙත් ස්ත්‍රියකගේ කැමැත්ත නැතිව ගබ්සා කිරීම ද ගබ්සා කිරීමේ දී ස්ත්‍රිය ගේ මරණය සිදූ වීම ද (304, 305 වගන්ති) සාමාන්‍ය ගබ්සා කිරීමකට වඩා බරපතල ලෙස සැලකේ.

11. කෙලෙස් කම්ව (කෙලෙස් කම් වට)

පටිච්ච සමුප්පාදයට අනුව වෘත්තත්‍රයකි. එනම් i කම්වට, ii කිලෙස් වට iii විවා (විපාක) වට නම්.

(!) කිලෙස වට්ට — අවිද්‍යා, තෘෂ්ණා, උපාදන

(ii) කම්ම වට්ට .—සංඛාර (කම්ම) භව.

(iii) විපාක වට්ට.—උප්පත්තිභව, විඤ්ඤාණ, නාමරූප, සළායතන ඵස්ස වේදනා

12. ගණ.—"ගණ" යන්නේ සාමාන්‍ය අදහස සමූහය යනුයි. එහෙත් කී දෙනෙකුගෙන් සමන්විත සමූහයක් ද යනු විමසා බැලීම වටී. "එක් නමකට වැඩි පස්නමකට අඩු (භික්ෂු) පිරිස මෙයින් අදහස් කෙරෙන බව ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය දක්වයි. "පස්නමකට අඩු"යි ගත්විට හතර නමද ගැණේ, හතරනම සංඝ සංඛ්‍යාවට ගැණෙන හෙයින් මේ අදහස ව්‍යාකූලය. දෙනමක ගේ හෝ තුන්නමක ගේ සමූහය මෙයින් අදහස් කෙරෙණ බව පාළි ඉංග්‍රීසි ශබ්දකෝෂය දක්වයි. එම අදහස උචිත බව පිළිගත හැකිය. එක් නම, "පුද්ගල" වශයෙන්ද සිවුනම හෝ ඉන් ඉහළ සංඛ්‍යාව "සංඝ" වශයෙන් ද දක්වෙන හෙයිනි.

13. ගිනි සදල පොලූ ලා අඹරනු

ගිනි දැල් සහිත (ගිනිගත්) වරක් හෙවත් ලණුවක් බෙල්ලේ ඔතා තිරිංග කැවීම මෙයින් දක්වේ.

14. ගුරු බඩ.—ගරු භාණ්ඩ හෙවත්, වැඩි වටිනාකමක් ඇති දේපළය. එබඳු ගරුභාණ්ඩ වර්ග පහකට බෙද මෙහි දක්වේ.

(i) සඟසතු, ආරාම, ආරාම කිරීමට සුදුසු බිම්.

(ii) වෙහෙර, වෙහෙර කිරීමට සුදුසු බිම්.

(iii) ඇඳ, පුටු, මෙට්ට, කොට්ට.

(iv) ලෝහ භාජන, කෙටේරි, වෑ, පොරෝ, උදළු, නියන් ආදී ආයුධ

(v) වේ වැල් ආදී වැල් වර්ග, රණ උණ ගෙවල් සෙවිලි කරන තෘණ වර්ග මැටිමුවා හා දැව මුවා උපකරණ.

15. ඥප්තිකර්මය :

කිසියම් විනය කර්මයක් සිද්ධ කිරීමට මත්තෙන් සංඝයාට කරන දැනුම්දීම ඥප්ති කර්මයයි. ඉන්පසු දෙවරක් හෝ තුන්වරක් කර්ම වාක්‍යය කියනු ලැබේ. දැනුම් දීමෙන් පමණක් කරන කර්මය ඥප්තිකර්මයයි.

16. තිත්ථිය පක්ඛන්තක

පදයේ ඍජු අර්ථය නම් , තිර්ථකයන් වෙතට ගිය අය යන්නයි. එහෙත් මෙහි අපේක්ෂිත අර්ථය තීර්ථකයන්ගේ ලබ්ධිය ගෙන, ඔවුන්ගේ ව්‍රත සමාදන්වූවන් ය.

17. තුන්දූසිරි—තුන්සුසිරි

ත්‍රිවිධ දුශ්චරිත හා ත්‍රිවිධ සුචරිත මෙයින් ගැනේ. කයින් වචනයෙන් මනසින් සිදුකෙරෙන වැරදි ත්‍රිවිධ දුශ්චරිතය, ගිහියකු සම්බන්ධයෙන් නම් දශ අකුසල් ත්‍රිවිධ දුෂ්චරිතය. පැවිද්දකු සම්බන්ධයෙන් දශ අකුසල්වලට වැඩි සංඛ්‍යාවක් මීට අයත් වේ. ඒ සම්බන්ධ විස්තර හෙරණ සිඛ විනිසෙහි දැක්වේ.

ත්‍රිවිධ දුශ්චරිතයෙන් වැළකී සිටීම ත්‍රිවිධ සුචරිතයයි.

18. දරදිවෙයි.—මෙම පදය හෙරණ සිඛ විනිසෙහි කීප තැනකම යෙදී තිබේ. ''දරදී ගෙනැ නොදිය හෙනුයෙන්'' (7 පි.)
''මවපියන් විසින් ගත් දරදී ඇත්තෝද'' (7 පි.)
''දක්වා දුන් පිරිකර යොරසිතින් පහකළ දරදි බව දත යුත්තේය'' (29 පි)
''ඉසුරු පමුණුවා දුන දරදී වෙයි'' (30 පි.)

මේ පදයට විමලකීර්ති ස්ථවිරයන් දී ඇති අදහස් තුනක් ගැටපද යෙහි දැක්විණි. එහි දී ඇති ''පොලිය'' යන තේරුම මෙහි ඇතුළත් බවක් නොපෙනේ. ''භණ්ඩ දෙය්‍ය'' යන්නෙන් ගැනෙන්නේ ද ''ණය'' විනා අනිකක් නොවේ. අතීතයේ ණයට ගත්තේ බොහෝ විට භාණ්ඩ විනා මුදල් නොවේ. එබැවින් මෙයින් ගැනෙන්නේ ''ණය'' බව සිතිය හැකිය.

19. දියවටන්:—ශරීරකෘත්‍යය කිරීමෙන් අනතුරුව සේදීමට තිබුණු ස්ථානය මෙයින් අදහස් කරන ලදී. වලවම සේදීම අතීතයේ සිරිත නොවීය.

20. නිස.—''ආශ්‍රය'' (සං) ඇසුරු කිරීම යන තේරුමයි. ආචාර්‍යවරයකු ඇසුරුකරමින් විසීමට පැවරීම නිසදීමයි. මේ සම්බන්ධයෙන් රේරුකානේ චන්දවිමල මහා ස්ථවිරපාදයන් . වහන්සේ කරණ විස්තරය මෙසේය.

''වස් බොහෝ ගණනක් වී නිස මිදීමට තරම් උගත්කමක්, නැත්තා වූ භික්ෂුව, නිස ගැණීමට වැඩි මහල්ලකු සොයාගත හැකි නොවේ නම්, තමාට බාල වූ පරිසුපස්ථායක බහුශ්‍රැතයකු ගෙන් නිසගතයුතුය. තමාට බාලවුව ද, ගුරුවරයාට වැඳිය යුතුය. එහෙත් බාලයකුට ''භන්තෙ'' යන වචනය ව්‍යවහාර නොකළ යුතුය. වැඩිමහලු භික්ෂුවක් විසින් බාල භික්ෂුවකගෙන් නිස ගැනීමේදී නිඃශ්‍රයාචාර්යවරයා ඉදිරියේ සිවුරු ඒකාංශ කොට පෙරවා උක්කුටිකයෙන් හිඳ වැඳගෙන '''ආචරියො මෙ ආවුසො හොහි' ආයස්මතො නිස්සාය වච්ඡාමි.'' යි තෙවරක් කිය යුතුය.''
(විනයකර්ම පොත 44–45 පිටු.)

උපාධ්‍යායන් වහන්සේ ස්වභාවයෙන්ම නිඃශ්‍රයාචාර්‍ය්‍ය වෙති. · ඉහත සඳහන් පරිදි නිඃශ්‍රයාචාර්‍ය්‍ය වරයකු පත්කර ගත යුත්තේ උපාධ්‍යායන්වහන්සේ අපවත් වූවහොත් හෝ, අන්පෙදෙසක වෙසෙතොත්ය. අවශ්‍ය ප්‍රමාණයට ධර්ම විනය උගත් අයකුට නිඃශ්‍රය මුක්තක විය හැකිය. (බලන්න මහා වග්ග පාලි මහා ඛන්ධක— 1968.පි.)

21. පඬුවන්. (පණ්ඩක)

මේ සම්බන්ධයෙන් රේරුකානේ චන්දවිමල මහා ස්ථවිරපාදයන් වහන්සේ කරන විස්තරය.

"පණ්ඩක යනු ලිංගවිකලත්වය ඇති පුද්ගලයෝයි. ආසිත්ත පණ්ඩකය, උසූය පණ්ඩකය, ඔපක්කමික පණ්ඩකය, පක්ඛ පණ්ඩකය, නපුංශක පණ්ඩකය' යි පණ්ඩකයෝ පස් දෙනෙකි. අනුන්ගේ අංගජාතය මුවින් ගෙන අසූචිය උරා ගැනීමෙන් කාම පරිලාහය සන්සිඳවා ගන්නා තැනැත්තා ආසිත්ත පණ්ඩක නමි. අනුන්ගේ මෛථුන සේවනය බලා සිට එයින් කාම පරිලාහය සන් සිඳවා ගන්නා තැනැත්තා උසූය පණ්ඩක නමි. සුනඛ ගවාදීන්ට කරන්නාක් මෙන් බීජෝත්පාටනය කරණලද තැනැත්තා ඔපක්කමික පණ්ඩක නමි, අකුශල කර්ම බලයෙන් මාසයේ අවපක්ෂයෙහිදී පණ්ඩක බවට පැමිණෙන තැනැත්තා පක්ඛ පණ්ඩක නමි. උත්පත්ති යෙන්ම ස්ත්‍රී පුරුෂ ලිංගයන් නැති තැනැත්තා නපුංසක පණ්ඩක නමි. මේ පණ්ඩකයන් පස් දෙනා අතුරෙන් ආසිත්ත උසූය පණ්ඩකයන් දෙදෙනාට ප්‍රව්‍රජ්‍යාව අනිවාරිතය. ඉතිරි තිදෙනා පැවිද්දට නොනිස්සෝය...." (විනය කර්ම පොත 12-13 පි.)

22. පස්කඳ.—රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන ස්කන්ධ පඤ්චකයයි. ස්කන්ධ යනු රාශිය ගොඩ යන අර්ථයි.

23. පස්කම් රා.—රූප , ශබ්ද, ගන්ධ රස, ස්පර්ශය යන පඤ්ච කාම වස්තුවෙහි ඇලීමයි.

24. පඤ්චනීවරණ.—නීවරණ නම් ආවරණය හෙවත් මුවහ කිරීමයි. (i) කාමච්ඡන්ද, (ii) ව්‍යාපාද, (iii) ථීන මිද්ධ, (iv) උද්ධච්ච -කුක්කුච්ච, (v) විචිකිච්ඡා

(i) කාමඡන්ද දෙකින්ම කිය වෙනුයේ කැමැත්ත හෙවත් ආශාවයි. පහත් ලාමක දේට ඇති ආශාව මෙයින් ගැනේ. එනම් රූප ශබ්ද ආදියට ඇති ආශාවයි.

(ii) ව්‍යාපාද නම් ද්වේශයයි. අන්‍යයාගේ විපත අපේක්ෂා කිරීමයි.

(iii) ථීන මිද්ධ නම් චිත්ත චෛතසිකයන්ගේ අලස බවයි.

(iv) උද්ධච්ච නම් නොසන්සුන් බවයි. සිත එක අරමුණක පිහිටුවා ගැනීමේ අපහසු බවයි. කුක්කුච්ච නම්, නොකළ යහපත් දේ හා කළ අයහපත් දේ සිහිවීමෙන් ඇතිවන පසුතැවීමයි.

(v) විචිකිච්ඡා නම්, බුද්ධාදි අටතැන ඇතිවන සැකයයි.

ඇතැම් තැනෙක "අවිජ්ජා" ද මේ සංඛ්‍යාවට එකතුවීමෙන් නීවරණ හයක් වශයෙන් දැක්වේ.

"සත්ව සන්තානයෙහි නූපන් කුසලධර්ම උපදවා ගන්නට හෝ උපන් කුසල ධර්ම නවත්වා ගන්නට හෝ නොදී වළකා ලන්නෝ නීවරණයෝයි, ප්‍රඥා චක්ඛුස හෝ අවුරා ලන්නෝ නීවරණයෝය.'

(අභිධර්මචන්ද්‍රිකාව 7 8-9 පි.)

25. <u>පස්විසි අවහාර</u>.—අන්සතු අවිඤ්ඤාණක හෝ සවිඤ්ඤාණක හෝ, චංචල හෝ නිශ්චල දේපළක් හොරකම, චංචාව තර්ජනය බලහත්කාරය ආදී අයුතු ක්‍රියාවකින් තමා සතු කර ගැනීමේ ප්‍රභෙද විසිපහක් මෙයින් විස්තර වෙයි. එම ප්‍රභෙද විසි පහ ප්‍රධාන කොටස් පහකට බෙදී තිබේ.

(i) නා නා භණ්ඩ පඤ්චකය

(ii) එක භණ්ඩ පඤ්චකය

(iii) සාහත්ථික පඤ්චකය

(iv) පුබ්බපයොග පඤ්චකය

(v) ථෙය්‍යාවහාර පඤ්චකය

විස්තර සඳහා සිඛවළඳ විනිස හෝ පාතිමොක්ඛ දීපිකා බලන්න.

29. පෙරයම මැදියම අළුයම.—මෙහි "යම" නම් යාමයයි. "ජාම" යනුවෙන්ද මෙය වහරෙහි එයි. අතීතයේ දී රාත්‍රිය යාම තුනකට ද, දවාල යාම තුනකට ද බෙදිණි. ජ්‍යොතිෂයට අනුව යාම පහ බැගින් ද බෙදේ. එහි එක් යාමයකට ඔරලෝසු පැය 2. වි. 24 කි.

30. <u>බ්‍රම්සරුන්</u>.—බුදු පසේ බුදු ආර්ය ශ්‍රාවක, බ්‍රහ්ම යන අයගේ හැසිරීම බ්‍රම්සර හෙවත් බ්‍රහ්මචර්‍ය්‍යාව (ශ්‍රේෂ්ඨ හැසිරීම) නම් වේ. එනම් මෛථුන ධර්මයෙන් වෙන්වීමයි. එබඳු චර්‍ය්‍යාවක් ඇත්තන් බ්‍රම්සරුන් ලෙස හඳුන්වා ඇත.

31. <u>මස්ස</u>.—මෙය "මාසක හෝ "මාස" (මද) ශබ්දයෙන් බිඳුනා විය හැකිය. මදටිය ඇටයක හැඩයට තැනූ හෙයින් මෙනමින් බැවහර වන්නට ඇතැයි සිතීමට ඉඩතිබේ.

මස්ස යනු කුඩා කාසියකි. රනින්, තඹයෙන්, දුවයෙන් හා ලාකඩින් ද මෙය තනා තිබුණු බවට සඳහන් පවතී. මෙය කහවනු-වෙන් හතෙරන් පංගුවක් හෙවත් මදටිය පහක් බර තිබිණි. පාද (පල්) නමින් හැඳින්වෙන්නේද එහෙයිනි. කලින් කල මෙහි බර හා වටිනාකම වෙනස් වූ බව සිතිය හැකිය.

32. <u>සංඝාරාමය-පිරිවෙණ හා සෙනසුන</u>

හෙරණසිඛ විනිසට අනුව සෙනස්නක් යනු භික්ෂූන්වහන්සේ නමක් හෝ කීප නමක් විසූ කුටියකි. සෙනසුන් කීපයකින් සංඝා-රාමයක් සමන්විත විය. පිරිවෙණ ද සෙනසුනකට සමාන ගොඩ නැගිල්ලකි. පිරිවහනා තැන පිරිවෙණ නම් විය. එනම් පාඩම් කළ දේ ගුරුවරයා ඉදිරියේ කියන තැනය. සංඝාරාමයක එබඳු පිරිවෙන් රැසක් විය.

''සඟරමින් නෙරනා වත් පස පිකුම්කළහු නෙරනා කලැ වත් පද දූන් වත් තෙරුන් තමන් නිසා වාසය කරනුවා තමන් වසන පිරිවෙනට හෝ තමන්ට වසගින් පැමිණි සෙනස්නට හෝ නොවැද්ද දිය යුත්තේය. සියල් සඟරමින් නෙරිය යුතු නොවේ.'' (28) යන්නෙන් මෙකී ආයතනවල වෙනස තේරුම් ගත හැකිය.

33. <u>සම්පජඤ්ඤ</u>—කිසියම් කරුණක් සම්බන්ධ විශේෂඥනය සම්පජඤ්ඤ නම්. එනම් සම්මාපජානණයයි. එහි අවස්ථා හතරක් මෙම ග්‍රන්ථයේ දක්වේ.

(i) සාත්ථක සම්පජඤ්ඤ
(ii) සප්පාය සම්පජඤ්ඤ
(iii) ගොචර සම්පජඤ්ඤ
(iv) අසම්මොහ සම්පජඤ්ඤ යනුවෙනි.

(i) සතර පසයෙහි පවත්නා විධි යන මාතෘකාව පටන් ගිලනුන් කෙරෙහි පිරිය යුතු වත් අවසන් කොට දක්වන ලද මාතෘකා දහතුන ගමනේ විස්තර කළ කරුණු පිළිබඳ මනා අවබෝධය මෙහි සාත්ථක සම්පජඤ්ඤයි.

(ii) සැප වූ සිවුපසය කවරේදැයි යන්න පිළිබඳ මනා අවබෝධය සප්පාය සම්පජඤ්ඤයයි.

(iii) එළඹෙන, ක්‍රියා කරණ හැම ඉරියව්වකම, හැම ක්‍රියාකාර කමක දීම මනා සිහියෙන් ක්‍රියා කිරීම ගොචර සම්පජඤ්ඤයයි.

(iv) පඤ්චස්කන්ධයෙහි හෝ, සිවුපසයෙහි හෝ අරමුණුවල මුළා නොවීම අසම්මොහ සම්පජඤ්ඤයයි.

34. <u>සිප්පුකැළලගැට</u>.—මෙයින් දක්වන ලද්දේ ණය ගෙන පෙරලා නොගෙවීමආදි වැරදිවලට කෝටුමස් කිරීම කසපහර දීම වැනි දඬුවම්වලින් ශරීරියේ ඇති කැලැල් විය හැකිය.

"නභික්ඛවෙ, කසාහතො කත දණ්ඩකම්මො පබ්බාජෙතබ්බො" යි ඒ බව විනයෙහි දැක්වේ.

35. <u>පරිභොග</u> : වැළඳීමෙන් ප්‍රයෝජනයට ගැණීමයි.

(i) ථෙය්‍යපරිභෝග (ii) ඉණ පරිභොග (iii) දයාද පරිභොග

(ii) පැවිදි බව නැති අයකු පැවිදි ස්වරූපයෙන්; පැවිදිවෙසින් සිට දයකයන් දෙන දේ වැළඳීම ථෙය්‍ය පරිභෝග නාම්.

(iii) ප්‍රත්‍යවෙක්ෂා නොකොට වැළඳීම ඉණ පරිභෝග නම්, එනම් ණයට කෑමයි.

(iv) දයාද පරිභෝග නම්, සීල්වත්ව, ප්‍රත්‍ය වෙක්ෂා කොට වැළඳීමයි.

36. <u>ථෙනාක</u>.—ථෙනක නම් සොරාය. හෙරණ සිඛයෙහි ථෙනක" භාවය දෙවැදැරුම්කොට දක්වන ලදී.

(i) ලිංගත්ථේනක ; (ii) සංවාසත්ථෙනක යනුවෙනි

(i) මහණකම නැතිව මහණ කෙනෙකු හෙවත් ශ්‍රමණයකුසේ පෙනීසිටීම ලිංගත්ථෙනක නම්

(ii) ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යානය කොට හෙවත් පැවිද්ද ප්‍රතික්ෂෙපකොට, පැවිද්ද පවා නැතිව, උපසපන් භික්ෂුවක්සේ අභවමින් පපාතෝ පමුරුණු ආදියට සහභාගි වෙමින්, වස් ගණන් කීම ආදිය කරන්නෝ සංවාසත්ථෙනකය.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු